ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 අගෝස්තු 09 වන බදාදා
3 කාණ්ඩය 36 කලාපය
මිල රු. 80 යි

විශේෂ අතිරේකයක්
**නොමිලේ**




## මගේ ජීවිතේ අනතුරේ දාලා එයාට දරුවො හදන්න ඕන නෑ කියලා සජිත් කිව්වා

ජලනි ප්‍රේමදාස




## ATM කාඩ්පත් අක්‍රිය කරන්න පුළුවන් අමුතු ගුරුකමක්

සශ්මි දිසානායක

ජාත්‍යන්තර විවාහක
මිහිකත රැජින 2023

ඡායාරූපය-රන්දික ලක්ෂාන්

## ස්වයං රැකියා



**සීතා පොන්නම්පෙරුම**
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

පාඩම් අංක 81

# පැණි වරකා ගස් යට තැබුවොත් මී හරකා



අන්දරේ කියන්නේ රාජසභාවේ කවටයනේ. ඕන් එක වතාවක් රාජසභාවේ වැඩ අහවර කරලා යන ගමන් අන්දරේට වරකා සුවඳක් ආවලු. ගහක වරකා ගෙඩියක් ඉදුණාහම ඉතින් පළාතටම පුසුඹයිනේ.

පැණි වරකාවලට අන්දරේ බොහොම කෑදරයි. ඉතින් මේ හාදයා පුසුඹ එන ඉසව්ව ඉව කර කරා වරකේ තියෙන තැනටම ගියා. ගිහින් බැලින්නම් වරකා ගහක පැණි වරකා ගෙඩියක් සුදු රෙද්දකින් ඔතලා තියෙනවලු. ගහක තියෙන ගෙඩියක් සුදු රෙද්දෙන් වහනවා කියන එකේ තේරුම ඒක රජතුමාට වෙන් කරලා තියෙනවා කියන එකයි. ඒ කියන්නේ මේ ගෙඩියකට අත තිබ්බොත් රාජ උදහසට ලක්වෙනවා සිකුරුයි. ඒත් එහෙමයි කියලා අන්දරේ අදහස අතඇරියේ නෑ. උන්දෑ පණ දෙවැනියට තියලා හොරාට වරකා ගෙඩියෙන් බෑවක් කපාගෙන කෑවලු.

වැඩි වෙලාවක් යන්න කලින් අන්දරේ කරාපු මේ වැඩේ රාජපුරුෂයන්ට ආරංචි වුණා. අන්දරේව රජතුමා ගාවට කුදලගෙන යන එකයි ඒ අය කළේ. අන්දරේ කරාපු මේ වැඩේට රජතුමාත් හරියට විස්සෝප වුණා.

"මේ රාජ ද්‍රෝහියාගේ හිස ගසා දමනු."

ආය දෙපාරක් නොහිතා රජතුමා අණ කළා. රජතුමාගේ තීරණය ඇහැව්ව අන්දරේ ඕන් එකපාර මහා හයියෙන් හිනාවුණාලු. ඒ පාර ආයෙත් මහා හයියෙන් අඬන්න ගත්තලු.

"මොකද අන්දරේ තොට දැන්මම මරු විකල් වෙලාද? මහහයියෙන් එකපාර හිනාවුණේ අහවල් දේකටද?"

"පස්වාන් දහසකට බුදුවෙන්ට දේවයන්වහන්ස. ඔබතුමාගේ අණින් මැරෙන්න ලැබුණු එකේ සතුටටයි මම හිනාවුණේ."

"එතකොට තෝ ඇඬුවේ?"

"අසවල් රජතුමා වරකා බෑවකටත් මිනීමැරුවා කියලා ඉතිහාසේ ලියැවිලා ඔබතුමාට නින්ද වෙනවා මට ඉවසගන්න බෑ දේවයන්වහන්ස. මට ඇඬුණේ ඒ දුකට."

අන්දරේගේ කතාව ඇහැව්ව රජතුමාට බකස් ගාලා හිනාගියාලු. "අන්දරේ ඔබ නම් බොහොම කපටියෙක්. ඒ වරකේ ඉතිරි බෑවත් තෝම කාපිය" කියලා රජතුමා අන්දරේව නිදහස් කළාලු.

පැණි වරකා කියන්නේ ජීවිතේ අනතුරේ දාගෙන හරි කන්න හිතෙන මිහිරි මී පැණි රස පලතුරක් තමයි. එහෙම බලාපුවාම අන්දරේ වැරදියි කියන්න පුළුවන් කාටද?

වරකා කියන්නේ කොස් ගහේ පුරුෂ ගසලු. ඉස්සර මිනිස්සු අතරෙ නම් පැණි වරකා බොහොම ප්‍රසිද්ධයි. ඒ කාලේ එක ගහක පැණි වරකා ගෙඩියක් ඉදුණාහම මුළු ගම්තුලාවටම බෙදලාලු කන්නේ. කොස් ගහේ නිජබිම ඉන්දියාව. කොස් ගහට වගේම වරකාවලටත් අවුරුදු 6000කට එහා ඉතිහාසයක් තියෙනවා. බංගලාදේශේ ජාතික පලතුරත් වරකා. බංග්ලාදේශය, ඉන්දියාව, පිලිපීනය වගේ රටවල වරකාවලින් මහා පරිමාණ ව්‍යාපාර කරනවා. ඒත් ඉතින් ඒවටත් එක්ක හරියන්න අපේ රටේ කෝටි ගණන් වරකා ගෙඩි ගස් පල්ලේ කුණු වෙනවා.

අපේ රටේ හුඟක් උන්දලා මේ ගස් යට කුණුවෙන වරකේ ගුණේ දන්නේ නැහැ. පැණි වරකාවල පයිටොනුට්‍රියෙන්ට්ස් (Phytonutrients), ඉසොෆ්ලෙවනෝස් (Isoflavonos), ලින්ගන්ස් (lingans) කියලා පිළිකා මර්ධක ත්‍රිත්වයක්ම තියෙනවා. පිළිකා සෛලවලින් ගැලවෙන්න පුළුවන් නිසා වැඩිපුර වරකා ආහාරයට ගන්න කියලයි වෛද්‍යවරු වුණත් කියන්නේ. ඔයිට අමතරව විටමින් A, B6, C වගේ පෝෂකත් මෙව්වයේ තියෙනවා. වරකා කියන්නේ ඊස්ට්‍රජන් අඩංගු ආහාරයක්. ඒ කියන්නේ මේක ලස්සනට ඉන්න කැමති බවලත්තු කන්නම ඕන පලතුරක්. තන්තු බහුල නිසා ආහාර ජීර්ණයට වගේම ප්‍රතිශක්තිකරණ පද්ධතියටත් හිතවත්. ව්‍යාපාරයක් විදියට පටන්ගන්නවා නම් මේ කරුණු ගැන සමාජය දැනුවත් කරන්නත් අමතක කරන්න නරකයි.

වරකාවලින් හදන්න පුළුවන් ජාති ඕසෙට. වරකා පිටි, වියළි වරකා, වරකා ස්මූති, වරකා ජෑම්, වරකා කේක් වගේ බේකරි නිෂ්පාදන. අද අපි කියලා දෙන්නේ වරකා ජෑම් හදන හැටි.

රටක් සංවර්ධන කරන්න පුළුවන් හොඳම විදිය තමයි ලෝක වෙළඳපොළ එක්කලා සම්බන්ධ වෙන එක. මේ වගේ අගය එකතු කළ නිෂ්පාදනවලට පිටරටවලින් වුණත් හොඳ ඉල්ලුමක් තියෙනවා.

අපි කියලා දෙන වරකා ජෑම් එකට රසකාරක, වර්ණකාරක, කල්තබාගැනීමේ ද්‍රව්‍ය මේ කිසිම දෙයක් දන්නේ නැහැ. මේ වගේ කාබනික ආහාරවලට ඉල්ලුමක් හදාගන්න බොහොම පහසුයි.









වැඩේට වරකා කිලෝ දහයක් විතර අරගන්න. වරකා කිලෝ දහයට සීනි 9kgක් අවශ්‍ය වෙනවා. ඒ වගේම දෙහි ගෙඩි 20ක විතර පොතු ටික ගාගෙන තියාගන්න. ඒ දෙහිවල යුෂ ටිකත් අවශ්‍ය වෙනවා. ඊට අමතරව අවශ්‍ය වෙන්නේ ලුණු තේ හැන්දක් වගේ ප්‍රමාණයක් විතරයි.

පියවර 1

මුලින්ම හොඳට ඉදුණු වරකා ගෙඩියක් හොයාගෙන ඒකේ වරකා මදුලු ටික වෙන්කරගෙන සෝදලා පිරිසිදු කරගන්න.

පියවර 2

වරකා ටික බ්ලෙන්ඩ් කරගන්න. බ්ලෙන්ඩ් කරනකොට පල්ප නොකර කෑලි හිටින විදියට බ්ලෙන්ඩ් කරන්න. එතකොට ජෑම් එකේ රස වැඩියි. භාජනයක් අරගෙන බ්ලෙන්ඩ් කරපු වරකා ටික දාලා ලිපේ තියන්න. වරකා ටික රත්වීගෙන එනකොට හොඳින් හැඳි ගාගන්න. ටික වෙලාවකට පස්සේ ග්‍රේට් කරගත්තු දෙහි ලෙලි ටික එකතු කරන්න. දෙහි ලෙලිවල සිට්‍රික් ඇසිඩ් තියෙන නිසා අමුතුවෙන් සිට්‍රික් ඇසිඩ් එකතු කරන්න අවශ්‍ය නැහැ. පස්සේ දෙහි යුෂ, ලුණු එහෙමත් දාගෙන කලවම් කරන්න. සීනි කිලෝ 9 ටිකෙන් ටික එකතු කර කරා හැඳිගාන්න. ගින්දර අඩු කරලා පැය දෙකක් විතර මිශ්‍රණය හැඳිගාන්න ඕනේ. පස්සේ ජීවානුහරණය කරපු බෝතල්වලට වරකා ජෑම් දාගන්න. මෙහෙම හදාගනිපු ජෑම් බෝතලයක් මාස 6ක් විතර තියාගන්න පුළුවන්. ඒ වගේම රුපියල් 300ක වගේ මුදලකට අලෙවි කරන්න පුළුවන්. තවත් තොරතුරු දැනගන්න 0714766819 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි





# දරුවා ලැබෙන්න ඔන්න මෙන්න තියෙද්දී බස් එක මාව යට කරගෙන ගියා

ශ්‍රී ට අවුරුදු දහයකට විතර උඩදී ඉන්දියාවේ බඩදරු අම්මා කෙනෙක්ව මෝටර් රථයකින් යටකරගෙන ගියපු සිද්ධියක් මාධ්‍ය මඟින් වාර්තා වුණා. ඒ අම්මාගෙ නම තමයි ඇඩී. ඇඩීගේ බඩට ඒ වෙනකොට මාස අටකුත් පිරිලයි තිබුණේ. අනතුරට ලක්වෙද්දී ඇය හිටියේ දරුවා ලැබෙන්න ඔන්න මෙන්න.

ඉතින් මේ අනතුරෙන් පස්සේ ඇඩීට සිහිය නැතිවුණා. නැවතත් ඇයට සිහි ආවේ රෝහලේදී. ඒ වෙනකොට ඇය සැත්කම් කීපයකටම භාජනය වෙලා තිබුණා. හැබැයි ඒ වෙද්දිත් ඇගේ ඉණෙන් පහළ කොටසට දරුණු විදියට හානිවෙලයි තිබුණේ. කොහොම නමුත් පියවි සිහියට ආපු ගමන්ම ඇයට ළඟ හිටපු වෛද්‍යවරයාගෙන් අහන්න ප්‍රශ්නයක් තිබුණා. ඒ ආපහු තමන්ට ඇවිදින්න පුළුවන්ද බැරිද කියන එක ගැන නම් නෙවෙයි. ඇය වෛද්‍යවරයාගෙන් ඇහුවේ බඩේ ඉන්න දරුවට කරදරයක් නෑ නේද කියලා... අම්මලා එහෙමයි. තමන්ගේ දිවි දෙවැනි කරලයි දරුවො ගැන හිතන්නේ.

සීදූවේ ශ්‍රියානි රත්නායකගේ කතාවත් හරියටම ඒ වගෙයි... බඩට මාස හතක් වෙද්දී ශ්‍රියානි තමන්ගේ ආදරණීය ස්වාමිපුරුෂයාගේ යතුරුපැදියට නැගලා ගෙදරින් පිටත් වුණේ කොළඹ සොයිසා රෝහලට යන්න හිතාගෙන. ඒ හරියටම මැයි මාසෙ 10 වැනිදා. ස්කෑන් පරීක්ෂණයක් කරලා දරු පැටියාගේ තත්ත්වේ බලාගන්නයි මේ දෙන්නට ඕනවෙලා තිබුණේ. ඒත් වත්තල හරියෙදි ආපු බස් එකක් ඒ ගමනට බාධා කරලා සුපුරුදු මගේ ගමන් කරනවා වෙනුවට ශ්‍රියානිගේ කකුල් දෙක උඩින් ගිහින් තිබුණා.

"බස් එක බයික් එකේ වැදුනට පස්සේ නෝනා විසිවෙලා ගිහින් බස් එක පැත්තටම වැටුනා. ඒ වැටෙද්දිම එයාගේ කකුල් හරිය බස් එකේ පිටිපස්සේ රෝදෙකට අහුවුණා."

එහෙම කිව්වේ ශ්‍රියානිගේ සැමියා ඉන්දික වඩුගේ. ඊටපස්සේ ඉතින් අහස උසට පොදි බැඳගෙන උන්නු බලාපොරොත්තු ඔක්කොම එකින් එක ඔවුන්ට අහිමි වෙලා. ඒ අවිනීත බස් රියැදුරෙකුගේ නොහික්මුණු රිය ධාවනය හින්දා.

"අපි විවාහවෙලා අවුරුදු තුනයි. මං දරුවෙක්ට පුදුම ආසාවකින් හිටියේ. ඒත් මේ අනතුරින් පස්සේ හැමදේම වෙනස් වුණා. දැන් මං ගොඩාක් දුර්වලයි. ඒ හින්දා කලින් කිව්වා වගේ දරුවට කිරි ටිකක් දෙන්නවත් බෑ. අඩුතරමේ මගේ වැඩ ටිකවත් මට තනියම කරගන්න බෑ. මගේ වැඩයි දරුවගේ වැඩයි දෙකම කරන්නේ මගේ මහත්තයා."

ශ්‍රියානි කියන විදියට අනතුරින් පස්සේ ඇයගේ කකුල්වලට සෑහෙන්න ලොකු හානියක් සිද්ධවෙලා. ඒ විතරක් නෙවෙයි කොන්දට, උකුල් ඇටේට පවා හානිවෙලා. හැබැයි මොකක්දෝ වාසනාවකට බඩේ හිටපු දරු පැටියට නම් කිසිම කරදරයක් වෙලා නෑ. ශ්‍රියානි මේ වෙද්දී ගෙවන ජීවිතෙත් එක්ක ඇයට සතුටුවෙන්න තියෙන එකම හේතුවත් එච්චරයිලු.

"අනතුරින් පස්සේ සැත්කම් හතක් විතර කළා. තවත් කරන්න තියෙනවා. ඒත් මගේ තත්ත්වය දුර්වල නිසා ඒ සැත්කම් කල්දාන්න වෙලා. ඇත්තටම මට වඩා මං බයෙන් හිටියේ බඩේ හිටපු දරුවා ගැන. ඒත් දෙවියන්ට පින්සිද්ධ වෙන්න දරුවට නම් කිසිම බලපෑමක් වුණේ නෑ."

සාමාන්‍ය විදියට දරුවෙක් බිහිකරන්න තියෙන හැකියාව නැතිවුණාට පස්සේ සිසේරියන් සැත්කමකින් තමයි ඇගේ පුංචි පුතු පැටියා මේ ලෝකෙට බිහිවෙලා තියෙන්නේ. එයින් මාස දෙකකට පස්සේ ගෙදර එන්න ලැබුණත් තවමත් ඇය ඉන්නේ දැඩි අසාධ්‍ය තත්ත්වයෙන්. ශ්‍රියානිට ආපහු පය බිම තියලා අවිදින්න පුළුවන් දවසක් ගැන හරියටම කියන්න වෛද්‍යවරුන්ටත් නිශ්චයක් නෑ.





ශ්‍රියානි දරුවා සමඟ







## බස් එකේ රියැදුරු මහත්තයා මාව බලන්න ඉස්පිරිතාලෙටවත් ආවේ නෑ

"මාව අනතුරට ලක්කරපු බස් එකේ රියැදුරු මහත්තයා ඉස්පිරිතාලෙටවත් බලන්න ආවේ නෑ. අපට කිසිම සාධරණයක් කළෙත් නෑ. මේ වෙනකොට අපි විඳින දුක දන්නේ අපි විතරයි. මහත්තයා නොහිටින්න අපි ඉවරයි."

ශ්‍රියානි අනතුරට මුහුණපාන්න කලින් සැමියා ඉන්දික පෞද්ගලික ආයතනයක භාණ්ඩ බෙදහැරීමේ නිලධාරියෙක් විදියටයි රැකියාව කරලා තියෙන්නේ. ඒත් දරුවගෙයි ශ්‍රියානිගෙයි වැඩ ඔහුගේ කරමතට පැටවුණු නිසා මේ වෙද්දි ඔහුට රැකියාවට යන්න හැකියාවක් නෑ.

"අපි ඉන්නේ ගොඩාක් අසරණවෙලා. අනතුරෙන් පස්සේ දරු පැටියට මව්කිරි දෙන්න හැකියවක් නැති නිසා අපි දෙන්නේ කිරිපිටි. මං මේ කරදරේ වෙන්න කලින් හිටියේ කටුනායක ගාමන්ට් එකක. මේ වෙනකල් අපි ජීවත්වුණේ ගාමන්ට් එකෙන් ගෙවන ප්‍රසූත දීමනාවෙන්. වෙන කිසිම පිහිටක් නෑ. අනේ කාටහරි පුළුවන් නම් මේ දරු පැටියා ටිකක් උස්මහත් කරගන්නකන්වත් අපිට උදව් කරන්න"

ශ්‍රියානි එහෙම කිව්වේ ගලාගෙන ආපු කඳුළුවලට ඇස්වලින් පිටවෙලා යන්න ඉඩදෙන ගමන්. පිරිමි හිත් ගල් කිව්වට මොකද ඉන්දිකගෙත් ඇස්වල තිබුණු කඳුළු අපි දැක්කා. ඉතින් මොහොතකට හරි ඒ කඳුළු පිහදාන්න කවුරුම හරි කැමති නම් 0759003415 තමයි ශ්‍රියානිලාගේ නොම්බරේ.

■ රුවන් එස්.සෙනවිරත්න



ඉන්දිකා ප්‍රනාන්දු
මනෝඋපදේශිකා
සමාජ විද්‍යා ග්‍රන්ථ කතුවරි



# කන පලන්න හිතෙන අයගේ ඔළුව අතගාන්න හිත හදාගන්නේ කොහොමද?

අද අපි කතා කරන්නේ සංරක්ෂණ ප්‍රයෝග ගැන. දැක්ක හැටියේ බරපතළ වචනයක් කියලා හිතුණා නේද? වචනේ වගේම සංරක්ෂණ ප්‍රයෝග නිසා බරපතළ ප්‍රශ්න ඇතිවෙන වෙලාවලුත් තියෙනවා. ඉතින් මේක කතා කරන්නම ඕනේ මාතෘකාවක් කියලා හිතුවේ ඒකයි.

මේ මෑතකදි මම ෆේස්බුක් එකේ වටිනපහේ පෝස්ට් එකක් දැක්කා. ඔෆිස් එකක බොස් කෙනෙක් ඔහු යටතේ වැඩ කරන මනුස්සයෙක්ට කෝපයෙක් කෑගහන හැටි තමයි පළවැනි කොටසේ තිබුණේ. පස්සෙ අර බැනුම් අහන මනුස්සයා ගෙදර ගිහිල්ලා එයාගේ බිරිඳට කෑගහනවා. බිරිඳ ගිහිල්ලා එයාගේ පුංචි දරුවට තරවටු කරනවා. කතාව එතැනින් ඉවර වෙන්නේ නැහැ. පුංචි දරුවා ගෙදර ඉන්න බළල් පැටියට බැනලා ඔහුගේ කෝපය පිට කරනවා. මෙන්න මේකට තමයි සංරක්ෂණ ප්‍රයෝග කියලා කියන්නේ.

හිතන්නකෝ බාහිරින් එන ලෙඩරෝගවලින් අපිව ආරක්ෂා කරන්න අපේ ශරීරය කොච්චර මහන්සි වෙනවද? මිනිස් මනසත් අන්න ඒ වගේමයි. මනස අනවශ්‍ය විදියට පීඩනේට ලක්වුණොත් මනුස්සයෙක්ට පිස්සු හැදෙන්න ඒ කියන්නේ මානසික ව්‍යාධියක් ඇතිවෙන්න පුළුවන්. ඉතින් මනසට දැනෙන පීඩන ඒ කියන්නේ කඩාවැටීම්, තර්ජන, බලාපොරොත්තු බිඳවැටීම් වගේ දේවලින් ඇතිවෙන මානසික පීඩන වෙනත් විදියකට හරි පිට කරලා අර මනුස්සයට මානසික ගැටලුවක් ඇති නොවෙන්න වගබලාගන්න එකයි මොළේ වගකීම. ඒකට එයා නොයෙක් ජාතියේ  ප්‍රයෝග දනවා. සංරක්ෂණ ප්‍රයෝග කියන්නේ අන්න ඒ ප්‍රයෝගවලට. මනුස්සයෙක් මේ දේවල් කරන්නේ හිතාමතා නෙමෙයි. මානසික පීඩනේ පිට කරන්න මොළේ අවිඥාණිකව තමයි මේ ප්‍රයෝග දන්නේ. අපි මේ ප්‍රයෝග එකින් එක කතා කරමු.

ප්‍රක්ෂේපණය (Projection)

උදාහරණ කතාවකින්ම ප්‍රක්ෂේපණය දිහාවට හැරෙන්නම්කෝ. එක කාන්තාවක් ඉන්නවා. ඇය බොහොම දරිද්‍ර පවුලක කාන්තාවක්. පුංචි කාලෙදිත් ඇයට සෑහෙන ගැටලු තිබුණා. ඇගේ විවාහ ජීවිතෙත් ඊට නොදෙවැනියි. මේ කාන්තාවගේ සැමියා බීමත් පුද්ගලයෙක්. පස්සේ ඇයට හිටි එකම පුතාත් තදින් බීමට ඇබ්බැහි වුණා. ඇගේ දියණියත් අඩු වයසෙන්ම වැඩිමහලු පුද්ගලයෙක් එක්ක හොරෙන් විවාහ වුණා. ඉතින් හිතාගන්න පුළුවන් නේද මේ කාන්තාවට තිබුණු පීඩනය? කොහොමද ඇය මේ පීඩනේ පිටකළේ? අනුන්ගේ කේලම්, ඕපදූප, ඇදකුද හොයා හොයා ගම වටේ ඇවිද්දා. කෙනෙක් ලස්සනට ඉන්නවා නම්, දියුණු වෙනවා නම් පුළුවන් තරම් අඩුපාඩු කිව්වා. තමන් අනුන්ට ඊර්ෂ්‍යා කරන ගමන් බලන්නකෝ අරයා මට ඊරිසියයි, අරයා මට මෙහෙම කිව්වා, කළා කියලා තමන්ගේ වැරදි අනුන්ට ආරෝපණය කරලා කියනවා. තමන්ට ඇතිවෙන පීඩන පිට කරන්න මනස දන මේ සංරක්ෂණ ප්‍රයෝගයට තමයි අපි ප්‍රක්ෂේපණය කියන්නේ. ප්‍රක්ෂේපණය වගේ ප්‍රයෝග වැඩිපුරම පෙන්වන්නේ කාන්තාවන්. ගොඩක් ගම්වල මේ වගේ කාන්තාවන් සුලබයි. 'ගම අවුලඤ්ඤං... හබ පටලඤ්ඤං... ගිනිගෙඩි දෙඤ්ඤං...' කියලා සිංදුවකුත් තියෙනවනේ මේ වගේ උදවිය ගැන. ප්‍රක්ෂේපණය ඒ කෙනාගේ මනසට හොඳ වුණාට ඒකෙන් ඇත්තටම නැති ප්‍රශ්න ඇතිවනවා. පවුල්වල විතරක් නෙමෙයි ගම්පළාත්වලත් ප්‍රශ්න ඇතිවෙලා මිනීමැරුම් දක්වා වුණත් දුරදිග යන්න පුළුවන්. ඉතින් හොඳම දේ මෙහෙම ලක්ෂණ තියෙන කෙනෙක් ඉන්නවා නම් ඒ කෙනාගේ මේ හැසිරීම ඔහුව/ඇයව පීඩනෙන් මුදවාගන්න මනස දන ප්‍රයෝගයක් කියලා මුලින්ම තේරුම්ගන්න. එහෙම තේරුම් අරන් ඒ අයට අනුකම්පා කරන්න. එහෙම කෙනෙක්ව මනෝ උපදේශනයට යොමු කරන්න පුළුවන් නම් ඒක තමයි වඩාත්ම හොඳ.

ඊළඟට අපි කතා කරන්නේ විස්ථාපනය (Displacement) ගැන. මේ සංරක්ෂණ ප්‍රයෝගයේදී වෙන්නේ පීඩනය ඇතිකරන ඇත්ත හේතුව පුද්ගලයට මහඇරලා තමන්ට පහළ තැනකින් ඒ පීඩනය පිට කරන එක. මම අර මුලදිම කිව්ව පින්තූර කතාවේ තිබුණේ විස්ථාපන තත්ත්වයක්. බිරිඳට පහර දීලා තමන්ගේ පීඩන පිට කරන සැමියෝ ඉන්නවා. දරුවන්ට පහර දීලා තමන්ගේ පීඩන පිටකරන අම්මලා ඉන්නවා. බලන්නකෝ දැන් බස් එකක ගියත්, පාරේ ගියත් මිනිස්සු ගහන්න මරාගන්න ඇඟටම එනවා නේද? පහුගිය කාලේ තෙල් පෝලිම්වල මිනිස්සු කීදෙනෙක් ගුටි කාලා මැරුණද? මානසික ආතතියට ලක්වෙන කෙනා ඒ පීඩනේ පිට නොකළොත් ඔහුට මානසික ව්‍යාධියක් ඇතිවෙන්න පුළුවන්. ඒ ව්‍යාධිය වළක්වන්න තමයි මනස මේ ප්‍රයෝගය දන්නේ.

මේක බොහොම බරපතළ තත්ත්වයක්. හිතන්නකෝ පාරේ අයින් වෙලා යද්දි වාහනයක් ඇවිල්ලා තඩි මඩවතුර පාරක් ඉහගෙන යනවා. එවෙලෙට ඕනම කෙනෙක්ට තරහා යන එක සාමාන්‍යයයි. 'මට අරෑට කන පැලෙන්න එකක් දෙන්න හිතුණා' කියලා කතාවටත් කියන්නේ. ඉතින් මේ විස්ථාපනය කියන ප්‍රයෝගය ඕනම වෙලාවක ඕනම කෙනෙක්ට දැනෙන්න පුළුවන්. හැබැයි ප්‍රශ්නේ තියෙන්නේ ඒවා කළමනාකරණය කරගන්න තරම් හැම මනුස්සයාම සබුද්ධික නැහැ. සමහරු ඉන්නවා තරහා පිට කරන්න දොරවල් හයියෙන් වහනවා, දොර ජනෙල්වලට ගහනවා, බඩුමුට්ටු පොළොවේ ගහනවා. තමන්ගේ පීඩනේ පිට කරන්න මිනිස්සුන්ට සත්තුන්ට ගහනවට වඩා බඩුවක් පොළොවේ ගහන එක හොඳයි කියන එකයි මගේනම් පෞද්ගලික අදහස. කොහොම වෙතත් පවුලක මෙහෙම කෙනෙක් ඉන්නවා නම් අනිවාර්යයෙන්ම උපදේශනයට යොමු කරන්නම ඕනේ. නැත්නම් බරපතළ පවුල් ප්‍රශ්න, සමාජ ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන්.

අවරෝධනය (Repression) කියන්නෙත් තවත් එක සංරක්ෂණ ප්‍රයෝගයක්. මේකෙදි කරන්නේ යම්කිසි සිදුවීමක සංකීර්ණකම, බර අපේ උඩුහිතට දැනෙන්න දෙන්නේ නැතිව ඉක්මනින් යටිහිතට තල්ලු කරලා දන එක. උදාහරණයක් විදියට පොඩි ළමයෙක් අපයෝජනයට ලක්වුණා කියලා හිතන්නකෝ. මේක බොහොම සංකීර්ණ කාරණාවක්. මේකේ බරපතළකම උඩුහිත තේරුම් ගත්තොත් එයා ඒක කල්පනා කර කර ඉඳලා මානසික ව්‍යාධියකට යන්න පුළුවන්. අවරෝධනයේදී වෙන්නේ සිද්ධියේ බර හිතට දැනෙන්න නොදී යටහිතට තල්ලු කරලා දන එක. එතකොට ඒ ළමයට තාවකාලිකව ඒක අමතක වෙනවා. හැබැයි ඒ සිදුවීම යටිහිතේ රැඳෙනබව අමතක කරන්න එපා. මේ වගේ තමයි ප්‍රේම සම්බන්ධයට එකපාර ඇතිවෙන පීඩන සමහර වෙලාවට අවරෝධනයෙන් යටපත් කරලා දනවා.

ප්‍රතික්ෂේප කිරීම (Denial) කියලත් සංරක්ෂණ ප්‍රයෝගයක් තියෙනවා. දරාගන්න බැරි ලොකු දුකක්, පීඩනයක් ඇත්තක් නෙමෙයි කියලා විශ්වාස නොකර ඉන්න එකයි මෙතැනදී වෙන්නේ. මේ ලෝකේ මනුස්සයෙක්ට දැනෙන්න පුළුවන් ලොකුම දුක තමයි තමන් ආදරේ කරන කෙනෙක් මැරුණහම එන වියෝ දුක.

'පුරහඳ කළුවර' චිත්‍රපටය බලලා තියෙනවා නම් මතක ඇති තාත්තා යුද්ධෙන් පුතා මැරුණා කියලා පිළිගන්නේ නැහැ. වන්දි දෙන කොළ ටික අත්සන් කරන්නත් බැහැ කියනවා. දරුවා, සැමියා, බිරිඳ මැරුණා කියලා පිළිගන්න අකමැති උදවිය මට පෞද්ගලිකව මුණගැහිලා තියෙනවා. ඒක පීඩනය මගඅරින්න මනස දන ප්‍රයෝගයක්. ටික කාලෙකින් සමහරු ඇත්ත පිළිඅරන් තත්ත්වය සාමාන්‍ය වෙනවා. තව සමහරු ඉන්නවා මැරුණු කෙනා කුරුල්ලෙක් වෙලා ගහක් වෙලා නැත්නම් ආයේ ඉපදිලා තමන්ගේ ළඟට ඇවිල්ලා කියලා හිත හදාගන්නවා. බොහෝදුරට මේවා කාටවත් කරදරයක් වෙන ප්‍රයෝග නෙමෙයි. හැබැයි මෙහෙම ඉන්න කෙනෙක් එකපාර මැරුණු කෙනා පේන්න ගන්නවා කියනවා නම් ඒ වෙනකොටත් ඔහු මානසික ව්‍යාධියක් දක්වා දුර ගිහින් ඉවරයි.

ඊළඟට අපි කතා කරන්නේ ප්‍රතික්‍රියා සාධනය (Reaction Formation) ගැන. ඔන්න හිතන්න ගමේ සෝමක්කා කියලා කාන්තාවක් ඉන්නවා. රස්සාව කසිප්පු පෙරන එක. සෝමක්කගේ කසිප්පු නිසා දවසින් දවස ගමේ පවුල් විනාශ වෙනවා. මිනිස්සු බීලා බීලා මැරෙනවා. මෙහෙම වෙද්දි සෝමක්කගේ හිතටත් පොඩි පශ්චාත්තාපයක් දැනෙනවා. මොළේ සෝමක්කට දෙනවා හොඳ ප්‍රයෝගයක්. ඒ තමයි පව් කැපෙන්න පිං කරන එක. ඔන්න එදා ඉඳලා සෝමක්කා දන දෙනවා, දන්සැල් දෙනවා, පන්සල් යනවා. සමාජ විරෝධී වැඩ කරද්දි මනුස්සයෙක්ට වැරදිකාර චේතනාවක් ඇතිවෙනවා. එතකොට ගොඩක් අය කරන්නේ පන්සලේ පල්ලියේ ප්‍රධාන දායකයා වෙන එක. වංචාවෙන් හම්බකරන මුදල් පිනට දුන්නහම ඒකට අරක කැපෙනවා කියන අදහසයි මනස දෙන්නේ.

හේතුයුක්තකරණය (Rationalzation) කියන සංරක්ෂණ ප්‍රයෝගයේදී වෙන්නේ තමන්ගේ වැරදි අනුන්ගේ පිට පටවලා තමන්ගේ අත පිහිදාගැනීමයි. උදාහරණයක් විදියට ළමයෙක් විභාගයක් ෆේල් වුණා කියන්නකෝ. එයා එතකොට කියන්නේ එයාගේ උනන්දුවේ මදිකම නෙමේ, ගුරුවරයාගේ අඩුපාඩු. මැච් පරදින්නේ පාලක මණ්ඩලේ කඹ ඇදිලි නිසා කියන එකත් අන්න ඒ වගේ එකක්.

උත්කර්ෂණය (Sublimation) මෙන්න මේක නම් බොහොම හොඳ සංරක්ෂණ ප්‍රයෝගයක්. හොස්ස ළඟින් මැස්සා ගියත් තරහා යන මනුස්සයෙක් ඉන්නවා කියලා හිතන්න. එහෙම කෙනෙක්ව බොහෝ ඉක්මනින් සමාජයෙන් රිජෙක්ට් වෙන්න පුළුවන්. ඒ ආවේගය පිට කරන්න මේ අය බොක්සිං, රෙස්ලින්, කරාතේ වගේ දේට යොමු වෙනවා. ඒක මනස දන සංරක්ෂණ ප්‍රයෝගයක්. තමන්ට ඇතිවෙන පීඩන, හැඟීම් පිට කරන්න කවි, කතා ලියන එකත් උත්කර්ෂණයම තමයි. මේ වගේ ප්‍රයෝගවලින් කාටවත් කරදරයක් නැහැ.

අවසාන වශයෙන් අපි කතා කරන්නේ ප්‍රතිවර්ථනය -(Regression) ගැන. මේකෙදි කරන්නේ පීඩනය මග අරින්න අතීතයට යන එක. ඒක කායික නැත්නම් මානසිකව වෙන්නත් පුළුවන්. උදාහරණයක් බොහොම ප්‍රචණ්ඩ සැමියෙක් එක්ක ඉන්න බිරිඳක් කියලා හිතන්න. එතකොට ඇය වර්ථමානයට කැමති නැහැ. ඇය



මේ ලෝකේ මනුස්සයෙක්ට දැනෙන්න පුළුවන් ලොකුම දුක තමයි තමන් ආදරේ කරන කෙනෙක් මැරුණහම එන වියෝ දුක. 'පුරහඳ කළුවර' චිත්‍රපටය බලලා තියෙනවා නම් මතක ඇති තාත්තා යුද්ධෙන් පුතා මැරුණා කියලා පිළිගන්නේ නැහැ. වන්දි දෙන කොළ ටික අත්සන් කරන්නත් බැහැ කියනවා.

දෙමාපියෝ එක්ක හිටපු කාලයට කැමති නම් ඇය විවාහය අතඇරලා ආපහු දෙමාපියන් ළඟට නැත්නම් අතීත පෙම්වතා ළඟට යන්න පුළුවන්. සමහරු මේක මානසිකවත් කරනවා. ඒ කියන්නේ කායික වශයෙන් අර සැමියා එක්ක ජීවත් වුණාට මනසින් ඉන්නේ අතීතයේ. ඒක සංරක්ෂණ ප්‍රයෝගයක්. මනසින් අතීතයේ ජීවත්වෙන එහෙම කෙනෙක්ව ලේසියකට අඳුනගන්න අමාරුයි. හැබැයි කවුහරුහරි එහෙම තත්ත්වයක ඉන්නවා කියලා හිතෙනවා නම් ඉක්මනින් උපදේශනයට යොමු කරන්න.

මට මේ ලිපියෙන් මතු කරන්න ඕන ප්‍රධාන කාරණාව අපි මිනිස්සු විදියට ජීවත්වෙනකොට අනිත් මිනිසුන්ගේ මානසික මට්ටම්, ඒ අය මෙහෙම වෙලා තියෙන්නෙ ඇයි කියන කාරණාව තේරුම් අරගෙන ජීවත්වෙමු කියන එක. එතකොට අපිට වුණත් මේ සමාජේ ජීවත්වෙන්න ලේසියි.

ඊගාවට සංරක්ෂණ ප්‍රයෝග ඇතිවෙන්නේ අවිඥාණිකව කියලා කිව්වවෙන්. අවිඥාණිකව මොන දේ වුණත් විඥාණිකාව හිතලා දෙයක් පාලනය කරගන්න පුළුවන් හැකියාවකුත් මිනිස්සුන්ට තියෙනවා. මෙහෙම දේවල් ගැන දැනුවත් වුණාම ආහ් මෙහෙම දේවලුත් තියෙනවනේ කියලා තේරුම්ගන්න පහසුයි. එහෙම තේරුම් අරන් තමන්ට දැනෙන පීඩන යහපත් විදියට කළමනාකරණය කරගන්න එකයි හපන්කම.

■ සෙව්වවන්දි හෙට්ටිආරච්චි



# ලස්සන කන්නද කියලා ඇහුවේ ලස්සනට ඉන්න අකමැති නිසා නෙවෙයි අනේ



සමහරු කියනවා නේද "ලස්සන නම් කන්නද අනේ... හිත ලස්සන වුණාම හොඳටෝම ඇති" කියලා.

ඉතින් ඒ කතාව විශ්වාස කරලා ඔයත් නිකන් හඩ්ඩෙක් වගේ ඉන්න හිතලා තියෙනවද? එහෙනම් මම ඔයාට කරන්න පුංචි වැඩක් කියන්නම්. හැබැයි ඉතින් මේක පරණ මතක පෙට්ටිය අවුස්සලා බලන්න වෙන ජාතියේ වැඩක්.

හොඳට මතක් කරලා බලන්නකෝ මෑත කාලෙක කවුද ඔයාට එහෙම කතාවක් කිව්වේ කියලා. එතකොට එහෙම කිව්ව කෙනෙකුගේ මූණක් නැත්නම් නමක් ගමක් හරි මතකෙට එයි. දැන් හිතලා බලන්න ඒ කෙනාගේ ජීවිතේ ඇතුළාන්තය ගැන ඔයා මොනවද දන්නේ කියලා?

අපි හිතමු එයා ගැහැනු කෙනෙක් කියලා. ඔයාට මතකයිද එයාගෙ බාහිර පෙනුම කොයි වගේද කියලා? සමහරවිට ඔයාට මතක් වෙයි, එයාට ඒ තරම් ආකර්ෂණීය පෙනුමක් නොතිබුණු බව... එහෙම නැත්නම් එයා ඇත්තටම ආකර්ෂණීය කෙනෙක් කියමුකෝ. එහෙනම් එයාගේ ප්‍රේමවන්තයා, සැමියා හෝ දරුවන් එච්චර ආකර්ෂණීය අය නෙවෙයි වෙන්න ඇති.

එතකොට ඇයි එයා ඔයාට එහෙම කතාවක් කිව්වේ? සමහරවිට ඔය කියපු දේවල්වල ඊට වැඩිය ආකර්ෂණයක් නැත්නම් එළියක්, ඔයාගෙ ජීවිතේ තියෙනවා එයා දකින්න ඇති. "ලස්සන නම් කන්නද අනේ" කියලා කිව්වේ ඒ නිසා මිසක් එයා ලස්සන වෙන්න අකමැති හින්ද නෙවෙයි කියන එක දැන් ඔයාගේ ඔය පුංචි මොළේට වැටහෙන්න ඕන.

ඇත්තටම මේ ලෝකේ මොන මනුස්සයද කියන්නකෝ කැමැති කැතට ජීවත්වෙන්න..? කවුරුත් එහෙම කැමැති නෑ. අපි හැමෝම කැමති පුළුවන් තරම් ලස්සනට ඉන්න.

දැන් ඔය දරුවෝ ලැබෙන්න ඉන්න අම්මලා දිහා ටිකක් බලන්න. එයාලාගෙ කාමරවල බිත්තිවල එල්ලගෙන ඉන්න බබාලා කැත අයද? නෑනේ... නිල් පාට ඇස් තියෙන, සුදුම සුදු පාට බෝල ගෙඩි වගේ පැටවුන්ගේ පින්තූර නේද එයාලගේ බිත්තිවල එල්ලිලා ඉන්නේ? ඇයි ඒ? එයාලා විශ්වාස කරනවා දරුවා ලැබෙන්න ඉන්න කාලෙදි නිතර නිතර ඒ වගේ ලස්සන දරු පැටව් දකින එකෙන් එයාලගේ බඩේ ඉන්න පැටියත් ලස්සන එකෙක් වෙයි කියලා.

හැබැයි එහෙමයි කියලා ඔය විදියේ ලස්සන පින්තූර දිහා බලාගෙන ඉන්න හැම අම්මා කෙනෙකුටම ජපන් බෝනික්කෝ වගේ දරුවෝ ලැබෙනවාද? නෑ... එහෙම වෙන්නේ නෑ... හැබැයි ඒ අම්මලා දරුවෝ ලැබුණාම මේ දරුවා කැතයි, ඇස් ලොකුයි, නැත්නම් නහය ඇදයි කියලා කැලේට විසි කරන්නේ නෑ. උණහපුලුවාට උගේ පැටියා මැණිකක් කියනවා වගේ උපන් දා ඉඳලා දෑහෙ මූණෙ තියාගෙන රකිනවා. හැබැයි එහෙමයි කියලා තමන්ගේ දරුවා බෝනික්කෙක් වගේ ලස්සන වෙනවාට මේ ලෝකෙ කිසිම අම්මා කෙනෙක් අකමැති නෑ.

ඒ නිසා මතක තියාගන්න. ඔය ලස්සන නම් කන්නද කියලා අහන ගොඩක් මිනිස්සු කැමැත්තෙන් හෝ අකමැත්තෙන් කවර් කරගන්න හදන්නේ ඒගොල්ලන්ගේ ඇරියස් එකක්.

ඒ වගේ අයගේ බහට රැවටිලා ඔයා නාන්නේ නැති, සැලෝන් එකකට ගිහින් ලස්සන හෙයාර් කට් එකක් දාගන්නෙ නැති, ඉඳලා හිටලාවත් කොණ්ඩෙට තෙල් සාත්තුවක් කරන්නේ නැති, මාසෙකට පාරක්වත් මෙනිකියු එකක් පෙඩිකියු එකක් එක්ක ලස්සන නේල් කලර් එකක් apply කරන්නේ නැති හඩ්ඩියෙක් වගේ ජීවත්වෙන්න හදන්න එපා.

අර කිව්වත් වගේ ලස්සන කන්න බැරි බව ඇත්ත. හැබැයි ඔයා ඔය කියපු දේවල්වලින් එකක්වත් නොකර ඔන්න ඔහේ ඉන්නන් වාලේ ඉඳලා බලන්නකෝ. හරියට අර උන්නත් දහයි මලත් දහයි වගේ.

එහෙම වෙද්දී වැඩිම වුණොත් ඔයාගේ අම්මා, තාත්තා, එතකොට දරුවෝ, ළඟම නෑයෝ ඔයත් එක්ක ඉඳියි. හැබැයි අලුතින් කිසිම කෙනෙක් ඔයා එක්ක කතාබහ කරන්න, ඔයාව ආශ්‍රය කරන්න, ඔයා එයාලගේ මිත්‍ර සමාගම්වල කොටසක් කරගන්න කැමැති වෙන්නේ නෑ.

දැන් ඔයා කියයි, ඉතින් එහෙම වුණාම මගෙ මොකද ... මං මේ ඉන්න විදිය හොඳයිනේ කියලා. ඔව්... තමන්ගේ circle එක පුංචි වෙන තරමට හොඳයි තමයි. ඒත් සමාජ ජීවීන් විදියට ජීවත්වෙද්දී, රැකියා කරද්දී, වෙන වෙන බාහිර වැඩ කටයුතුවලට සම්බන්ධ වෙද්දී අපිට තනියම ඉන්න බෑ. අලුත් මිනිස්සු එක්ක ගනුදෙනු කරන්න වෙනවා. අලුත් අයව අඳුනගන්න වෙනවා. අන්න එහෙම තැන්වලදී ඔයාට විශේෂත්වයක් හිමිවෙන්නේ ඔයා ටිකක් පෙනුමට ලස්සනට හිටියොත් විතරයි. ඒකට වයස් භේදයක් බලපාන්නේ නෑ.

මම මේ කියන කතාව බොරු නම් මෙහෙම හිතලා බලන්න. හැමදාම ඔන්න ඔහේ මොකක්හරි ඇඳුමක් පටලවාගෙන, කාලෙකින් මඩ දූවිලි හෝදලා නැති සෙරෙප්පු කබල් දෙකකුත් දාගෙන, කොණ්ඩේ එක මිටට බැඳගෙන කිසිම එළියක් නැතුව ඉන්න ගෑනු ළමයෙක් ඔයා නොදන්නවා වෙන්න බෑනේ. ඒ වගේම තියන ඇඳුම් කෑලි දෙක තුන හරි ලස්සනට ගලපලා අඳින, කොණ්ඩේ, මූණ, අත් කකුල් පිරිසිදුව ලස්සනට තියාගෙන ඉන්න, චාම් ලස්සන විලාසිතා කරන ගෑනු ළමයෙකුත් ඔයා දන්නවා ඇතිනේ. මේ දෙන්නාගෙන් වැඩි ආකර්ෂණයක් තියෙන්නේ කාටද? මේ දෙන්නාගෙන් වැඩිපුර යාළුවෝ ඉන්නේ කාටද? මේ දෙන්නාගෙන් වැඩි ආත්මවිශ්වාසයකින් වැඩ කරන්නේ කවුද?

එහෙම හිතලා බලද්දී ඔයාට තේරුම් ගන්න පුළුවන් වෙයි ලස්සන කියන එක තියෙන්නේ කන්න නෙවෙයි maintain කරන්න කියලා. ඒකට ඔයා හිතන තරම් මහා ලොකු වියදම් දරාගෙන දේවල් කරන්න ඕන නෑ. තමන්ට උපතින් ලැබුණු පෙනුම නඩත්තු කරන්න පුළුවන් පුංචි පුංචි විදි ටිකක් හොයාගන්න. ඒකෙන් ඔයාගෙ පෞරුෂය ගොඩනැගෙනවා. හැම වෙලාවකම පිරිසිදුව ඉන්න. ඒකෙන් ඔයාට අමුතු එළියක් ලැබෙනවා. මුණේ ෆවුන්ඩේෂන් ගෑවට වැඩක් නෑනේ විලුඹවල් දෙකේ මඩ හෝදලා නැත්නම්... නේද?

ඒ නිසා ලස්සන කන්නද කියලා අහන අයට ඕන කුදයක් ගහගන්න කියලා ඔයා රෝස මලක් වගේ ලස්සනට ඉන්න... එහෙම ඉන්න ගත්තාම පෙනෙයි මෙතෙක් ජීවිතේ සිද්ධ නොවුණු හාස්කම් ගොඩක් සිද්ධ වෙනවා කියලා. මේ ඇත්තමයි කියන්නේ.

අපූර්වා

හිත කොනිත්තන කවි

## හිරුට මෙන් ඇයිද මට ඉඹින්නට බැරි වුණේ



අඳුරු සළු පාත්වෙන
හිරු නිවෙන කණිසමේ
කැලණි ගඟ නිල් දියට
රතු අව්ව පාත් වේ
රතු පාට රිව් මඬල
ගංදියේ නටන හැටි
බලා ඉම්! ඔබ හොරෙන්
හිතට එයි සක්මනේ


ගඟ දියෙන් ඉහළ නැග
කවුළුවෙන් දුම්රියේ
හමා එන පවන් රොද
ඔබේ සිරුරේ වැදේ
ඔබේ දිගු කෙහෙවලිය
හුළං දහරේ වෙළී
ඔයාටත් රහසින්ම
මගේ කොපුලත වෙලේ

කොළඹ සිට නුවර යන
දුම්රියේ කවුළුවෙන්
රාස්සිගෙ අව් රැල්ල
ඔබේ මුහුණට එබේ
සුදු පාට දෙකම්මුල්
රෝස පාටට පෙනේ
හිරුට මෙන් ඇයිද මට
ඉඹින්නට බැරි වුණේ

පිච්ච මල් පිපුණා ද
මිදුල අග මල් වැටේ
තිබූ සුවඳම දැනේ
ඔබේ නිල් කෙහෙ රොදේ
කොයිතරම් ආදරේකින්ද
අප ළංවුණේ
ඒත් අද ඔයා නෑ
මා පමණි දුම්රියේ

තරන

# නලියන්න ඕන වයසේදී මියයන්න වුණු අලි පුතා



තොරතුරු
**පැතුම් බණ්ඩාර**

**'නිල් තණකොළ බුදින්ටයි**
**හිතුණු තැනක ලගින්ටයි**
**රැලේ වැටී නටන්ටයි**
**කැලේ අයිති අලින්ටයි'**


මහාචාර්ය සුනිල් ආරියරත්න එසේ ලියුවේ 'අලි කතාව' චිත්‍රපටය වෙනුවෙනි. අලි පැටවකු සහ දරුවකු අතර පවතින මිතුදම තේමා කොටගෙන එම චිත්‍රපටය සැකසී ඇත. කැලේ අයිති අලින්ටයි කියා ගීතයේ කීවද ඉඳහිට ගමට පනින අලිද නැතුවාම නොවේ. ගල්ගමුවේ එවැනි අය බොහෝය. මීට පෙර කිහිප වතාවකම අප සඳහන් කළ 'චණ්ඩි' ද එවැන්නෙකි. නමුත් මේ කතාව චණ්ඩි ගැන නොවේ. චණ්ඩිගේ පළාතේ සැරිසැරූ කුඩා අලි පැටවකු ගැනයි.

වන සතුන්ගේ ඡායාරූප ගැනීමට රට පුරා ඇවිදින පැතුම් බණ්ඩාර තවත් පිරිසක් සමග ගල්ගමුව ප්‍රදේශයටද ගොස් තිබුණේ අලි ඇතුන්ගේ ඡායාරූප ගැනීමටයි. ගිය රාජකාරිය නිමා කළ පිරිස නැවත ගම්බිම් බලා ඒමට පිටත් වූහ. එවිට තරමක් සැන්දෑ වී තිබිණ. ගමට මායිම්ව හේන් යාය අයිනේ දිවයන අලි පැටවකු ඔවුන් දුටුවේ එවිටයි. පැටවාගේ උස අඩි හතරක් පමණ විය. පෙනුමේ හැටියටනම් වයස අවුරුද්දකට වැඩි විය යුතුය. සාමාන්‍යයෙන් අලි පැටවුන් තනිව සිටින්නේ නැත. එනිසා මේ පැටවා අතරමං වී ඇති බව පිරිසට වැටහිණ. ඔවුහු වහාම වාහනය පසෙකට කර නවතා ඉන් බැස ගත්හ. ඔවුන්ගේ අරමුණ වූයේ අලි හුරතලා අල්ලා වනජීවියට බාරදීමයි.

එහෙත් මේ පැටවාට ළංවෙද්දි පිරිසට දැකගැනීමට ලැබුණේ ඊට වඩා ඛේදජනක තත්ත්වයකි. පැටවා ඒ වනවිටත් හක්ක පටස් ගොදුරක් බවට පත්වී තිබිණි. හක්ක පටස්වලට ගොදුරු වන සතෙකුට වෙන හානිය කිසිසේත් ඉහිලිය නොහැකිය. ඉන් ආහාර ජීර්ණ පද්ධතියේ සියලු කොටස්වලට සෘජුවද වක්‍රවද හානි සිදුවේ. මුඛ ප්‍රදේශයට වන හානිය වඩාත් බරපතළය. අවසන බැක්ටීරියා ආසාදනය වී කෑමට බීමට පවා නොහැකිව බොහෝ දුක් විඳ මියයාමට සිදු වේ. ගොඩබිමදී තුවාලයට මැස්සන්ගෙන් සහ පණුවන්වන්ගෙන් කරදරය. ජලයේදී මාළු අනියි. මේ අලි පැටවාගේ තුවාලයද දින කිහිපයකට පෙර සිදුව ඇති බව පැතුම් ඇතුළු පිරිසට වැටහී ගියේය. එය ඒ වනවිට කුණු වී තිබිණ. අලිපැටවා සිටියේ දැඩි වේදනාවකිනි.

තුවාලයේ වේදනාව මෙන්ම ආහාරපාන නොමැති වීමත්, පිරිස මගහැරීමත් නිසා අලි පැටවා උමතු වී ඇති සෙයකි. තමාට වින කළ අය ගැන කේන්තියක්ද පැටවාට තිබෙන්නට ඇත. එලෙස සිටියදී ඔහු දුටුවේ තමා වෙතට එන මිනිසුන් පිරිසකි. පැටවාගේ කේන්තිය නිම්හිම් නැත. හෙතෙම හැකි වෙර යොදා පිරිස පසු පස පැන්නීය. අලි පැටවාට උදව් කිරීමට පැමිණි පිරිසට වූයේ වළින්න ගිය දේවාලය හිසේ කඩා වැටුණා වැනි සිද්ධියකි. ඔවුහු හිස් ලූ ලූ අත දිවූහ. අලි පැටවාද ඔවුන් පසුපස පැන්නීම අත් නොහළේය. එම පැටවා මිනිසුන්ට පහරදීමට තරම් විශාල නැත. එහෙත් යමකු පය පැටලී බිම වැටී අලියා පෑගුවොත් ලේසි පාසු නැත. එනිසා දිව යාම හැර විකල්පයක් ඔවුන්ට තිබුණේ නැත. වාසනාවකට තරමක් විශාල පඳුරක් පිරිසට හමුවිය. පිරිස ඒ වටේ දිව ගොස් අලි පැටවා මග හැර ගැනීමට සමත් වූහ. අලි පැටවාද ඉලක්කය අත හැරුණු පසු වේදනාවෙන් කොහි හෝ යන්නට ඇත. පැටවා වෙනුවෙන් කිසිවක් කළ නොහැකි වූ පිරිස නැවත වාහනයට නැග පිටත් වූහ. පසුව සොයා බලද්දී දැනගන්නට ලැබුණේ පැටවා වනජීවියට හමු වී ඇති බවයි. ඒත් නොවිඳිනා දුක් විඳි සුරතලා ඉන් සතියකට පමණ පසු දිවි හැර ගොස් තිබිණි.

■ **රෂ්නිකා ලියනගේ**





අපේ රටේ හිටපු අනාවැකිකරුවෝ කියපු ප්‍රසිද්ධම අනාවැකිවලින් එකක් තමයි 1955 අවුරුද්දේ ජූනි 20 වැනිදා ලංකාවට පූර්ණ සූර්යග්‍රහණයක් දර්ශනය වෙනවා කියපු එක. එදාට කවුරු හරි ගහක් හිටෙව්වොත් සිය ගුණයකින් පලදාව ලැබෙනවාය, කාන්තා උදවියගේ මුණේ වද කහ ආලේප කළොත් සම පැහැපත් වෙනවාය කියලත් මේ අනාවැකිකරුවෝ කිව්වා. ඉතින් ඔය දෙවැනි කතාව නිසා අපේ බවලතියෝ හිටියේ මේ කියපු සූර්යග්‍රහණය එන්නේ කොයි වෙලාවෙද කියලා ඇඟිලි ගැන ගැන.

කොහොමින් කොහොමහරි ඒ දවස උදාවුණා. එදා පිරිමි උදවිය හිටියේ පොල් පැළ, කොස් පැළ එහෙම අතේ තියාගෙන. ඒත් ගෑනු උදවිය නම් හිටියේ වද කහ කෝප්ප අතේ තියාගෙන. ඉතින් ඔහොම ඉන්න අතරේ ජූනි 19 වැනිදා ලංකාවේ ජාතික පුවත්පතක් ප්‍රධාන සිරස්තලය සහිතව තවත් අනාවැකියක් කරළියට අරගෙන ආවා. ඒ තමයි අර මුණේ ගාන්න තියාගෙන ඉඳපු වද කහ බිව්වොත් පංච කල්‍යාණයෙන් අගතැන්පත් රූපයක් ලැබෙනවය කියලා. ඉතින් අපේ උන්දැලත් මොකද කළේ, සූර්යග්‍රහණය වෙලාවේ වද කහ මුට්ටි පිටින් බොන්න පටන් ගත්තා. ඒ වැඩිපුර ලස්සන

කොච්චර ප්‍රසිද්ධ වුණාද කිව්වොත් එවකට පැවති දෙවැනි ලෝක යුද්ධ සමයේදී ඇගෙන් අනාවැකි අහන්න මිනිස්සු වැල නොකැඩී ආවා. ඒ විතරක් නෙවෙයි 1942 වසරේදී බාබ වැන්ගා මුණගැහෙන්න බල්ගේරියානු තුන්වැනි බොරිස් සාර්තුමාත් ඇවිත් තියෙනවා. ඒ වෙලාවේ තමයි බාබ වැන්ගා කියලා තියෙන්නේ තමන්ට අනාවැකි කියන්න ලැබුණු වරම පිටිපස්සේ නොපෙනෙන බලවේගයක් තියෙන බව.

'Wiesler Field to the Paranormal' කියන ග්‍රන්ථයේ සඳහන් විදියට ඇය කියපු අනාවැකි බොහෝ ප්‍රමාණයක් හරියටම හරි ගියා. ඒ අතර 2011 අවුරුද්දේ ඇමෙරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල වුණු ප්‍රහාරය, ISIS ත්‍රස්ත කණ්ඩායමේ බිහිවීම ගැන ඇය පළ කළ අනාවැකි සඳහන් කරන්න පුළුවන්. ඒ වගේම ඇය කියපු අනාවැකි අතරින් 2004 වසරේදී ඇතිවුණු






අනාවැකියක සඳහන්වෙනවා. ඇය කියන විදිහට ලෝක විනාශයක් වෙනවා නම් වෙන්නේ 5079 අවුරුද්දෙලු. මේ අතර බාබ වැන්ගා තමන්ගේ මරණය සිද්ධවෙන දිනය ගැනත් අනාවැකියක් කියාගෙන තිබුණා. එදා මුළු ලෝකයක් පුදුම කරලා කියපු දිනයේ (1996 අගෝස්තු 11 වැනිදා) ඒ විදියටම ඇය මියගියා. මේ අතර 1994 අවුරුද්දේ ඇනටොලි ලුබ්චෙන්කෝ කියන එරටේ ව්‍යාපාරිකයෙක් මුණගැහුනු වෙලාවක බාබ වැන්ගා ඔහුටත් ලෝකය ගැන භයානක අනාවැකියක් කියලා තියනවා. ඒ තමයි 2024 - 2034 කාලසීමාවේදී ලෝකයේ මහා ජලගැලීමක් සිද්ධවෙලා රටවල් කීපයක්ම හෝදගෙන යනවා කියන එක. ඒක එහෙම වෙනවද කියලා ජීවතුන් අතර හිටියොත් අපිටත් බලාගන්න පුළුවන්.

මේ අතර ඉදිරි වසර දෙක තුන ඇතුළත ලොව පුරාම මිනිස් ජීවිත දහස් ගණනින් බිලිගන්න පිළිකා රෝගයට ප්‍රතිකාරයක් සොයාගන්නවා කියලා බාබ වැන්ගගේ අනාවැකියක තියෙනවා. ඇය ඒක කියලා තියෙන්නේ 'පිළිකාව යකඩ දම්වැල්වලින් බැඳ දමන දිනය ඉදිරියේදී පැමිණේවි' යනුවෙන්.

2021 අවුරුද්ද ලෝකය විශාල ව්‍යසනයකට මුහුණපාන අවුරුද්දක් වෙනවා කියලා මුලින්ම අනාවැකියක් පළකළෙත් බාබ වැන්ගා. පස්සේ තමයි ඇය ඒ කිව්වේ කොරෝනා වසංගතය ගැන කියලා ලෝකයට පැහැදිලි වුණේ. තවද ලෝකයේ බලය විශාල මකරෙකු විසින් අල්ලගන්න බවත් ඊට එරෙහිව යෝධයින් තිදෙනෙකු නැඟී සිටින බවත් ඇයගේ අනාවැකියක

# වසර 5000 දී වෙන දේ කියූ ඇස් නොපෙනෙන බාබ වැන්ගා



වෙන්න හිතාගෙන. ඒත් අන්තිමට සිද්ධ වුණේ ඒ අයට අධිකව වමනේ ගිහින් කෙළින් කටින් ඉන්න බැරිව ඉස්පිරිතාල වල ලඟින්න වුණු එක. අර 'බිව්වා නේද වද කහ සුදිය' කියන සිංදුව හැදුනෙත් ඔය සිද්ධිය නිසා කියනවනේ. ඉතින් ඔය වද කහ අනාවැකිය මතක් වුණේ මේ ලියන්න යන්නෙත් අනාවැකි කියපු කාන්තාවක් ගැන හින්ද. හැබැයි ඉතින් ඇය කියපු අනාවැකි නම් වද කහ අනාවැකි වගේ බොරු වෙලා නෑ ඕං.

ඇය තමයි බල්ගේරියානු ජාතික බෝල්කන් නොස්ට්‍රඩාමුස්. හැබැයි ලෝකයම ඇයව දන්නේ 'බාබ වැන්ගා' කිව්වම. බාබ වැන්ගා ඉපදුණේ 1911 ජනවාරි 31 වැනිදා. ඉපදිලා ටික දවසකින් ඇගේ මව මියගියා. ඒක නිසා පුංචි කාලේ ඉඳන්ම ඇය හැදුනේ වැඩුනේ මව් සෙනෙහස අහිමිවුණු දැරියක් විදියට. දවසක් බාබ වැන්ගා ගෙදර මිදුලේ සෙල්ලම් කරමින් ඉන්නකොට ඇය ටොනේඩෝවකට අහුවුණා. ඒක කොච්චර භයානක ටොනේඩෝවක්ද කිව්වොත් දූවිලි වලා අස්සෙන් ගෙවල්වල උදවියට කෙල්ලව හොයාගන්න ලැබුණේ දවස් කීපයකට පස්සේ. හැබැයි ඒ සාමාන්‍ය දැරියක් විදියට නෙවෙයි, ඇස් දෙකම අන්ධ වුණු දැරියක් විදියට.

කතාවක් තියෙනවනේ හැම අඳුරු වලාවකම රිදී රේඛාවක් තියෙනවා කියලා. අන්න ඒ වගේ දෙයක් එදා බාබ වැන්ගගේ ජීවිතෙත් සිද්ධවුණා. ඒ තමයි අන්ධවීමත් එක්ක ඇයට අනාගතය ගැන අනාවැකි කියන්න අපූරු වරමක් ලැබුණා. ඊටපස්සේ ඇය ලෝක ප්‍රසිද්ධ චරිතයක් වුණා.

**'පිළිකාව යකඩ දම්වැල්වලින් බැඳ දමන දිනය ඉදිරියේදී පැමිණේවි'**

සුනාමි ව්‍යසනය, 2000 වසරේදී මුහුදුබත් වූ රුසියානු කර්ස්ක් සබ්මැරීනය වගේම සෝවියට් සමූහාණ්ඩුවේ බිඳ වැටීම සහ චර්නොබිල් න්‍යෂ්ටික බලාගාර අනතුර වගේ අනාවැකි සියල්ලම 100%ක්ම හරි ගියා.

බාබ වැන්ගාගේ අනාවැකි කියන විදියෙත් පුංචි වෙනසක් තිබුණා. ඇය කියපු කිසිම අනාවැකියක් සෘජුව කියලා නෑ. කියලා තියෙන්නේ වක්‍රාකාරව. හොඳම උදාහරණය තමයි 2011 අවුරුද්දේ ඇමෙරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල වුණු ප්‍රහාරය ගැන ඇය කියපු අනාවැකිය. ඇය ඒ අනාවැකිය කියලා තිබුණේ 1989 වසරේ. ඒ 'යෝධ යකඩ කුරුල්ලෙක් විසින් ඇමෙරිකාවේ නමගිය නිවුන් සොයුරන් දෙදෙනකු (Twin Tower) බිම හෙළනු ඇත' යනුවෙන්.

1994 වසරේ පාපන්දු ලෝක කුසලාන තරඟාවලිය ගැන ඇය කියපු අනාවැකිය අදටත් පාපන්දු ලෝකයේ කතාබහට ලක්වෙන අනාවැකියක්. එදා අවසන් මහා තරඟය සඳහා ඉංග්‍රීසි 'බී' (B) අකුරින් ආරම්භ වෙන රටවල් දෙකක් සුදුසුකම් ලබන බවත් එවකට ප්‍රබල කණ්ඩායමක් විදියට හිටපු ඉතාලි කණ්ඩායම අවසන් පූර්ව වටයේදී පරාජයට පත්වෙන බවත් ඇය පැවසුවා. ඇය කියපු විදියටම එවර ඉතාලිය අවසන් පූර්ව වටයේදී පරාජයට පත්වුණා. ඒ වගේම අවසන් මහා තරඟයට සුදුසුකම් ලැබුවේ ඉංග්‍රීසි 'බී' (B) අකුරින් ආරම්භ වෙන බ්‍රසීලය සහ බාබ වැන්ගා ජීවත් වූ බල්ගේරියාව. මේ අතර ඇය කියපු තව ප්‍රබල අනාවැකියක් වුණේ 44 වැනි ඇමෙරිකා ජනාධිපතිවරයා ගැන කියපු අනාවැකිය. ඇය කිව්වේ ඇමෙරිකාවේ 44 වැනි ජනාධිපති වෙන්නේ කළු ජාතිකයෙක් කියලා. කියපු විදියටම එවර ඇමෙරිකාවේ ජනාධිපති පුටුවේ ඉඳගත්තේ කළු ජාතිකයෙක් වුණු බැරැක් ඔබාමා.

බාබ වැන්ගාගේ ප්‍රබල අනාවැකි අතර 2004 දෙසැම්බර් මස 26 වැනිදා ලංකාවට බලපෑ සුනාමි උවදුරත් සඳහන් වුණා. ඒ වගේම කවුරු කොහොම කිව්වත් 51 වැනි සියවස උදාවෙන කල්ම ලෝක විනාශයක් වෙන්නේ නෑ කියලත් ඇගේ එක්තරා

සඳහන්. ඇය කියන මකරා 'චීනය' කියලා නම් දැනටමත් පැහැදිලි වෙලා ඉවරයි. මේ අතරේ බාබ වැන්ගගේ සමහර අනාවැකි අසත්‍ය වෙලා ගිය අවස්ථාත් නැතුවම නෙවෙයි. ඒකට හොඳම උදාහරණයක් 2020 වසරේදී රුසියානු ජනාධිපතිවරයා ඝාතනය වෙනවා කියපු අනාවැකිය.

කොහොම වුණත් මේ දිනවල ඇගේ තවත් ප්‍රබල අනාවැකි කීපයක් කරළියට ඇවිත්. ඉදිරියේදී චීනය ලොව බලවත්ම රටවීමත්, 2025 - 2028 කාලය තුළදී නව බලශක්ති මූලයක් නිර්මාණයවීමත්, 2033 - 2045 කාලය තුළ යුරෝපයේ මුස්ලිම් පාලනයක් ඇරඹීමත්, 2049 - 2070 කාලය තුළ ශරීර ඉන්ද්‍රිය නිෂ්පාදනයත්, 2088 - 2167 කාලය තුළ ලෝකය තුළ භයානක නව රෝගයක් ව්‍යාප්තවීමත්, 2170 - 2259 කාලය තුළ දැඩි නියඟයක් උදාවීමත්, 2262 - 2304 කාලය තුළ පැරණි අභ්‍යාවකාශ මධ්‍යස්ථාන සහ චන්ද්‍රිකා ආදිය කඩාවැටීමක් මෙන්ම 2341 - 3805 කාලය තුළ අහසින් කිසියම් භයානය වූ දෙයක් පෘථිවියට පැමිණීමත් ඒ හරහා පෘථිවිය වටා දූවිලි කලාපයක් නිර්මාණයවීමත් තමයි ඒ අනාවැකි. දැන් ලෝකයම බලන් ඉන්නේ මේ අනාවැකි දිහා. ඒ මොකද ලෝකේ කොච්චර අනාවැකිකාරයෝ බිහිවුණත් අදටත් ලෝකෙම පිළිගන්නේ අන්ධ ගැහැනියක් වුණු බාබ වැන්ගාගේ අනාවැකි විතරයි.

■ රුවන් එස්.සෙනවිරත්න




# ආපහු කවදාවත්ම මං කොණ්ඩේ වවන්නේ නෑ

## දිවාරා ගනේගොඩ



TV දෙරණ හැමදාම අලුත් දෙයක් ප්‍රේක්ෂකයන් අතරට ගේනවා කියන එක අමුතු දෙයක් නෙමෙයිනේ. හැමදාම එකම විදියේ ටෙලිනාට්‍ය රැල්ලක යන ප්‍රේක්ෂකයන්ට TV දෙරණ මේ දවස්වල වෙනස්ම විදියක ටෙලිනාට්‍ය අත්දැකීමක් ලබාදෙනවා. ඒ තමයි 'හේල්‍යන්' (Healien). පහුගිය ජූනි 10 වැනිදා ඉඳලා සතිඅන්තයේ හවස 5.55ට විකාශය වෙන මේ කතාව බලන්න වැඩිහිටියෝ විතරක් නෙමෙයි පුංචි අයත් බොහොම මනාපයි කියලයි අපිට දැනගන්න ලැබුණේ.

හේල්‍යන් කියන්නේ විද්‍යා ප්‍රබන්ධ කතාවක්නෙ. ඒ කියන්නේ චරිත කිහිපයක් වටා ගොඩනැගෙන කතාවක්. ඒ නිසා හේල්‍යන් ටෙලිනාට්‍යයේ ප්‍රධාන චරිත කිහිපයක්ම ඉන්නවා. ඉන් එක චරිතයක් තමයි ජෙනී. ජෙනී කියන්නේ සටන්කාමී සහ හැකියාවන් කිහිපයක් තියෙන තරුණියක්. සටන්කාමී චරිතයක් රඟපාන්න සුකුමාල හැම නිළියකටම බැහැ. ඒ වගේ චරිතෙකට ගැළපෙන්නේ පෙනුමේ ඉඳලම ක්‍රියාදාම ශෛලීය තියෙන නිළියක්. ක්‍රියාදාම චරිතයට නොගැළපෙන නිළියක් නිසා 1974 ගහපු 'වොන්ඩර් වුමන්' චිත්‍රපටය පවා අසාර්ථක වුණා කියල ගොඩක් අය දන්නවනේ.

හැබැයි 'හේල්‍යන්' ටෙලිනාට්‍යයේ 'ජෙනී' කියන සටන්කාමී තරුණියට රඟපාන්නේ ඒ චරිතයටම උපන්හපන්කම් ඇති නිළියක්. ඇය දිවාරා ගනේගොඩ. දිවාරා කියන්නේ නවක නිළියක්. මේ ඇගේ ප්‍රථම ටෙලිනාට්‍යය. හැබැයි ඇගේ රංගනයේ නම් නවක බවක් පේන්න නැහැ කියලා හේල්‍යන්ගේ රසිකයෝ මේ වෙනකොටත් දන්නවා. හැමෝම ආදරේ කරන හේල්‍යන් නාට්‍යයේ ජෙනී ගැන දිවාරා එක්ක ටිකක් කතා කරන්න අපි හිතුවේ ඒකයි.

**දිවාරා මේ දවස්වල පුංචි තිරයේ ජනප්‍රිය නිළියක් නේද?**

ඔව්. ඒක නම් මටත් දැනෙනවා. ඒ ජනප්‍රියකමට හේතුව 'හේල්‍යන්' ටෙලිනාට්‍යයේ මං කරන 'ජෙනී' කියන චරිතය. වයස් භේදයක් නැතුව ඒ චරිතෙට ගොඩාක් අය ආදරෙයි. ඒ නිසාම මේ දවස්වල ගොඩාක් අය මාව දන්නවා. ටීවී දෙරණ නාලිකාවේ සතිඅග හවස 5.55ට තමයි හේල්‍යන් විකාශනය වෙන්නේ.

**සම්ප්‍රදායික ටෙලිනාට්‍ය කලාවෙන් බැහැරවෙච්ච් 'හේල්‍යන් වගේ වෙනස්ම නිර්මාණයකට දායකවෙන්න ලැබුණු එක ගැන මොකද හිතෙන්නේ?**

ඇත්තටම මට මේ ටෙලිනාට්‍යයේ රඟපාන්න අවස්ථාව ලැබුණේ අහම්බෙන්. නාට්‍යයේ අධ්‍යක්ෂ තුෂාර තෙන්නකෝන් සර් මාව දැකලා මගේ පෙනුමත් එක්ක ඒ නිර්මාණයට මම ගැළපෙයි කියලා හිතලයි මට කතා කරලා තියෙන්නේ. ඒත් මට නාට්‍යයේ ප්‍රධානම චරිතයක් ලැබෙයි කියලා නම් කීයටවත් හිතුවේ නෑ.

**ඒ කියන්නේ හේල්‍යන් ඔබ රංගනයෙන් දායක වෙන පළවැනි ටෙලිනාට්‍ය?**

ඔව්. මට රංගනයෙන් දායක වෙන්න ලැබුණු පළවැනි ටෙලිනාට්‍යයේම ප්‍රධාන චරිතයක් කරන්න තරම් මං වාසනාවන්ත වුණා.

**ජෙනී චරිතය වෙනුවෙන් දිවාරට සෑහෙන්න කැපකිරීම් කරන්න වුණාලු නේද?**

ඔව් ජෙනී චරිතය වෙනුවෙන් මං ලොකු කැපකිරීමක් කළා. කැලෑවල ගල්ගුහාවල එහෙම තමයි රූගතකිරීම් තිබුණේ. ඒ විතරක් නෙවෙයි සටන් කරන්නත් ගොඩක් ඉගෙනගන්න වුණා.

**රූගතකිරීම් කරන අතරතුරේ වෙච්ච අමතක නොවෙන සිදුවීම් එහෙම නැද්ද?**

අම්මෝ ඕනතරම්. දවසක් සටන් කරන අතරතුරේ මාව ඇදගෙන වැටුණා. ඒ වැටුණු සැරේ වෙච්ච තුවාලෙක කැළලක් තාමත් අතේ තියෙනවා.

**දිවාරට පුංචි කාලේ ඉඳන්ම නිළියක් වෙන්න හීනයක් තිබුණද?**

ඔව්. පුංචි කාලේ ඉඳලා එහෙම ආසාවක් තිබුණා. මගේ ගෙවල් රත්නපුර, බලංගොඩ. රැකියාවත් එක්ක මම කොළඹ ආවා. ඉස්කෝලේ යන කාලේ සද්ධාමංගල සූරියබණ්ඩාර සර්ගෙන් රංගනය ඉගෙනගත්තා. පස්සේ චන්න විජේවර්ධන සර්ගේ චන්න උපුලි රංගායතනයෙන් අවුරුදු පහක් නර්තනය ඉගෙනගත්තා. පස්සේ නිරූපණ ක්ෂේත්‍රයෙත් කාලයක් හිටියා. ඒ දේවල් එක්ක රංගනයට පළපුරුද්ද හදාගන්නයි මට ඕන වුණේ.

**ඔබේ පෙනුම වෙනස්, කොණ්ඩේ එහෙම කපලා ඉන්න එක දිවාරාගේ ෆැෂන් එකද?**

මට දිග කොණ්ඩයක් තිබුණා. සැරයක් මම කොණ්ඩේ පිළිකා රෝහලකට දන් දුන්නා. ආයෙත් කවදාවත්ම මං කොණ්ඩේ වවන්නේ නෑ කියලා ඒ දෙනකොට හිතුවා. අදටත් මෙහෙම ඉන්නේ ඒකයි.

**ඔය පෙනුම රංගන ජීවිතයට අවාසියක් නෙවෙයිද?**

අවාසියක් වෙන වෙලාවලුත් ඉදිරියට ඒවි. ඒත් කොණ්ඩේ කපපු එකෙන් අවාසිවලට වඩා වාසි තමයි වැඩිපුර තියෙන්නේ. මට හේල්‍යන් එකට ආරාධනා ලැබුණෙත් මේ පෙනුම නිසානේ.

**ඉදිරියේදී කරන්න ආසා චරිතයක් එහෙම නැද්ද?**

දැන් ගොඩාක් නිළියෝ කැමති අහිංසක පෙම්වතියගේ චරිතය කරන්නනේ. හැබැයි මං නම් කැමති ක්‍රියාදාම නිළියක් වෙන්න.

**දිවාරා රංගනය පටන්ගත්තා විතරනේ. සීමාමායිම් එහෙම දාගන්නේ නැද්ද?**

ලැබෙන හැම චරිතයම බාරගන්න ඕනේ කියන තැන මම නැහැ. මට, මගේ වයසට ගැළපෙන හොඳ චරිත බාරගන්න තමයි කැමති.

**දිවාරාගේ අනාගත බලාපොරොත්තු මොනවද?**

මං දේශපාලනය කියන විෂයට හුඟාක් කැමතියි. ඒ පැත්තෙන් ඉදිරියට යන්නත් ආසාවක් තියෙනවා. ඒ වගේම කවදා හරි දවසක සම්මානලාභී නිළියක් වෙන්නත් බලාපොරොත්තුවක් තියෙනවා.

■ රුවන් එස්.සෙනවිරත්න









**'ජලනි ජයවර්ධන' යන නමින් හඳුන්වනවාට වඩා මුළු රටම ඇය ගැන දන්නේ 'ජලනි ප්‍රේමදාස' කී විටය. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාසගේ ආදරණීය බිරිඳ වන ඇය මතුයම් දිනෙක මෙරට පළමු කාන්තාව වෙයිද? යන කුකුස බොහෝදෙනෙකුට නැතුවාම නොවේ. නමුත් මේ කතාබහ ඒ කුකුස සංසිඳවීම වෙනුවෙන් කරන ලද එකක් නොවන බව කිව යුතුය. දේශපාලන පස මිතුරන් සජිත්-ජලනි යුවළට චෝදනා කරන්නට අවැසි විට ඔවුන්ට 'දරු මල්ලන් නැත' යන කරුණ මාතෘකාවක් කරගනියි. මේ කතාබහේදී ජලනි ඒ ගැන විවෘතවම කතා කළාය. එහිදී අපට මතක් වූයේ වරක් කාන්තාවන් වෙනුවෙන් පැවැති වැඩසටහනකදී වේදිකාව මත දිගහැරුණු රැඟුමක් දැක ඇ සංවේදී වූ ආකාරයයි. එදා එම රංගනය ඉදිරිපත් කෙරුණේ නීලා වික්‍රමසංහ ගැයූ 'දරුවෝ නැති අම්මාලා... දරු සුරතල් පෙන්නාලා...' ගීතයටය. ඉතින් ඒ වැටීම් නැගිටීම් මැද සජිත් සමඟ ගෙවන ජීවිතය ගැන ජලනි 'ධරණී'ට කී කතාවයි මේ...**



# 'ඔයාගෙ ජීවිතේ අනතුරේ දාලා මට දරුවෝ හදන්න ඕන නැහැ' කියලා සජිත් කිව්වා



-ජලනි ප්‍රේමදාස -



**ඔබේ දෙමාපියන් සහ පුංචි කාලය මතක් කරමින්ම අපේ මේ කතාබහ පටන්ගනිමු?**

හොඳයි. මගේ අම්මා හේමානි කෙහෙල්පන්නල. තාත්තා නිමල් ජයවර්ධන. අම්මයි තාත්තයි දෙන්නම ව්‍යාපාර ක්ෂේත්‍රයේ නියැලී සිටියේ. තාත්තා නම් දැන් ජීවතුන් අතර නැහැ. මට තව නංගි කෙනෙක් ඉන්නවා. මමයි නංගියි අධ්‍යාපනය ලැබුවේ කොළඹ බිෂොප් විද්‍යාලයෙන්. සාමාන්‍ය පෙළ විභාගය සමත් වෙලා උසස් පෙළ කරන්න මම ඔස්ට්‍රේලියාවට ගියා. උසස් පෙළ සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබුවේ ඔස්ට්‍රේලියාවෙදි.

**ඔස්ට්‍රේලියාවේ අධ්‍යාපන කටයුතු අවසන් කරලා ඇවිත් රැකියාවක් කළාද? නැත්නම් අම්මගෙයි තාත්තගෙයි ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ වුණාද?**

අපේ අම්මා ඉන්ටීරියර් ඩිසයිනර් කෙනෙක්. ඒ හා සම්බන්ධ ව්‍යාපාර කටයුතුවල තමයි අම්මා නියැලුනේ. ඔස්ට්‍රේලියාවේ අධ්‍යාපන කටයුතු අවසන් කරලා ඇවිත් මම අම්මගෙ ව්‍යාපාර කටයුතුවලට උදව් කළා. ඒ අතරේ තමයි මට සජිත්ව මුණගැහුනේ.

**සජිත්ව මුලින්ම දැකපු දවස මතකද?**

ඔව්. ඒක වුණේ මෙහෙමයි. මීට අවුරුදු විසිහතකට විසිඅටකට විතර කලින් එක්සත් ජාතික පක්ෂය වෘත්තියවේදීන්ගේ සංවිධානය නිර්මාණය කරනකොට අපේ අම්මා එහි ආරම්භක සාමාජිකාවක් වුණා. අම්මට එක්සත් ජාතික පක්ෂය සමඟ තිබුණු ඔය සම්බන්ධය නිසා රණසිංහ ප්‍රේමදාස මහත්තයගෙ ගුණසමරු පිංකමකට සුචරිතයට එන්න කියලා ආරාධනයක් ලැබුණා. ඒ ආරාධනය කරලා තිබුණේ සජිත්.

ප්‍රේමදාස මහත්තයගෙ ගුණසමරු පිංකම තිබුණු දවසෙම මගෙ මිතුරියකගේ උත්සවයකුත් යෙදිලා තිබුණා. ඒ නිසා අම්මා කිව්වා 'දෙන්නම එකම වාහනේ ගිහින් මාව සුචරිතයෙන් බස්සලා ඔයා යාළුවගෙ වැඩේට යන්න' කියලා. සුචරිතය ළඟට ආවහම අම්ම කිව්වා 'මෙතනටම ආපු එකේ වාහනයෙන් බැහැලා විනාඩි පහකට සුචරිතයට ගොඩවෙලා යන්න' කියලා. ඉතිං මම වාහනයෙන් බැහැලා අම්මත් එක්ක සුචරිතයට ගියා. ඒ වෙලාවෙ තමයි සජිත්ව මුලින්ම දැක්කේ.

**එදා සජිත් ඔබත් එක්ක කතාබහ කළාද?**

ඔව්. සජිත් මාත් එක්ක එදා කතා කළා. විනාඩි පහකට වාහනයෙන් බැස්ස මට අන්තිමේ පැය තුන හතරක් සුචරිතයේ ඉන්න වුණා. ඒ නිසා මගේ මිතුරියගේ උත්සවයත් මගහැරුණා.

**සජිත් එදාම ඔහුගෙ කැමැත්ත ඔබට ප්‍රකාශ කළාද?**

නැහැ. හැබැයි ඔහු මම ගැන උනන්දුයි කියන එක දැනුණා. එදා සජිත් මම කාගෙ කවුද කියලා අහලා තිබුණේ ගුණසමරු පිංකමට ඇවිත් හිටිය රෝසි සේනානායක මහත්මියගෙන්. ඇය සජිත්ට අපේ අම්මව පෙන්නලා මෙතුමියගෙ දුව කියල කියලා තිබුණා. සජිත් අපේ ගෙදර දුරකතන අංකය හොයාගෙන ගුණසමරු පිංකම තිබුණු දවසට පහුවදාම කතා කළා. ඔහුගෙ ඇමතුම මුලින්ම ගත්තෙ අපේ අම්මා.

සජිත් පළමු දුරකතන ඇමතුමේදිම අපේ අම්මට කියලා තිබුණා 'අම්මා මම ඔයාගෙ දුවට කැමතියි' කියලා. අම්මා එයට උත්තර දීල තිබුණෙ 'දුවගෙන් මේ ගැන අහන්න ඕන, එයාගෙ කැමැත්ත අකමැත්ත තමයි වැදගත්' කියලා. එහෙම කියලා අම්මා දුරකතනය මට දුන්නා. එතකොට සජිත් මාත් එක්ක ටිකක් වෙලා කතාබහ කරකර ඉදලා කිව්වා 'මම ඔයාට කැමතියි' කියලා.

**එයට ඔබේ ප්‍රතිචාරය වුණේ මොකක්ද?**

මම ඔහුට කිව්වා 'මට එකපාරටම කැමති වෙන්න බැහැ, අපි කතාබහ කරලා දැන හඳුනාගත්තට පස්සෙ තීරණයක් ගමු' කියලා. එහෙම කාලයක් කතාබහ කරලා දෙන්නට දෙන්නා දැන හඳුනාගෙන තමයි විවාහ වෙන්න තීරණය කළේ. අපි විවාහ වුණේ මුල්ම හඳුනාගැනීමෙන් අවුරුදු එකහමාරකට පස්සේ.

**ඔය කියන කාලය වෙනකොට සජිත් සක්‍රිය දේශපාලනයට යොමු වෙලාද?**

හම්බන්තොට දිස්ත්‍රික්කය මුල්කරගෙන සජිත් ඔය වෙද්දි දේශපාලන කටයුතු පටන් අරන් තිබුණේ. හැබැයි ඔය වෙනකොට ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නෙමෙයි. අපි විවාහ වෙනවා කියන තීරණය ගත්තට පස්සෙ සජිත් මට ඔහුගේ දේශපාලන අභිලාශයන් ගැන කිව්වා. දේශපාලනය කරද්දි මුහුණ දෙන්න වෙන අභියෝග සහ ප්‍රශ්න ගැනත් කිව්වා. මමත් ඒ දේවල් ගැන සෑහෙන කල්පනා කළා.

**මගේ සැලෝන් එකෙන් කොණ්ඩේ කැපුවත් සජිත් අනිවාර්යයෙන්ම බිල ගෙවනවා**

සජිත්ට අනාගතයෙදි දේශපාලනිකව මුහුණ දෙන්න වෙන ඕනෑම අභියෝගයකදි මට ඔහු ළඟ ශක්තිමත්ව ඉන්න පුළුවන් කියන විශ්වාසයෙන් තමයි විවාහ වෙන තීරණය ගත්තේ. අපි විවාහ වෙලා දැන් අවුරුදු විසිපහක්. ඔය අවුරුදු විසිපහේ සජිත් දේශපාලනිකව අභියෝග විශාල ප්‍රමාණයකට මුහුණ දීලා තියෙනවා. ප්‍රශ්නවලට මුහුණදීලා තියෙනවා. අපි දෙන්නා එක්ව ඒවාට මුහුණ දුන්න හැටි සිහිපත් වෙනකොට මම එදා ගත්ත තීරණය ඉතාම නිවැරදි බව දැනෙනවා.

**සජිත් නිතරම යාල ජාතික වනෝද්‍යානයේ කාලය ගතකරනවා අපි දකිනවා. ඔබ මුලින්ම යාල ගියේ සජිත් එක්කද?**

ඔව්. සජිත් එක්ක තමයි මම මුලින්ම යාල ජාතික වනෝද්‍යානය නරඹන්න ගියේ. දැනටත් ඉඩක් ලැබුණාහම මම සජිත් එක්ක යාල යනවා. ඒ ගහකොළ සතා සීපාවන් අතරේ කාලය ගත කරනකොට හිතට පුදුමාකාර නිදහසක් සහ සතුටක් දැනෙනවා.

**'ජාල් සැලෝන්' නමින් ඔබට ඔබගේම ව්‍යාපාරයක් තියෙනවා. දේශපාලනඥයකුගෙ බිරිඳ විදියට ඇයි ව්‍යවසායිකාවක් වෙන්න හිතුණේ?**

ව්‍යාපාරයක් ආරම්භ කරන එක කාලයක් තිස්සෙ මගෙ හිතේ තිබුණු දෙයක්. එහෙම හිතන්න ලොකුවටම බලපෑවේ මගේ දෙමාපියන්ගෙන් ලැබුණු ව්‍යාපාර පසුබිම. තමන්ගෙ සැමියා කුමන ක්ෂේත්‍රයක නියැළිලා සිටියත් මම හිතන විදියට ඕනිම බිරිඳක් තමන්ගේම ස්වාධීන ආර්ථික ශක්තියක් ඇතිකර ගන්න ඕනි. ඒ වගේම විවාහක වුණත් අවිවාහක වුණත් ඕනිම කාන්තාවක් තමන්ගේම අනන්‍යතාවයක් සහ ස්වාධීන ආර්ථික ශක්තියක් ඇතිකර ගැනීම වැදගත් කියලයි මම හිතන්නේ.

**ව්‍යාපාරය ආරම්භ කරද්දී සජිත් මොකද කිව්වේ?**

ජාල් සැලෝන් ආරම්භ කරද්දී මට ලොකුම ශක්තිය වුණේ මගේ සැමියා. 'ඔයාට මේ වැඩේ සාර්ථක කරගන්න පුළුවන්' කියලා සජිත් සෑහෙන්න මාව දිරිමත් කළා ව්‍යාපාරය පටන්ගනිද්දී. ව්‍යාපාරය පටන් අරන් දැන් අවුරුදු පහළොවක් වෙනවා. අදටත් මම ව්‍යාපාරිකව මුහුණ දෙන අභියෝගවලදී මට විශාල ශක්තියක් වෙන්නෙ සජිත්. තමන්ගෙ බිරිඳ ව්‍යවසායිකාවක් කියන එක ගැන මගේ සැමියට තියෙන්නෙ ලොකු ආඩම්බරයක්.

**සජිත් කොණ්ඩය කපාගන්න එන්නෙ ඔබේ සැලෝන් එකටද?**

ඔව්. ජාල් සැලෝන් ආරම්භ කරපු දවසෙ ඉඳන් ඔහු කොණ්ඩය කපන්නෙ එතැනින්.

**කොණ්ඩය කපාගත්තට පස්සෙ එයට අදළ බිල්පත ඔහුට දෙනවද?**

ඔව්. ඒ බිල්පතට අදළ මුදල ගෙවලා තමයි සජිත් පිටව යන්නේ. සැලෝන් එක ආරම්භ කරපු දවසෙම ඔහු කිව්වා 'කොණ්ඩය කපාගන්න මම මෙතැනට එන හැම අවස්ථාවකම ඊට අදළ බිල්පත මට දෙන්න, අනෙක් පාරිභෝගිකයන් වගේම මමත් බිල ගෙවලා තමයි යන්නෙ' කියලා.

**දෙන්නෙක් විවාහ වුණාට පස්සෙ දරුවන් හදනවද නැද්ද කියන දේ බොහොම පෞද්ගලික කාරණයක්. හැබැයි ඔබට දරුවන් නැහැ කියන කාරණය මත සජිත්ට දේශපාලනිකව ප්‍රහාර එල්ල කරන අවස්ථා තියෙනවා. කොහොමද ඒ දේවල් දෙන්නත් එක්ක දරාගන්නේ?**



ජලනි මෙසේ දණ නවාගෙන සිටින්නේ මහියංගණ රජ මහා විහාරයේදී මල්වතු පාර්ශ්වයේ අනුනායක දිඹුල්කුඹුරේ විමල ධම්ම හිමි ඉදිරිපිටය.

ඔය ප්‍රශ්නයට උත්තර දෙන්න කලින් මම ඔබට කියන්නම් අපි දරුවො හැදුවෙ නැත්තෙ ඇයි කියලා. දරුවෙක් පිළිසිඳ ගැනීම කියන කාරණයෙදි මම සෑහෙන සෞඛ්‍ය ප්‍රශ්නවලට මුහුණදීපු කෙනෙක්. දරුවෙක් හදනවා කියන මාර්ගයේ නොයන්න අපි තීරණය කළේ මට මුහුණ දෙන්න වුණු ඒ සෞඛ්‍ය ප්‍රශ්න නිසා. 'අපි දරුවෙක් නොහද ඉමු' කියලා මුලින්ම යෝජනා කළෙත් සජිත්. මොකද දරුවෙක් හදන්න ගන්න උත්සාහයකදි මගේ ජීවිතයට වුණත් අනතුරක් වෙන්න තිබුණා. 'ඔයා නැතුව මට දරුවෙක් අවශ්‍ය නැහැ' කියලා එද සජිත් කියපු දේ මගෙ හිතේ අදටත් තදින්ම තැන්පත් වෙලා තියෙනවා.

මගේ සෞඛ්‍ය ප්‍රශ්නයක් නිසා සජිත්ට දේශපාලනිකව ප්‍රහාර එල්ල කරනකොට මුලදි නම් මට සෑහෙන කණගාටුවක් ඇතිවුණා. හැබැයි පසුකාලීනව මම තේරුම් ගත්තා දරුවන් නැහැ කියන අතිශය සංවේදී කාරණය අල්ලගෙන අපට මඩ ගහන අයට මොනතරම් දුර්වල මානසිකත්වයක්ද ඇත්තෙ කියලා. එහෙම මඩ ගහන හැමෝම මව් කුසකින් බිහිවුණු අය. ඒ වගේම බිරිඳක්, සහෝදරියන්, දරුවන් ඉන්න අය. දරුවන් සම්බන්ධ කාරණය මුල්කරගෙන මටත් සජිත්ටත් මඩ ගහන අය තමන්ගෙ මවට, බිරිඳට, සහෝදරියන්ට සහ පොදුවේ කාන්තාවන්ට ගරු කරන අය නෙමෙයි කියලයි මම හිතන්නේ. අනෙක් අතට සජිත්ට කරන්න වෙනත් චෝදනා නැති නිසයි මෙවැනි මඩ ගහන්නේ.

**සජිත්ගෙ බිරිඳ විදියට ඔබ ඔහු තුළ දකින හොඳම ගුණාංගය මොකක්ද? ඒ වගේම දුර්වලම ගුණාංගය මොකක්ද?**

ඉවසීම තමයි මම ඔහුගෙන් දකින හොඳම ගුණාංගය. පුදුම විදියේ ඉවසීමේ හැකියාවක් සජිත්ට තියෙනවා. ඒ වගේම සජිත් අනෙයන් කෙරෙහි දක්වන ගෞරවය ගැනත් මම මෙතැනදි කියන්න ඕනි. ඒකත් ඔහුගේ බොහොම හොඳ ගුණාංගයක්. බෞද්ධ දර්ශනයෙත් දැක්වෙන්නේ තමන් උපමාකොට ගෙන අනෙයන්ට ගෞරව කරන්න කියලා.

දුර්වලම ගුණාංගය කියලා දෙයක් නම් මම සජිත්ගෙන් දකින්නෙ නැහැ. හැබැයි ඒ ගැන මෙහෙම දෙයක් කියන්න පුළුවන්. සජිත්ට හැම දෙයක්ම සියයට සියයක් අකුරට පිළිවෙලට තියෙන්න ඕනි. හැම වැඩකදිම ඔහු ඒක බලාපොරොත්තු වෙනවා. සජිත්ගෙ දුර්වලතාවයක් විදියට මට කියන්න පුළුවන් ඔය කාරණය තමයි.

**ප්‍රසිද්ධියක් නැතිව ඔබ බොහෝ ආගමික කටයුතු කරන බව කියවෙනවා. මොනවද එහෙම කරන පිංකම්?**

තිස්සමහාරාම රජමහා විහාරයෙන් ආරම්භ කරලා මේ වෙනකොට මම කඨින පිංකම් විස්සක් කරලා තියෙනවා. මම කඨින පිංකමකට දායක වෙන්නෙ එයට සමගාමීව කඨින පිංකම කරන විහාරස්ථානය දියුණු කරන වැඩසටහනකුත් එක්ක. ඒ විදියට විහාරස්ථාන විස්සක් මේ වෙනකොට දියුණු කරලා තියෙනවා. කොවිඩ් වසංගතයෙන් පස්සෙ මුලින්ම කඨින පිංකම කළේ තන්තිරිමලය රජමහා විහාරස්ථානයේ. ඊටපස්සෙ මහියංගණය රජමහා විහාරයේ කඨින පිංකම කළා. මේ අවුරුද්දෙ මම සෝමාවතිය රජමහා විහාරස්ථානයේ කඨින පිංකම කරනවා.

කඨින පිංකම් හැරුණු විට මම තවත් ආගමික සහ සමාජ සත්කාර රැසකට දයක වෙලා තියෙනවා. සජිත් විපක්ෂ මන්ත්‍රීවරයෙක්ව ඉන්නකොට විහාරස්ථානවලට උදව් කරපු 'සසුනට අරුණ' වැඩසටහන සම්බන්ධීකරණය කළේ මම. එයට අමතරව බොහෝ ස්වාමීන්වහන්සේලාගෙන් ලැබුණ ඉල්ලීම් අනුව උන්වහන්සේලාගේ විහාරස්ථානවලට මම හැකි පමණින් උදව් කළා. අදටත් කරනවා. මගේ මේ බෞද්ධාගමික කටයුතු අගයන්න ත්‍රෛනිකායික මහා සංඝරත්නය පසුගිය දිනක 'ශ්‍රී සුගත සාසන ප්‍රසාදිණී' නමින් ගෞරව නාමයක් මට ප්‍රදානය කළා. ඒ වෙලාවෙ තමයි බොහෝදෙනෙක් දැනගත්තෙ මම කරන මේ ආගමික කටයුතු ගැන. ප්‍රසිද්ධියක් නැතිව නිහඬව මේ දේවල් කරන්න තමයි මම කැමති.

**සජිතුයි ඔබයි දෙන්නම බොහොම කාර්ය බහුල ජීවිත ගත කරන්නේ. ඒ කාර්ය බහුලත්වය අතරේ සිංදුවක් අහන්න, පොතක් පතක් කියවන්න, චිත්‍රපටයක් බලන්න වගේ දේවල්වලට දෙන්නත් එක්ක වෙලාවක් වෙන්කර ගන්නවද?**

සජිත් කොළඹ ඉන්න හැම දවසකම වගේ අපි දෙන්නා අපි දෙන්නා වෙනුවෙන් දවසට අඩු තරමින් පැය බාගයක් හරි වෙන්කර ගන්නවා. ඒ වෙලාවට අපි ගීත අහනවා. සමහර වෙලාවට සජිත් පියානෝ එක ප්ලේ කරනවා. පොත්පත් සඟරා වගේ දේවල් කියවනවා. සතියකට දෙකකට සැරයක් ෆිල්ම් එකක් බලන්නත් වෙලාව හදගන්නවා. හොඳටම කාර්යබහුල දවස්වලට දවල් කෑම ගන්න වෙලාවට සජිත් මට එන්න කියනවා එයත් එක්ක කෑම ගන්න.

**ඉතිං අවසන් වශයෙන් ඔබෙන් ප්‍රශ්න දෙකක් අහන්න කැමතියි. එයින් පළමුවැනි එක තමයි දෙදහස් දහනමයේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනවා කියලා සජිත් ඔබට කියපු වෙලාවේ ඔබ මොනවද ඔහුට කිව්වේ?**

සජිත් ඒ වෙලාවෙ බාරගත්තෙ සුවිශාල අභියෝගයක්. මොකද මහ බැංකු බැඳුම්කර සිද්ධිය, පාස්කු ප්‍රහාරය ඇතුළුව එවකට පැවැති ආණ්ඩුවට එල්ල වුණු සියලු චෝදනා එක්කයි සජිත්ට ජනාධිපතිවරණ සටන කරන්න වුණේ. අනෙක් අතට සජිත්ට අපේක්ෂකත්වය ලැබෙනකොට ප්‍රතිවාදී ප්‍රධාන අපේක්ෂකයා ඔහුගේ ජනාධිපතිවරණ කැම්පේන් එක පටන් අරන් සැලකියයුතු කාලයකුත් ගෙවී තිබුණා. ඔය කාරණා නිසා මම සජිත්ට කිව්වා 'ඔයා බාර අරන් තියෙන්නෙ ලේසිපහසු අභියෝගයක් නෙමෙයි, අවසානයේ මොන ප්‍රතිඵලය ලැබුණත් මම ඔයාගෙ ළඟින්ම ඉන්නවා' කියලා.

**ජනාධිපතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කරන්න මැතිවරණ දෙපාර්තමේන්තුවේ පවත්වපු මාධ්‍ය හමුවෙදි ඔබ සජිත් ළඟින්ම ඉන්නවා අපි දැක්කා. ජනාධිපතිවරණය පරාජය වුණු බව දැනගත්තහම මොනවද ඔබ ඔහුට කිව්වේ?**

මම මුලින්ම කිව්වෙ ඉතා ඉක්මනින් නැවත දේශපාලන කටයුතු පටන් ගන්න කියලා. 'මේක පරාජයක් නෙමෙයි ලක්ෂ පනස් පහකට වැඩි ජනතාවක් ඔයා ගැන විශ්වාසය තියලා තියෙනවා, ඒ නිසා දේශපාලනයේ ඉදිරි ගමනට ලෑස්ති වෙන්න' කියලත් කිව්වා. ඒ විතරක් නෙමෙයි, රටේ බහුතර ජනතාව විශ්වාසය තියලා තියෙන නායකයාට වැඩ කරන්න පුළුවන් පරිමාව ඉදිරියේදී දැකගත හැකිවනු ඇති බවත්, ඒ අනුව මුළු රටම ඉක්මනටම සත්‍ය වටහාගනු ඇති බවත් මම සජිත්ට කිව්වා. එද මම කියපු දේ අද ඇත්ත වෙලා තියෙනවා. හැබැයි ඒ ගැන මම සතුටු වෙන්නෙ නැහැ. මොකද දෙදහස් දහනමයේ ජනාධිපතිවරණ ප්‍රතිඵලය නිසා රටටත් ජනතාවටත් ගෙවන්න වෙලා තියෙන වන්දිය අතිවිශාලයි.

■ හසිත කුරුප්පු



කොමලිගෙ කොලම

**ප්‍රශ්නය**

| | |
|---|---|
| කොමලියේ කැතයි ඔබෙ ඇමතුම්වි | ලාසය |
| මම අද තැවෙමි පිදු පෙම ගැන තෙමා | ලය |
| අභිසෙස් කළා නම් මගේ ලොව ලබා | ජය |
| නිසැකයි උරුම මට මතු දින | වියෝගය |

කුසුම් එදිරිසිංහ
පැල්පිටියේ, ඇහැලියගොඩ

**පිළිතුර**

| | |
|---|---|
| වචනයකට උරණ වීලා ඇයි | ඔහොම |
| මට නම් නුඹ තමයි ඇති මිතුරිය | පරම |
| ලැබුණොත් මතු දිනෙක හමුවන්නට | වරම |
| පෙන්නම් පපුව පලලා හිත හොඳ | තරම |

**ප්‍රශ්නය**

| | |
|---|---|
| ජීවිතේ දිගු ගමනෙ කටු අකුල් | තැනේවිද |
| කටොර මැද රිදෙන සිත පවනටත් | සැලේවිද |
| පහන් සිල සේ දිවිය කෙදින හෝ | නිවේවිද |
| කොමලියේ මගෙ කවිය මං කොහොම | ලියාවිද |

නුවන්ති හංසිනි උත්පලා
සඳලංකාව

**පිළිතුර**

| | |
|---|---|
| පහන්සිල සේ දිවිය කෙදින හෝ | නිවේවි |
| නුඹ නැතත් කවුරු හෝ එදින කවි | ලියාවි |
| කටු අකුල් මගහැරන් යන මගේ | දයාවි |
| මැරෙනකන් අපි ඉඳිමු සිත තුටින් | සිනාවී |

**ප්‍රශ්නය**

| | |
|---|---|
| කවි පද පබැඳුමෙන් ගුරු බුහුමන් | ලැබුව |
| කිවිඳිය ඔබයි කවි රස හැමටම | බෙදුව |
| පිළිතුර කිමද කොමලියෙ පැනයට | අනුව |
| කවුරුද ගුරුන් කවියට අත් පොත් | තැබුව |

අනුර දිසානායක
වැලිවේරිය, ගම්පහ

**පිළිතුර**

| | |
|---|---|
| තබා ගනු එපා මේ ගැන | විචිකිච්ඡා |
| කවියට අත්පොත් තැබුවෙ නම් අපෙ | අප්පොච්චා |

**කොමලිගේ කොලම වෙත කවි පැන එවීමේදී**
**පද පේළි 4කින් යුත්**
**එක් කවියක් පමණක්**
**යොමු කිරීමට කාරුණික වන්න.**

**ඔබේ කවි අභියෝග**
කොමලිගේ කොලමට එවීමේදී 0712808985 හෝ dharanee.editor@liberty.lk යන ඊමේල් ලිපිනයට යොමු කරන්න.නැතිනම්, කොමලිගෙ කොලම, ධරණී පුවත්පත, නො.91, විජේරාම මාවත, කොළඹ 07. යන ලිපිනයට එවන්න



එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මෙරට හිටපු අග්‍රාමාත්‍යවරයා ඝාතනය ලෝකයේම අවධානයට ලක්වූවකි. දේශපාලනය, යුක්තිය පසිඳලීම හෝ ලෝක ඉතිහාසය සැලකුවද එය දැඩි සේ කතාබහට ලක්වන්නක් බවට විවාදයක් නැත. පසුගිය සතියේ එම සිදුවීමේ පළමු කොටස පළකෙරිණ. අද මෙම ලිපියෙන් බණ්ඩාරනායක ඝාතනය පිළිබඳ තවත් තොරතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. නීතිය සම්බන්ධව දැනුවත් කිරීමේ ඉදිරි පෙළ චරිතයක් ලෙස සැලකෙන ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න අද දිනයේද තොරතුරු ඉදිරිපත් කරයි. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකි. අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස හෙතෙම වසර තුනක කාලයක් කටයුතු කළේය. ඔහු අපරාධ විද්‍යාව හා යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද ව්‍යවහාරික විද්‍යාවන් සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් උපාධියක්ද ලබා ඇත. බ්‍රිතාන්‍ය මණ්ඩලය ප්‍රදානය කළ චෙවනින් (Chevening) ශිෂ්‍යත්වයක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ෆුල්බ්‍රයිට් ආයතනයෙන් පිරිනැමූ හියුබට් හම්ෆ්‍රී (Hubert Humphrey) ශිෂ්‍යත්වයක්ද දිනා ඇත. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, රගර් ක්‍රීඩක ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී සිදුවීම් ගණනාවක නඩුවල පැමිණිල්ල මෙහෙයවීමට දායක වූ ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න නීතියට අදාළව දක්වන අදහස් මෙරට නීති ක්ෂේත්‍රයේ මෙන්ම ඉන් පරිබාහිර තැනැත්තන්ටද වටී. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු 'යළි මැවෙන අපරාධයක්' නමින් ග්‍රන්ථයක්ද රචනා කළේය. එහි සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ.

25 කොටස

# පෝරකයට යන්නට සෝමාරාම සිවුර ගලවලා



## *සෙනෙවිරත්නට ඇසුණු වෙඩි හඬ කුමක්ද?

අගමැති බණ්ඩාරනායකගේ අත්සන ගැනීමට චරිත සහතිකය සකස් කරගැනීම සඳහා සෙනෙවිරත්න කන්තෝරු කාමරයට ගියේය. ඒ අතරවාරයේ අග්‍රාමාත්‍යවරයා පිටතට පැමිණියේ භික්ෂූන් වහන්සේ දෙනමක් වැඩ සිටි බැවිනි. හෙතෙම ආනන්ද හිමියන්ට පළමුව වැන්දේය. පසුව අගමැතිවරයා සෝමාරාම හිමියන්ට වැඳීමට සැරසුණේය. එකෙනෙහිම සෝමාරාම හිමියෝ අසුනෙන් නැගී සිටියහ. යමකු වඳින විට භික්ෂුවක අසුනෙන් නැගිටින්නේ නැත. එනිසාම ආනන්ද හිමියන්ටද එම හැසිරීම ප්‍රහේලිකාවක් විය. අසුනෙන් නැගී සිටි තල්දූවේ සෝමාරාම මදක් ඉදිරියට පැමිණ සිවුරේ සඟවා ගෙන සිටි ගිනිඅවියක් පිටතට ගද්දී අවට සිටි කිසිවකුට කළ යුත්තක් සිතා ගත නොහැකි විය. ඉන් එල්ල වූ වෙඩි උණ්ඩයක් අග්‍රාමාත්‍යවරයාගේ වම් අතේ මැණික් කටුවට වැදිණ. එවිට අගමැතිවරයා නිවස දෙසට දුවන්නට වූයේය. එම අවස්ථාවේ තල්දූවේ සෝමාරාම හිමිගේ අවධානය යොමුවූයේ සෙසු පිරිස වෙතයි. තුවක්කුව ආනන්ද හිමි වෙතටද එල්ල කෙරුණද කොකා ගැස්සුණේ නැත. එහෙත් එහි වූ ගුණතිලක නම් අයෙකුට වෙඩි පහරක් එල්ල විය. හෙතෙම "බුදු අම්මෝ" කියමින් බිම ඇද වැටුණේය. අනතුරුව තල්දූවේ සෝමාරාම හිමි අගමැති පසුපස දිව යද්දී ආනන්ද හිමියෝ ගේට්ටුවේ රාජකාරි කළ ආරක්ෂක නිලධාරියා වෙත ගියහ.

**"මළ ඉලව්වේ, ඔහේ ඔතන ඉන්නවා. අරෙහෙ අගමැතිට වෙඩි තියනවා."**

පොලිස් කොස්තාපල් සමරකෝන්ට ආනන්ද හිමියෝ කීහ.

## තුවාලකරුයි සැකකරුයි මැතිණිගෙ දෑතේ

මේ අතරවාරයේ සෝමාරාම හිමි අගමැති පසුපස දිව ගොස් තවත් වෙඩි පහර එල්ල කරද්දී අවට වූවෝ චීවරධාරියා අල්ලා ගත්හ. කන්තෝරු කාමරයේ සිටි සෙනෙවිරත්න පිටතට පැමිණියේ ඒ අතරයි. ඔහු වෙඩි තැබීම දුටුවේ නැත. සෙනෙවිරත්න දුටුවේ පිරිසක් චීවරධාරියකු අල්ලා ගෙන සිටිනවා පමණි. ආනන්ද හිමිගේ පණිවිඩය අනුව එතැනට පැමිණි පොලිස් කොස්තාපල් සමරකෝන් තල්දූවේ සෝමාරාම හිමිට වෙඩිල්ලක් එල්ල කළේය. එය සැකකරුගේ පාදයකට වැදිණ. මේ සිදුවීම වෙද්දි අග්‍රාමාත්‍ය බිරිය සිරිමාවෝ බණ්ඩාරනායක සිටියේ මල් පැලවලට වතුර දමමිනි. ඇය එක් අතකින් තුවාල ලැබූ සිය සැමියා අල්ලා ගත්තාය. අනෙක් අතට සැකකාර චීවරධාරියාගේ සිවුර ග්‍රහණය කළාය. එම අවස්ථාවේ සැකකරු පලා යාමට සැරසුණේය. එවිටම වාගේ එතැනට පැමිණි හේමා දබරේ සැකකරු බිම දැම්මාය. ගිනිඅවියද බිම වැටිණ. පොලිස් නිලධාරියා එය නිසි පරිදි තමන් බාරයට ගත්තේය.

**"මට ගහන්න එපා. මං ඔක්කොම කියන්නං"**

යනුවෙන් සැකකරු කෑ ගැසුවේ අවට පිරිසගේ කෝපය ඉහ වහා යමින් තිබියදීය. සැකකරු පිරිසගේ පහරදීමට ලක්වන අතර ආනන්ද හිමියෝද එතැනට පැමිණ චීවරධාරියාට සෙරෙප්පුවකින් දමා ගැසූහ. ඒ, සිවුරක් දරමින් හිඳ කෙරූ ක්‍රියාවෙන් ශාසනය අපකීර්තියට ලක් වූ බවට චෝදනා කරමිනි.

## අගමැති රෝහලට

අගමැතිවරයාගේ සිරුරේ වෙඩි පහරවල් කිහිපයක් තිබිණ. කඩිනමින් ඔහු රෝහල්ගත කිරීමට පියවර ගැනුණේ විනාඩියක පමාවද අනුචිත බැවිනි. වෛද්‍ය ඇන්තනීස් තුවාලකරු බාරව සිටියේය. රෝහල්ගත කරන විට බණ්ඩාරනායක අගමැති සිටියේ යහපත් සිහියෙනි. ඔහු හොඳින් අදහස් හුවමාරු කරගැනීමට සමත් විය. එහෙත් තමාට වෙඩි තැබූ තැනැත්තා පිළිබඳ ඔහු වෛරීසහගතව කතා නොකළේය.

**"මේක ලොකු දෙයක් නෙමේ. මං හොඳින් ඉන්නවා. මට වෙඩි තිබ්බේ චීවරය දරාගත් මෝඩ මිනිහෙක්."**

හෙතෙම පැවසීය. එමෙන්ම රටේ ජනයා ප්‍රකෝප නොවන පරිදි තත්ත්වය පාලනය කරන ලෙසද ඔහු අදාළ පාර්ශව වෙත උපදෙස් දුන්නේය. තමා ඉක්මනින් සුවය ලබා පැමිණෙන බව බණ්ඩාරනායක මැතිනියට සහ දරුවන්ට දැනුම් දෙන ලෙසද ඔහු ඉල්ලීය. අග්‍රාමාත්‍යවරයාට පැය ගණනක ශල්‍යකර්මයක්ද සිදුකෙරිණ. සැත්කමේ අතරමගදී අග්‍රාමාත්‍යවරයාගේ හෘද ක්‍රියාකාරීත්වය නැවතී ගියේය. එහිදී හෘද රෝග විශේෂඥයකු ගෙන්වා කැපුමකින් හෘදය විවර කර සම්බාහනය කිරීමට හදිසි තීරණයක් ගෙන තිබේ. නැවත හෘදය පණ ගැන්වීමට දැඩි පරිශ්‍රමයකින් පසු වෛද්‍යවරු සමත් වූහ. පිටතින් යහපත් ලෙස සිටියද ඔහුගේ අභ්‍යන්තර තත්ත්වය කිසිසේත් සතුටුදායක වූයේ නැත. ඔහු ජාතිය ඇමතුවේද සැත්කමින් අනතුරුවය. වෛද්‍ය ඇන්තනීස් අවස්ථා කිහිපයකදීම අගමැති ජාතිය ඇමතීමට දැඩි විරෝධය පළ කළේය. එහෙත් අගමැති බණ්ඩාරනායක ක්‍රියා කළේ වෛද්‍ය උපදෙස් පවා නොතකමිනි.

**"කහ චීවරයකින් සැරසුණු මෝඩ පුද්ගලයෙක් මට වෙඩි තිබ්බා. මම සියලුදෙනාගෙන් ඉල්ලනවා ඔහු කෙරෙහි දයානුකම්පාවෙන් කටයුතු කරන ලෙස. ඔහුගෙන් වෛරීසහගත ලෙස පළිගැනීමට උත්සාහ කරන්න එපා. මේ තීරණාත්මක අවස්ථාවේදී ඉවසීමෙන් කටයුතු කරන්න කියලා මගේ රටවැසියන්ගෙන් මං ඉල්ලනවා. වෛද්‍යවරුන්ගේ සහාය ඇතිව සුවය ලබා තවදුරටත් මගේ සේවය රටට ලබාදීමට මගේ උපරිම ප්‍රයත්නය දරනවා."**

ජාතිය අමතා කතා කිරීම පවා ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීමට හේතු වූවා විය හැක. නොඑසේනම් ඔහුට ජීවත්වීමේ කාලය දිගු වීම ජාතිය ඇමතීම වෙනුවෙන්ම සොබාදහමෙන් ලද අවස්ථාවක් වීමට ඉඩ තිබේ. අවසානයේ සියලු උත්සාහ ව්‍යර්ථ කරමින් එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක අගමැතිවරයා 1959 සැප්තැම්බර් 26 වනදා උදෑසන මෙලොව හැර ගියේය.

## වරදකරුවන්ට දඬුවම්

අගමැතිවරයා මියයාමෙන් අනතුරුව මාපිටිගම බුද්ධරක්ඛිත, ජයවර්ධන සහ තල්දූවේ සෝමාරාම ආදී පිරිසකට

# ට පෙර



## සැත්කම අතරමඟදී හදවත නතර වෙලා. ඊටපස්සේ කරලා තියෙන්නේ හදවත අතට අරගන්නවා වගේ වැඩක්

එරෙහිව අගමැති බණ්ඩාරනායක ඝාතනය සම්බන්ධයෙන් නඩු පැවරිණ. අගමැති ඝාතනය සම්බන්ධව චෝදනා ලැබුවේ තල්දූවේ සෝමාරාම භික්ෂුව පමණි. සෙසු අයට කුමන්ත්‍රණ චෝදනා පැවතිණ. සිදුවීමේ පරීක්ෂණ කටයුතු සඳහා ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ පරීක්ෂකවරුද මෙහි පැමිණ සිටියහ. සෝමාරාම භික්ෂුවට එරෙහිව සාක්ෂි කිහිපයක්ම තිබිණ. ඇසු දුටු සාක්ෂිද ඒ අතර විය. එහෙත් අසල්වැසි නිවසක මුළුතැන්ගෙයක සේවිකාවකගේ සාක්ෂියක් වෙනස් මුහුණුවරක් ගෙන තිබිණ. ඈ පැවසුවේ අගමැති නිවසේ තාප්පයෙන් පැනගත් අයෙකු "හරි මචං" යැයි පවසා එතැන නවතා තිබූ සුදු පැහැති මෝටර් රථයක නැගී ගිය බවයි. එහෙත් විත්තිකරුවන්ට එරෙහි චෝදනා බැහැර කිරීමට එය ප්‍රමාණවත් නොවීය. අගමැතිවරයාට වෙඩි තැබූ ගිනි අවිය බුද්ධරක්ඛිත හිමිට ලබා දී ඇත්තේ පොලිස් නිලධාරියෙකි. එය ඔහු ලබාගෙන ඇත්තේ ඔසී කොරයා නමැති නමගිය පාතාල සාමාජිකයෙකුගෙනි. ඔහු අධිකරණයේදී සිය ගිනිඅවියද හඳුනාගෙන තිබේ. අවසානයේ තල්දූවේ සෝමාරාම භික්ෂුව බණ්ඩාරනායක ඝාතනය සම්බන්ධයෙන් වරදකරු කොට අධිකරණය විසින් මරණීය දණ්ඩනය පනවන ලදී. මාපිටිගම බුද්ධරක්ඛිත හිමි සහ ජයවර්ධන ඝාතන කුමන්ත්‍රණයට වරදකරුවන් වී ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලැබූහ. ඒවාට එරෙහි අභියාචනාද සාර්ථක වූයේ නැත.

### සිවුර අතහැර කිතුණු දහමට

තල්දූවේ සෝමාරාම භික්ෂුව මරණ දණ්ඩනයට සති දෙකකට පෙර සිවුර අතහැර තිබේ. මරණයට දින දෙකකට පෙර කිතුනුවකු ලෙස ඔහු බෞතීස්ම ලැබීය. ඒ බොරැල්ල ශාන්ත පාවුළු දෙව්මැදුරේ පාලකයාව සිටි මැතිව් පීරිස් දේවගැතිවරයා මගිනි. මැතිව් පීරිස් ද පසුකාලීනව සිය බිරිය වන ඉයුජීන් සහ පෙම්වතිය වූ ඩැල්රීන්ගේ සැමියා රසල් ඝාතනය සම්බන්ධව වරදකරු වූවෙකි. 1962 ජූලි 06 වනදා තල්දූවේ සෝමාරාමට එරෙහි මරණ දඬුවම ක්‍රියාත්මක වූයේ වැලිකඩ බන්ධනාගාරයේදීයි. බුද්ධරක්ඛිත හිමි සිරගතව සිටිය දීම අපවත් වූහ. ජයවර්ධන නියමිත කාලය සපිරීමට කෙටි කලක් ඉතිරිව තිබියදී නිදහස ලැබීය. ජීවිතය ඇතැම්විට දෛවෝපගතය. එස්. ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක අගමැති ධුරයට පත්වූයේ සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු පංච මහ බලවේග මගිනි. එහි පළමු බලවේගය මගින් ඔහුට වෙඩිපහරක් එල්ල වේයැයි ඔහු කිසිදු සිතන්නට නැත. එමෙන්ම බලයට පැමිණි වහා හෙතෙම එල්ලා මැරීම අහෝසි කළේය. එහෙත් ඔහුගේ ඝාතනයෙන් පසු මරණ දඬුවම නැවත නීතියට එක් විය. එහිදී ඝාතන කුමන්ත්‍රණය සඳහා මරණ දඬුවම පැමිණවීම අතහැරී තිබේ. සෝමාරාම භික්ෂුවට පමණක් මරණ දඬුවම හිමි වී බුද්ධරක්ඛිත හිමිට සහ ජයවර්ධනට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් හිමිවූයේ ඒ අනුවයි. මරණ දඬුවම අහෝසි කළ අගමැතිවරයා ඝාතනය කළ තැනැත්තාට අවසානයේ මරණ දඬුවම හිමිවිය. එය ජීවිතයේ ස්වභාවයයි.

**සති 25ක් පුරා 'ධරණී' පාඨක ඔබ වෙනුවෙන් රචිත මෙම ලිපි මාලාව මෙරට නීති ක්ෂේත්‍රයේ වැදගත් සිදුවීම් ආශ්‍රයෙනි. එම සිදුවීම් මෙන්ම නීතියේ පසුබිම පිළිබඳ ඔබේ දැනුම ඉහළ නැංවීමට මෙම ලිපි හේතු වන්නට ඇතැයි අපි විශ්වාස කරමු. ඕනෑම කතාවක් නැවතීමට කාලයක් පැමිණෙයි. නැවතුමක් යනු නව ඇරඹුමකි. නැවුම් මුහුණුවරකින් යළි දිනෙක හමුවෙමු. එතෙක් ඔබට ආයුබෝවන්!**

■ නීතිඥ රෂ්නිකා ලියනගේ

ලෝකේ ඉස්සරහා ලංකාවට කිරුළු පළඳවාපු රූප රාජිනියෝ කිහිපදෙනෙක්ම ඉන්නවා. ඒ වගේ තවත් සුන්දර රූප රාජිනියක් ලෝකෙම පරාද කරලා පහුගිය ජූලි 22දා අපේ රටට ජයග්‍රහණයක් අරගෙන ආවා. 2023 ජාත්‍යන්තර විවාහක මිහිකත රැජින කිරුළ ලංකාවට හිමිකරලා දුන්නු ඇගේ නම තමයි සශ්මි දිසානායක. එම කිරුළ ලංකාවට හිමිවුණු පළවැනි අවස්ථාව මේක කියන එකත් බොහොම සතුටෙන් මතක් කරන්න ඕනේ.

ජාත්‍යන්තර විවාහක මිහිකත රැජින තරඟාවලිය ආරම්භ වුණේ 2001දී. සොබාදහම එක්කලා බැඳෙන කාරණා සලකලා තමයි මේ තරඟයේ ජයග්‍රාහිකාවන් තෝරන්නේ. සශ්මි කියන්නෙත් අම්පාර පැත්තේ ලස්සන ගමක හැදුනු ලස්සන තරුණියක්. ඉතින් පුංචි කාලේ ඉඳලා පරිසරයට තිබුණු ලැදියාව මේ කිරුළ ලබාගන්න හේතුවෙන්න ඇති කියලයි සශ්මි අපිත් එක්ක කිව්වේ. ඉතින් මේ දිගහැරෙන්නේ අද 'ධරණී' කවරය සරසන සුන්දර මිහිකත රැජින එක්ක අපි කරපු කතාබහේ සටහනයි.



# මම හෙයාඩ්‍රෙස් එක අරගෙන එන්න ගිය ටිකට කවුදෝ මගේ සපත්තුවේ පටිය කපලා

## සශ්මි දිසානායක

### ජාත්‍යන්තර විවාහක මිහිකත රැජින 2023

"අයියයි, මායි, අම්මයි, තාත්තයි තමයි මගේ පවුලේ ඉන්නේ. පුංචි කාලේ ඉඳලා මම ෆැෂන්වලට ආසයි කියලා අම්මා කියනවා. තේරෙන කාලේ ඉඳලම මම අම්මගේ ලිප්ස්ටික් ගාගෙන, හීල්ස් දාලා කණ්ණාඩිය ඉස්සරහට ගිහිල්ලා එක එක විදියට හැරිලා බලනවලු."

සශ්මි නිරූපණ ක්ෂේත්‍රය පැත්තෙන් ලොකු ගමනක් යයි කියලා සශ්මිගේ අම්මා ඒ කාලෙම අනාවැකි කියලා තියෙනවා.

**"යමක් කමක් තේරෙන කාලේ ඉඳලා මට ඕන වුණේ නිරූපණ ක්ෂේත්‍රයෙන් ඉස්සරහට යන්න. ලොකු වෙලා මොනවද කරන්න කැමති කියලා පොඩි කාලේ කවුරුහරි මගෙන් ඇහුවහම මම කියන්නේ හීල්ස් දාගෙන ඇවිදන අක්කා කෙනෙක් වෙනවා කියලලු. ගම අම්පාර වුණාට මම ඉස්කෝලේ ගියේ නුවර ගේට්වේ ජාත්‍යන්තර පාසලට. සාමාන්‍ය පෙළට වෙනකල් ඉගෙනගෙන පුද්ගලික උසස් අධ්‍යාපන ආයතනයකින් වැඩිදුරට ඉගෙනගත්තා. පස්සේ මම නිරූපණය ඉගෙනගන්න හොඳ තැනක් හෙව්වා. එතකොට තමයි රුක්මාල් සේනානායක සර් ගැන දැනගත්තේ."**

පස්සේ සශ්මි එතැනින් නිරූපණය ඉගෙනගත්තලු. හැබැයි ඒ වෙනකොටත් රූ රැජින තරඟයකට සහභාගීවෙන්න ඇයට අදහසක් තිබිලා නෑ.

"ටික කාලයක් ඉගෙනගන්නකොට මේ පැත්තෙනුත් මට ඉස්සරහට යන්න පුළුවන් කියලා මට තේරුණා. පස්සේ තමයි රූ රැජින තරඟයකට අයදුම් කරන්න හිතුවේ. මම පුංචි කාලේ ඉඳලා පරිසරයට ලැදි කෙනෙක්. ගහකොළට හරිම ආදරෙයි. ඉතින් මට ගැළපෙනම පැජන්ට් එක මිහිකත පැජන්ට් එක කියලා තේරුණා. මම විවාහක නිසායි විවාහක අංශයේ තරඟාවලියට සහභාගී වුණේ. මුලින්ම ලංකාවේ පැවැත්වෙන ලෝකල් පැජන්ට් එකට අයදුම් කළා. ඒ තරඟේ තිබුණේ ගිය අවුරුද්දේ. එතැනත් තරඟකාරියෝ 35ක් විතර හිටියා. ඒ තරඟයට යනකොට මම ගොඩක් ලෑස්ති වුණා. ඒ සූදානම එක්ක අනිවාර්යයෙන්ම ජයග්‍රහණය කරනවා කියන විශ්වාසය මට තිබුණා. හිතුවා වගේම මම තරඟය දිනුවා. ඒත් එක්ක තමයි මට ජාත්‍යන්තර තරඟයට යන්න අවස්ථාව ලැබුණේ."

ජාත්‍යන්තර විවාහක රූ රැජින තිබුණේ පිලිපීනයේ මැනිලා නුවර. ජපානය, ඇමරිකාව, පිලිපීනය, නයිජීරියාව ඇතුළු රටවල් 45ක සුරූපිණියන් 45ක් තරඟයට සහභාගී වෙලා හිටියා.

**"මේ තරඟෙටත් මම ගොඩක් ලෑස්ති වුණා. ඒ සූදානම එක්ක මට මගේ ගැන ලොකු විශ්වාසයක් තිබුණා. හැබැයි එහෙම ගියාට තරඟකාරියෝ දැක්කහම හිතට ලොකු චකිතයක් ආවා. එයාලත් හරි ලස්සනයි. මට වඩා උස අයත් හිටියා. ඒත් ඉතින් මම වැටුණේ නැහැ. මට කරන්න තිබුණු වැඩ කොටස හරියට කළා."**

බැලූ බැල්මට කිරුළක් දාගෙන ඉන්න එක ලේසි පහසු වැඩක් වගේ පෙනුණාට කිරුළක් ලබාගන්න කරන්න වෙන කැපකිරීම් අසීමිතයි කියලයි සශ්මි අපිත් එක්ක කිව්වේ.

"උදේ 6ට නැගිටලා පුරුදු වෙන්න ගියාම ගෙදර යද්දි පාන්දර 2යි. කකුල්වලින් ලේ එනකල් උස සපත්තු දාගෙන කැට් වෝක් කරලා තියෙනවා. මොකද රූ රැජිනකගේ කැට් වෝක් එකේ පොඩි හරි අඩුවක් තියෙන්න බැහැ. ටැලන්ට් පුරුදු වෙද්දි ඇඟවල් තැලෙනවා. ඒවගේම ජිම් යන්න ඕනේ. මොකද ෆිගර් එක මේන්ටේන් කරන එක අංක එක. කන බොන දේ වුණත් කරන්නේ ඩයට් ප්ලෑන් එකකට. අනිත් දේ රූ රැජිනක් වෙන්න හොඳ දැනුමක් තියෙන්න ඕනේ. ඉන්ටවීව් රවුන්ඩ් එක පාස් වෙන්න ඕනේ. එතැනදී කොහෙන් ප්‍රශ්න අහයිද කියලා අපි දන්නේ නැහැ. ඒවට ලෑස්ති වෙන්නත් ඕනේ. ඒ නිසා ඉතින් කිරුළකට ලෑස්ති වෙන එක පේන තරම් පහසු නැහැ."



ඔය කැපකිරීම්වලට අමතරව සශ්මිට මේ තරඟයට යන්න කලින් ඉඳලාම මුහුණ දෙන්න වෙච්චි අභියෝගයක් තියෙනවා.

"මගේ නැෂනල් කස්ටියුම් එක බරයි කියලා එයාපෝර්ට් එකේදි ප්‍රශ්නයක් ඇතිවුණා. කිලෝ 15ක් වැඩි නිසා අන්තිමට කිලෝ 10ක් ෆ්‍රී දුන්නා. අනිත් කිලෝ 5ට අපිට ගෙවන්න වුණා. ඒ ප්‍රශ්න නිසා මට වෙලාවට ෆ්ලයිට් එකට යන්න වුණේ නැහැ. කොහොමහරි අන්තිම ෆ්ලයිට් කෝල් එකත් ආවට පස්සේ තමා යන්න වුණේ. එදා මට යන්න ලැබුණේ නැත්නම් මේ කිරුළ අද රටට නැහැ. අපි මේ වගේ තරඟවලට යන්නේ රට වෙනුවෙන්. ඉතින් ඒ වගේ අවස්ථා ගැන මීට වඩා සලකා බලන්න කියලයි මට කියන්න ඕනේ. ඊටපස්සේ තරඟෙදිත් මට අභියෝගයක් ආවා. කස්ටියුම් තෝරන දවසේ මම හෙයාඩ්‍රෙස් එක අරගෙන එන්න ගිය ටිකට කවුදෝ මගේ හීල් එකේ පටිය කපලා. හොඳ වෙලාවට අපි ළඟ වැඩිපුර හීල් එකක් තිබුණා. එහෙම සූදානම් වෙලා ගියේ නැත්නම් මට මේ තරඟේ දිනන්න වෙන්නේ නැහැ."

ඔය අභියෝග මැද්දේ ඉසව් හතරක්ම ජයග්‍රහණය කරන්න තරම් සශ්මි දක්ෂ වුණා.

**"මිසිස් අර්ත් බෙස්ට් ඉන් කැට් වෝක්, මිසිස් අර්ත් ඕවරෝල් බෙස්ට් ඉන් ගවුන්, මිසිස් අර්ත් ඕවරෝල් බෙස්ට් ඉන් රිසෝර්ට් වෙයාර්, මිසිස් අර්ත් බෙස්ට් ඉන් ටැලන්ට් කියන හතරම ලැබුණේ මට. තරඟේ උණුසුම වැඩි වෙනවත් එක්කම ඇත්තටම මට තරඟෙ ගැන තිබුණු බලාපොරොත්තු අඩු වුණා. අවසාන විනිශ්චය වෙලාවේ මුලින්ම කිව්වේ රටේ නම. ඉතින් මට එකපාර මුකුත් හිතාගන්න බැරිව ගල්ගැහුණා. මමයි දින්නේ කියලා එහා පැත්තේ කෙනා තමයි මට කිව්වේ. එවෙලේ දැනුණු සතුට නම් වචනවලට පෙරළන්න මට තේරෙන්නේ නැහැ."**



**මගේ නැෂනල් කස්ටියුම් එක බරයි කියලා එයාපෝර්ට් එකේදි ප්‍රශ්නයක් ඇතිවුණා. කිලෝ 15ක් වැඩි නිසා අන්තිමට කිලෝ 10ක් ෆ්‍රී දුන්නා. අනිත් කිලෝ 5ට අපිට ගෙවන්න වුණා. අපි මේ වගේ තරඟවලට යන්නේ රට වෙනුවෙන්. ඉතින් ඒ වගේ අවස්ථා ගැන මීට වඩා සලකා බලන්න කියලයි මට කියන්න ඕනේ**


සශ්මි කතා කළේ නිහතමානී ආඩම්බරකම පිරුණු සතුටකින්.

"මේ වෙලාවේ මට උදව් කළ හැමෝවම මතක් කරන්න ඕනේ. මගේ අම්මා, තාත්තා, අයියා, නැන්දා. තරඟෙට මට පෞද්ගලික අනුග්‍රාහකයෙක් හොයාගන්න බැරිවුණා. මගේ සැමියා තමයි වියදම් දැරුවේ. ඔහුවත් ආදරෙන් මතක් කරනවා. ඒ වගේම රුක්මල් සර්. ඔහු තමයි මට මේ ගමනට පාර කැපුවේ. ඒ වගේම තරඟයේ ජාතික අධ්‍යක්ෂ චරිත් ගුණසේකර, ඉසුරු ගුණසේකර, ලලිත් පැරකුම්, තාරක ගුරුකන්ද ඒ අයත් මට ගොඩක් උදව් කළා. ඒ වගේම මගේ හොඳම මිතුරිය සමඟ ඇගේ මවත් මතක් කරන්න මේක අවස්ථාවක් කරගන්නවා."

ඉතින් ජාත්‍යන්තර විවාහක මිහිකත රැජින කිරුළ ලංකාවට ගෙනාව සශ්මිට 'ධරණී' අපෙනුත් සුභාශිංසන!

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# මන්තර බලයෙන් ATM කාඩ්පතක් අක්‍රිය කරනු ලැබේ



මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

බැංකු ගනුදෙනු සඳහා යොදාගන්නා ඒටීඑම් කාඩ්පත් අක්‍රිය කළ හැකි අපූරු මන්ත්‍රයක් දන්නා පුද්ගලයකු පිළිබඳව පසුගිය දිනෙක මට අසන්නට ලැබිණ. ඒ මගේ හිතමිතුරෙකු වන ජනප්‍රිය ටෙලිනාට්‍ය අධ්‍යක්ෂ ජයප්‍රකාශ් ශිවගුරුනාදන්ගෙනි. ඔහු කී අන්දමට එම පුද්ගලයා ටෙලිනාට්‍ය ශිල්පියකුගේ මිතුරෙකි. තමන් මාතර පැරණි යකැදුරු පරපුරක සාමාජිකයකු බව වරින් වර කීම නිසා ඔහු එම ටෙලිනාට්‍ය කණ්ඩායමේ ඇතැමුන්ගේ බියමුසු ගෞරවයට ලක්වී හිඳින්නෙකු බවද ශිවාගෙන් වැඩිදුරටත් දැනගත හැකි විය.

ඒටීඑම් කාඩ් අක්‍රිය කරන මාතර යකැදුරාගේ කතා පුවත මෙසේය.

පසුගිය දිනයක සන්ධ්‍යාවේ එම ටෙලිනාට්‍ය කණ්ඩායමේ කිහිපදෙනෙක් හා ඒ මන්ත්‍ර ශාස්ත්‍ර දත් පුද්ගලයා මත්පැන් සාදයක් සඳහා එක්කාසු වී ඇත. සාදය තරමක් උණුසුම් වෙද්දී ඔහු තම යකැදුරු පරපුරේ හපන්කම් ගැන පවසා ඇත්තේ එහි සිටියවුන්ගේ විශේෂ අවධානයට හා ගෞරවයට ලක්වෙමිනි.

"මම නම් ඕවා කීයටවත් විශ්වාස කරන්නේ නැහැ. ඔය මන්තර ගුරුකම්වල බලයක් තියෙනවා කියලා මෙතැනදී ඔප්පු කරලා පෙන්නන්න පුළුවන්ද?"

එම මිතුරු කණ්ඩායම අතරේ සිටි අයෙක් ඔහුට අභියෝග කරමින් ඇසීය.

"ගිනි ඇවිලෙන වේලිච්චි පිදුරු වගේ දේකට ගිනි මන්තරේකින් එකසිය අටවතාවක් මැතිරුවොත් නිකම්ම ගිනි අවුලුවන්න පුළුවන් මන්තරයක් මගේ ළඟ තියෙනවා. ඒත් ඒ මන්තරේ එක සැරයක් කියන්න විනාඩි දෙකක් විතර යනවා. එතකොට ඒක එකසිය අටවතාවක් මතුරලා ඉවර වෙනකොට පැය තුනකටත් වැඩි කාලයක් යනවනේ." එසේ කී යකැදුරා ඒ සමඟම අසා ඇත්තේ "මහත්තයා ළඟ බැංකුවලින් සල්ලි ගන්න ඒටීඑම් කාඩ් එකක් තියෙනවද?" යනුවෙනි. එවෙලෙහි ඔහු සතුව ඒටීඑම් කාඩ්පතක් ඇති බව පැවසූ නිසා ඔහු ඊළඟට මෙසේ කියා ඇත.

"මම පුංචි මන්තරයකින් ඔය ඒටීඑම් කාඩ් එක ලොක් කරලා දෙන්නම්. ඊටපස්සේ මහත්තයට ඒක පාවිච්චි කරන්න බැරි වෙනවා."

එහෙත් මන්ත්‍ර ගුරුකම් අත්හදාබැලීමක් වශයෙන් හෝ එවැන්නක් කිරීම අනවශ්‍ය කරදරවලට ලක්වන්නක් බැවින් එහි හිමිකරු ඊට එකඟ වී නැත.

"එතකොට මට බැංකුවට ගිහින් අලුත් ඒටීඑම් කාඩ් එකක් ගන්න වෙනවද?" ඔහු ඇසුවේ එබැවිනි.

"අපොයි නෑ. මම ඊටපස්සේ ඒ වෙලාවෙම ලොක් එක ඇරලා දෙන්නම්. ඒකට වෙනම මන්තරයක් තියෙනවා." මාතර යකැදුරා කීයේ කාගේත් විශේෂ අවධානයට යොමුවෙමිනි. "හැබැයි මෙතන තවත් දෙයක් තියෙනවා." ඒ සමඟම ඔහු කීය.

"සමහරවිට මගේ මන්තරේ හරියට වැඩ කළේ නැත්නම් මහත්තයගේ ඒටීඑම් කාඩ් එක ලොක් නොවෙන්න පුළුවන්. එහෙම නැත්නම් මන්තර බලෙන් කාඩ් එක ලොක්වෙලා ලොක් එක අරින මන්තරේ වැඩ නොකරන්නත් ඉඩ තියෙනවා. ඒත් මහත්තයා කැමති නම් මම ඒ වැඩේට බහින්නම්." මාතර යකැදුරා එසේ පැවසුවේ ඔහුගේ පුරසාරම් ගැන ඇතැමුන් තුළ සැකයක්ද උපදවමිනි.

**ආපහු ලොක් එක ඇරලා දීලා තියෙන්නෙත් මන්තර බලයෙන්මයි**

"ඒත් ඉතින් අපි ඉන්නේ සාමාන්‍ය තත්ත්වේ නෙවෙයි. අනික මෙතන එක එක පුළුටු වර්ග පිරිලා. එහෙම තියෙද්දි ඔය වගේ දෙයක් හරියටම කරන්න පුළුවන් වෙයිද?" යනුවෙන් තමන්ද විමසුමක් කළ බව ශිවාගේ හිතවත් ටෙලිනාට්‍ය ශිල්පියා මා හා කීය.

එවිට ඔහු දී ඇත්තේ අමුතු පිළිතුරකි. එනම් එම මන්ත්‍ර ගුරුකම්, යක්ෂ බලය උපයෝගී කරගනිමින් කරන නිසා මත්පැන් පානය හෝ පුළුටු ආහාර ගැනීම ඒ සඳහා කිසිඳු බාධාවක් නොවන බවය. ඒ අනුව එම ඒටීඑම් කාඩ්පත ඉල්ලා ගත් මාතර යකැදුරා එය තම මුවට ළංකොට විනාඩි කිහිපයක් 'කුටු කුටු' ගා මතුරා හිමිකරු වෙතට පත්කරන ලද්දේ මත්පැන් සාදය නිමාවේදීය.

පසුව ඒටීඑම් කාඩ්පතට සැබැවින්ම අගුලු වැටී තිබේදැයි බැලීමට එම පිරිස පැමිණි වාහනයෙන්ම ඒටීඑම් යන්ත්‍රයක් වෙත ගියද මන්ත්‍රකරු වාහනයේම රැඳී සිට ඇත.

ඉනික්බිති, කාඩ්පතේ හිමිකරු එම කාඩ්පත ඒටීඑම් යන්ත්‍රයට ඇතුළු කළද එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. ඒ වෙනුවට යන්ත්‍රයේ ඇති ඩිජිටල් තිරය මත සටහන්ව ඇත්තේ එය හඳුනාගත නොහැකි හෝ කියැවිය නොහැකි කාඩ්පතක් ලෙසය. නැවත නැවතත් කාඩ්පත යන්ත්‍රයට ඇතුළු කළද ප්‍රතිඵලය එයම විය. ඒ අනුව නැවත වාහනයට පැමිණි එම ටෙලිනාට්‍ය කණ්ඩායම එම මන්ත්‍රයේ පැහැදිලි සත්‍යතාවයක් පෙන්නුම් කරන බවක් යකැදුරාට පවසා තිබේ.

ඒ සමඟම ඒ මන්ත්‍ර බලයෙන්ම යළි එම කාඩ්පතේ අගුලු හරින ලෙස එහි හිමිකරු ඉල්ලා ඇත්තේ එසේ නොකළහොත් තමන්ට අතිරේක කරදරවලට මුහුණපෑමට සිදුවන බැවිනි. කෙසේ හෝ එම ටෙලිනාට්‍ය පිරිස වාහනයෙන් පිටත සිටියදී වාහනය තුළ අඳුරේ සිටි මාතර යකැදුරා කුටු කුටු ගා යළි ඒ කාඩ්පත හිමිකරු වෙත දිගුකරන ලද්දේ "දැන් හරි ඇති ගිහින් බලන්න" යනුවෙන් පවසමිනි. ඔහු කී ලෙසින්ම නැවත එම පිරිස බැංකුවේ ඒටීඑම් යන්ත්‍රය වෙත ගිය අතර එහි හිමිකරු තම කාඩ්පත ඊට බහාලීය.

එවිට මාතර යකැදුරා කී ලෙසින්ම ඒටීඑම් කාඩ්පත සක්‍රිය වී තිබිණ.

මේ සම්බන්ධව මගේ විශ්ලේෂණය නම් ඒටීඑම් කාඩ්පතක ඇති සියුම් ලෝහමය සංයුතියකින් යුතු සංවේදකයේ තුනී තෙල් තට්ටුවක් වැනි යමක් රැඳුනු විට එය ක්‍රියාත්මක නොවේ. නමුත් ඒ තෙල් තට්ටුව පිස දැමූ පසු යළි එය ක්‍රියාත්මක වෙයි. මිනිසුන් මුළා කරන මෙවැනි සෑම කටයුත්තකම එවැනි කුමක් හෝ ඇස්බැන්දුමක් ඇත. නමුත් ඒ බව වටහාගත හැක්කේ අන්ධ භක්තියෙන් තොරව විචක්ෂණශීලී ලෙස නිරීක්ෂණය කළහොත් පමණි.

ඉහත සඳහන් මාතර යකැදුරාගේ ගුරුකම තුළද එවැනි රහසක් ගැබ්ව තිබේදැයි සියුම් ලෙස පරීක්ෂා කළ හැකිය. නමුත් ඊට පසුදිනෙක දැනගත හැකිවූයේ තමන් මාතර යකැදුරු පරපුරක බව කී ඒ තැනැත්තාට මාතර සමඟ ඇත්තේ එකම එක සම්බන්ධයක් පමණක් බවය. එනම් ඔහු කොළඹ සිට කතරගම යන ගමනේදී මාතර ප්‍රදේශය පසු කිරීම පමණි.





1930 ගණන්වල ජර්මනියේ ෆිෆී රෙබයින්ඩෙර් කියලා ප්ලාස්ටික් බෝනික්කෝ හදන කාන්තාවක් හිටියා. ඔය කාලේ රටේ ඇතිවුණු දේශපාලන අලකලංචි නිසා ප්ලාස්ටික් වගේ අමුද්‍රව්‍ය ගෙන්වන එක ටිකක් සීමා වුණා. ඉතින් ඊටපස්සේ ෆිෆී නෝනා එක එක අත්හදාබැලීම් කරලා අමුතු මැටි ජාතියක් හොයාගත්තා. ඒකට තමයි පොලිමර් ක්ලේ කියලා අපි කියන්නේ. 1970 වෙද්දි ඇමරිකාව, එංගලන්තය, ඔස්ට්‍රේලියාව වගේ රටවලින් පොලිමර් ක්ලේ නිෂ්පාදනවලට පුදුමාකාර ඉල්ලුමක් හැදුනා.

හැබැයි මේ කියන ක්ලේ ජාතියෙන් මුලින්ම ආභරණ හදන්න පටන්ගත්තේ බොහිමියානුවෝ කියලා තමයි කියන්නේ.

දැන් අපේ රට දිහාවට හැරෙමු. මෙහේ පොලිමර් ක්ලේවලින් නිර්මාණ කරන උදවිය ඉන්නේ ගණන් කරන්න පුළුවන් ගාණට. ඒ වුණත් නිෂ්පාදනවල තියෙන ඒකාකාරී බව නිසා ඒ බහුතරයකට වෙළඳපොළේ ලොකු ඉල්ලුමක් නැහැ. හැබැයි ඔය අතර ඉන්න කැපී පෙනෙන පොලිමර් ක්ලේ ව්‍යවසායිකාවක් අපිට හමුවුණා.

ඇය පොලිමර් ක්ලේ නිර්මාණ හදන්න ඉගෙනගෙන තියෙන්නේ ඇත්තම බොහිමියානුවන්ගෙන්. ඉතින් ඒ නිසා අද 'ධරණී' කවරය සරසන ගමන් ක්ලේ කතාව ගැන කියන්නත් අපි දිළිනිට ආරාධනා කළා.

# මෙච්චර ලස්සනට කරාබු හදන්න මම ඉගෙනගත්තේ බොහිමියානුවන්ගෙන්

**ව්‍යවසායිකා**

**දිළිනි චන්ද්‍රසේකර**

**"පොලිමර් ක්ලේ කියන්නේ කෘත්‍රිමව හදපු මැටි වර්ගයක්. මැටි කිව්වට මේකේ මැටි මූලද්‍රව්‍ය අංඩගු නැහැ. මේක හරියට පුංචි බබාලා සෙල්ලම් කරන්න ගන්න ක්ලේ එක වගේමයි."**

දිලිනි කතාව පටන්ගත්තේ ක්ලේවලින්. මේ කියන ක්ලේවලින් එක එක නිර්මාණ හදලා උදුනකට දලා පුච්චනවලු. ක්ලේ ගැන කතා කළායින් පස්සේ අපි ආයෙම කතාව මුලට ගියා.

"මගේ ගම අනුරාධපුර. අනුරාධපුරෙත් ඇතුළට වෙන්න දුෂ්කර ගමක. පවුලේ ඉන්නේ අක්කයි, අයියලා දෙන්නයි, මමයි. අපි පුංචි කාලෙම තාත්තා පවුලෙන් වෙන්වෙලා. ඉතින් අම්මා බොහොම අමාරුවෙන් තමයි අපිව හදගත්තේ. ගෙදර ගොඩක් ආර්ථික ප්‍රශ්න තිබුණා. ඒ නිසාම අම්මා රට ගියා. අම්මා රට යද්දි මට අවුරුදු දෙකයි. කාලයක් යද්දි අක්කයි අයියාත් විදේශගත වුණා. මම හැදුනේ ආච්චිත් එක්ක. අම්මා ළඟ හිටියේ නැති වුණත් මම හොඳට ඉගෙනගත්තා. උසස් පෙළ හොඳට පාස්වෙලා කම්පියුටර් සයන්ස් ඩිග්‍රි එකක් කළා."

දිළිනිගේ අම්මා සේවය කරලා තියෙන්නේ සයිප්‍රස් රටේ. ඉතින් ලංකාවේ තනියම ඉන්න අපහසු නිසා අවුරුද 23 වෙද්දි දිළිනිත් සයිප්‍රස්වලට ගියාලු.

"එහෙ ගිහිල්ලා මම වැඩ කළේ කොෆී ෂොප් එකක. එහෙ කොෆී ෂොප් එකක් කියන්නේ දැනුම් සාගරයක්. එක එක කණ්ඩායම් ඇවිල්ලා කෝපි බොන ගමන් එයාලගේ විෂයන් ගැන කතා කරනවා. දැනුම බෙදාගන්නවා. දවසක් ෂොප් එකට සයිප්‍රස් කාන්තාවක් ආවා. එයා මේසයක් උඩ ඉඳගෙන ක්ලේවලින් පොඩි පොඩි නිර්මාණ හදනවා. ඒක දැක්කහම මටත් ආස හිතුණා. පස්සේ දවසක් දෙකක් බලලා මම එයා එක්ක කතා කළා. පස්සේ ඇය මට පොලිමර් ක්ලේ ගැන කියලා දුන්නා. ඒ අයගේ ක්ලේ කමිටි එකක් තියෙනවා කියලා මට එන්න කිව්වා. ඉතින් මමත් ගියා. ඒ කමිටුවේ බොහිමියානු උදවිය පවා හිටියා. ඒ අය තමයි මට මේ වැඩේ කරන හැටි කියලා දුන්නේ."

ඔය අතරේ දිළිනි විවාහ වෙලා දරුවෙක් ලැබුණාලු.

**"අපි විවාහ වුණෙත් එහෙදිමයි. බබා ලැබුණට පස්සේ ලංකාවට ආවා. ඒ 2019 දි. ලංකාවට ඇවිල්ලා ජොබ් එකක් කළේ නැහැ. මාස හයක් විතර ගෙදර නිකන් හිටියා. මුකුත් නොකර ඉද්දි හිතට දැනුණේ මහා හිස් හැඟීමක්. නිකන් ඉන්න එකේ ක්ලේවලින් මොනවාහරි හදලා විකුණන්න ඕනේ කියලා හිතුවේ ඒකයි. පස්සේ මම ලංකාවේ ක්ලේ හොයන්න පටන්ගත්තා. ලංකාවේ කොහේවත් ඔරිජිනල් පොලිමර් ක්ලේ නැහැ. මගේ අක්කා ජීවත්වෙන්නේ එංගලන්තේ. මම එයාට කියලා ක්ලේ පොඩ්ඩක් ගෙන්න ගත්තා. මට කටර් හොයාගන්න බැරි වුණා. බියර් ටින්, ටොනික් මූඩි කපලා කටර් හදගත්තා. ඒ කරලා මාල, කරාබු, කී ටැග් වගේ පොඩි පොඩි අයිටම් ටිකක් හැදුවා."**

දිළිනි ඇගේ ෆේස්බුක් පේජ් එක හදලා තියෙන්නේ 2020 මාර්තු මාසේ. මුල් මාස කීපයේදි මේ පේජ් එකට තිබුණේ ගෙදර උදවියගේ ලයික් ටික විතරලු. අනික අවුරුද්දක් යනකල් දිළිනිට එක ඕඩරයක්වත් ආවෙත් නැතිලු.

**"අද ඕඩරයක් ඇවිල්ලා ඇති... අද ඇති කියලා හැමදම පේජ් එක බලනවා. ඒත් අවුරුද්දක් යනකල් එක ඕඩරයක්වත් ලැබුණේ නැහැ. මට හරි දුකයි. මම ගොඩක් කඩාගෙන වැටුණා. මේ වැඩේ හරියන්නේ නැහැ කියලා හිතලා පොලිමර් බඩු ටික විකුණන්න ඇඩ් එකක් පවා දැම්මා. ඔන්න ඔය අතරේ මට රුපියල් 600ක කරාබු දෙකක ඕඩරයක් ආවා. ඒක දුන්නට පස්සේ ආයෙත් හිතට ශක්තියක් ආවා. මම දුකින් ඉන්නවා කියලා දැකපු තැන අම්මා බඩු ටික අරගෙන කඩවල් ගානේ ගියා. මමත් කඩ කීපයකට කතා කළා. මගේ නම නොගහා එයාලගේ බ්‍රෑන්ඩ් එකක් විදියට විකුණනන්න කියලයි ඒ හැමෝම කිව්වේ."**

අපේ රටේ ගොඩක් ව්‍යාපාරවල ලාබ උපයන්නේ අතරමැදියෝ. තමන් මහන්සි වෙලා කරන නිර්මාණ වෙන නමකින් වෙළඳපොළට යවන්න දිළිනි නම් කැමති වුණේ නැතිලු.

"ආයේ කාලෙකට ඉල්ලුමක් තිබුණේ නැහැ. ඔය අතරේ මට අමුතු තාලේ රෝස මල් වැලක් වගේ කරාබු දෙකක් එවලා ඒක හදලා දෙනවද කියලා කෙනෙක් අහලා තිබුණා. ඒ වෙද්දි මම ඒක හදන්න දැනගෙන හිටියේ නැහැ. ඒත් මම ඕඩරේ භාරගත්තා. බලලා කොහොමහරි කරාබුව හැදුවා. ඒකේ වීඩියෝ එකක් කරලා ටික්ටොක් එකටත් දැම්මා.

නොහිතුව විදියට ඒ වීඩියෝ එක වෛරල් වුණා. පස්සේ ගොඩක් අය ඒ වගේ කරාබු ඉල්ලන්න පටන්ගත්තා. එතැනින් එහාට එකදිගටම ඕඩර් ආවා."



# ඇත්තම කිව්වොත් රැකියාවක් කරලා මාසිකව හොයන්න බැරි මුදලක් අද මම හම්බ කරනවා





අවුරුද්දක් යනකල් එක ඕඩරයක්වත් නොතිබුණු දිළිනිට අද දවස ගානේ කරගන්න බැරිතරම් ඕඩර් ලැබෙනවා කියලා ඇය කිව්වේ සතුටෙන්.

**“හැම දවසකම ඕඩර් 20/30ක් එනවා. මාල, වළලු, ජර්නල් පොත්, පෙන්ඩන්ට් ඔය හැමදේම හදනවා. හැබැයි ගොඩක් අය ඉල්ලන්නේ කරාබු. මම හදන රෝස මල් කරාබුවට හැමෝම කැමතියි. වෙඩින්වලට පොලිමර් ක්ලේ ආභරණ දන එකත් දැන් ට්‍රෙන්ඩ් එකක් වෙලා. ඉතින් මනමාලියන්ගෙනුත් ගොඩක් ඕඩර් එනවා.”**

ලංකාවේ ඇණවුම්වලට වඩා යුරෝපීය රටවලින් වැඩි ඇණවුම් ප්‍රමාණයක් ලැබෙනවා කියලයි දිළිනි කිව්වේ.

“එංගලන්තය, ඔස්ට්‍රේලියාව, කැනඩාව වගේ රටවල පොලිමර් ක්ලේ හරි ප්‍රසිද්ධයි. බබාලා නිසා ගෙවල්වලට වෙලා ඉන්න අම්මලා ගොඩක් සල්ලි හොයන්නේ පොලිමර් බඩු හදලා. හැබැයි වැඩේ කියන්නේ ඒ රටවල මේවයේ මිල වැඩියි. ඒ නිසා යුරෝපයේ කාන්තාවන් වෙනත් රටවලින් පොලිමර් නිෂ්පාදන ගන්නවා. ඒ අයගෙන් මටත් ගොඩක් ඇණුවම් එනවා. මම යුරෝප පොලිමර් ක්ලේ කමියුනිටිවලට බැඳිලා ඉන්නවා. අපි මොකක් හරි අලුත් දෙයක් හැදුවහම ඒ අය ඒකේ රෙසිපි එක, පියවර මිලදී ගන්නවා. ඉතින් එතැනිනුත් මුදලක් හම්බකරගන්න පුළුවන්.”

ලංකාවේ පොලිමර් ක්ලේ හදන අය කීපදෙනෙක්ම ඉන්දැද්දි දිළිනිගේ නිෂ්පාදනවලට විතරක් මෙච්චර ඉල්ලුමක් තියෙන්නේ ඇයි කියලා නෑහුවොත් අඩුවක්.

“අනිත් අය ගැන කියන්න මම දන්නේ නැහැ. හැබැයි මම අදටත් නිර්මාණ කරන්නේ එංගලන්තෙන් ගේන හොඳම ක්ලේවලින්. අනික මම නිතරම අලුත් අලුත් දේ අත්හදා බලනවා. අලුත් ට්‍රෙන්ඩ් ෆලෝ කරලා නිර්මාණ හදනවා. සමහරවිට ඒවට මිනිස්සු කැමති ඇති.”

බොහොම සාර්ථක තැනක හිටියත් ඇගේ ව්‍යාපාරය තව තවත් දියුණු කරගන්න අදටත් ඇය සෑහෙන කැපකිරීමක් කරනවලු.

“එක නිර්මාණයක් කරන්න පැය හයක් විතර යන වෙලාවක් තියෙනවා. මලක් වුණත් කැත වුණොත් කීපපාරක් කඩ කඩා හදනවා. කොච්චර පලපුරුදු කෙනෙක් වුණත් ක්ලේ පිච්චෙන වෙලාවල් තියෙනවා. එවෙලෙට ඉතින් ඒක සම්පූර්ණයෙන්ම අහක දාලා ආයෙත් මුල ඉඳලා හදනවා. ඉතින් එළිවෙනකල් ඇහැරිලා වැඩ කරන දවස් අදටත් තියෙනවා.

අනික මේක කරන්නේ එක තැන ඉඳගෙන. ඉතින් සමහර වෙලාවට කකුල්, ඇඟිලි ඉදිමෙනවා. හැබැයි ඒ දේවල් මට අභියෝගයක් නෙමෙයි. ඊට වඩා සතුටක්, තෘප්තියක් මේ ව්‍යාපාරයෙන් මට ලැබෙනවා. ඇත්තම කිව්වොත් රැකියාවක් කරලා මාසිකව හොයන්න බැරි මුදලක් අද මම හම්බ කරනවා.”

ඇගේ මේ අභියෝගවලට හයියක් වෙන්න ඇගේ අම්මා, සහෝදර සහෝදරියන් වගේම සැමියත් ඇය එක්ක ඉන්නවා කියලා ඇය කිව්වේ ආදරෙන්.

**“අලුත් දෙයක් පටන්ගනිද්දි කවුරුත් කියන්නේ ඔයාට ඕක කරන්න බැහැ කියලා. කට්ටිය මටත් අනන්තවත් ඒ වගේ කතා කියලා තියෙනවා. ඒවා නම් හිතට ගන්නම එපා. අනිත් දේ දැන් ගොඩක් ව්‍යාපාර වෙන්නේ සමාජ මාධ්‍ය හරහා. නිර්මාණය ලස්සනට හැදුවටම වැඩක් නැහැ. ඒක ලස්සනට ඉදිරිපත් කරන්නත් ඕනේ. ෆොටෝ, වීඩියෝ හදද්දි ඒවා නිර්මාණාත්මකව හදන්න. පොලිමර් ක්ලේ නිර්මාණ හදන්නේ කොහොමද කියලා මගෙන් ගොඩක් අය අහනවා. මම දන්න දේවල් ඒ අය එක්කලා බෙදාගන්නවා.”**

ඕනම අලුත් පාරක යන්න පටන්ගන්නකොට ගල්, මුල් අහුවෙනවා වැඩියි. හැබැයි ආපහු හැරෙන්නේ නැතිව හිතේ හයියෙන් ඒ පාරේ ඉස්සරට යන්න පුළුවන් නම් ගල්, මුල් වෙනුවට මල් හම්බවෙන කාලෙකුත් එනවා කියන එකයි දිළිනිගේ කතාවෙන් අපිට ගන්න තියෙන ආදර්ශය.

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

**ඡායාරූප - ක්‍රිෂාන් කාරියවසම්**

## හොරිවිල වෙදමහත්තයාගෙන් බෙහෙතක්

4 කොටස



**ශාන්ත සෙනෙවිරත්න වෙදමහතා**
හොරිවිල වෙද මැදුර

# නොම යන් රාලේ මේවට ඉස්පිරිතාලේ



**මනුස්ස පරාණවලට වැළඳෙනවාය කියන අට අනූවක් රෝග නිට්ටාවටම සුව කරන්ට පුළුවන් ජගතෙක් ඉන්නවනම් ඉතින් ඒ සිංහල වෙදමහත්තයෙක්ම තමයි. නම් දරාපු ලොකු දොස්තර මහත්තැන්ලා ගාවට හිහිල්ලත් සමහර ලෙඩ සුව කරගන්න බැරිවෙද්දී එකනේ සමහරු කියන්නේ ‘නරකද සිංහල බෙහෙත් ටිකක් බීලා බැලුවොත්’ කියලා. හොරිවිල වෙද පරපුර කියන්නේ අපේ රටේ ගොඩ වෙදකමට නම් දරාපු එහෙව් වෙද පරපුරක්. මේ පරපුරේ තිස්වැනි පරම්පරාව තමයි අද වෙද්දී වෙදකමේ නියැලෙන්නේ. ඉතින් ඒ හොරිවිල වෙදමහත්තයාගෙන් අහලා පුංචි පුංචි ලෙඩවලට අත්බෙහෙත් ගෙදරදීම හදාගන්න විදිය තමයි අපි මේ කියන්නේ.**

### බඩේ දැවිල්ලට

බඩේ දැවිල්ල කොච්චර දරුණු එකක් වුණත් ඒකට හොඳම විසඳුමක් තමයි ඒ වෙලාවට පුහුල් මද ඉස්ම ටිකක් බොන එක. ඒ නැත්නම් හීන් බෝවිටියා ටිකක් තම්බලා බොන එක. ඒ දෙකම නැත්නම් කොහොඹ පොතු, රසකිඳ, දුම්මැල්ල කොළ තම්බපු වතුර සීනි චුට්ටක් දාලා උදේ හවස දවස් කීපයක් බිව්වා නම් ආයෙත් බඩේ දැවිලි එන එකක් නෑ.

### හදිසි කැපීම් කෙටීම්

කැපීම් කෙටීම් වෙන්නෙත් අපි නොහිතන වෙලාවල් වල. ඒ වගේ වෙලාවකට මුලින්ම කරන්න ඕනේ ලේ ගැලීම නතර කරන එක. ඒකට කරන්න තියෙන්නේ පුළුවන් ඉක්මණට කරල් සැබෝ කොළ ටිකක් අඹරලා අරන් කැපුනු තැනට තියලා බඳින එක. කෙසෙල් අල කෑල්ලක් අඹරලා බැන්දත් කමක් නෑ. එහෙම නැත්නම් ගෙදර තියෙන කෝපි කුඩු පැකට් එකකින් ටිකක් අරන් තුවාලේ තවරලා රෙදි කෑල්ලකින් වෙලුවා නම් ආයෙත් ලේ එන්නේ නෑ. ලේ නැවතුණාට පස්සේ කරන්න තියෙන්නේ බෝමු ගහේ පොත්තක් ගැලෙව්වම තියෙන සෙවල ලාටුවලින් ටිකක් අරන් කැපුනු තැන ගාලා තුවාලේ වෙලන එක. වෙලලා ඇල්වතුරෙන් ටිකක් තෙමුවා නම් දවස් තුනෙන් තුවාලේ සනීපයි. නැත්නම් තියෙන්නේ කොටන් හත්තක් (කොටේක හැදුනු බිම්මලක්) අඹරලා කැපුම් තුවාලයට තියලා බඳින එක තමයි.

### උලුක්කුවක්

කකුල් උලුක්කුවක් හරියට වුණොත් දවස් ගාණක් යනකල් ඇවිදින්න අමාරුයි. සමහරවිට ඉදිමෙන්න වුණත් පුළුවන්. ඒකට බෙහෙත තමයි බේත් එඬරු ගහේ පස් පංගුව අරන් අමුකහයි දියලුණුයි ඒකට දාලා හොඳට කොටලා අරන් තලතෙලෙන් මළවලා බඳින එක.

### තැල්මක්/ කෙටීමක්

හදිසි තැල්මක් කෙටීමක් ආපු ගමන් කරන්න තියෙන්නේ කුස්සියට ගිහින් ලිපේ අලු ටිකක් අරගෙන විනාකිරෙන් අනලා ගාන එක. ඒකටම බටතැල්ල ගහක් කහයි දියලුණුයි දාලා කොටලා අරන් මළවලා බඳින එකත් හොඳයි. ඔය කොහොම කළත් දවස් තුනෙන් ලෙඩේ සනීපවෙයි.

### ඇඟේ පලු (කරප්පන්)

ගොඩාක් වෙලාවට ඇඟේ පලු නැත්නම් කරප්පන් එන්නේ කෑමක් බීමක් විස උනාමනේ. ගොඩාක් වෙලාවට මස් මාංශ විස වුණාම. එහෙම පලු දැම්මම ඉතින් ඉවසන්නම බැරි කැසිල්ල තමයි. ඒකට නියම බෙහෙත, අමු පොල් කොළ ටිකක් අරන් හීනියට ඉරාගෙන ගිනිකබලක් මත දාලා ඒ එන දුම් පලු ආපු තැන් වලට අල්ලන එක. ඒ මොකුත්ම නැත්නම් අබතෙල් ටිකක් අරන් ගෑවත් හරි.

### නින්ද නොයෑමට

සමහරුන්ට සමහර කාලවලදි හරියට නින්ද යන්නේ නෑනේ. ඒකට ඉතින් ඉස්පිරිතාලෙට ගියොත් එහෙම දෙන්නේ නිදිපෙති ටිකක්. ඒවා බීවොත් ඉතින් රෑට විතරක් නෙවෙයි දවල්ටත් නින්ද යනවා. එහෙම නොවී රෑට විතරක් නින්ද යන්න නම් කරන්න තියෙන්නේ පොඩි දෙයයි. ඒ තල තෙල් ටිකකට දෙහි ඇඹුල් ටිකක් දාලා නිදාගන්න යද්දි හිස ගල්වන එක. ඒ නැත්නම් අබ තෙල් ටිකකට දෙහි ඇඹුල් ටිකක් දාලා යටි පතුලෙයි ඔලුවෙයි ටිකක් ගාලා ටික වෙලාවකින් කකුල් හෝදගෙන ඇඳට ගියා නම් මැරුනා වගේ නින්ද යයි.

### මුත්‍රා දැවිල්ලට

මුත්‍රා දැවිල්ලත් ඉවසන්න බැරි එකක්නේ. ගොඩාක් වෙලාවට මුත්‍රා දැවිල්ල එන්නේ රාත්‍රියට. ඒකට කරන්න තියෙන්නේ මෙච්චරයි. වැල්මී, ඉඟිනි ඇට, සුදු හඳුන් කලං තුන බැගින් (කළඳක් යනු තඹ සතයක බර) අරන් තැඹිලි වතුරෙන් අඹරගන්න. ඊටපස්සේ තැඹිලි ගෙඩියක ඇස්ස ගහලා සිදුරු කරලා අඹරගත්ත කල්කය ඒකට දාන්න. ඒ දාලා සිදුර වහලා රාත්‍රී කාලයේදි පින්න වැටෙන්න මිදුලෙන් තියන්න. ඒක උදේට පෙරළා අරන් හිස්බඩ බිව්වා නම් මුත්‍රා දැවිල්ල කොහෙන් ගියාද නැතිවෙයි. හැබැයි දවස් කීපයක් යනකල් උෂ්ණ අධික ආහාර හෝ තෙල් කෑම නම් කන්න එපා.

**■ රුවන් එස්.සෙනවිරත්න**



# දන්නවාද අලේ බලේ

එක ගැමි ගෙදරක ගම හාමිනෙයි, ගම මහත්තයයි, පුංචි දුවෙකුයි හිටියලු. මේ කියාපු දුව පුංචි කාලෙම ගම මහත්තයා පරලොව සැපත් වෙලා. ඉතින් අර අම්මා බොහොම අමාරුවෙන් දුක සේ දෙණියැන්දව උස්මහත් කරලා නිසි වයසෙදි පෙළවහක් එහෙමත් කරලා දීලා.

පිළිවෙලක් කාරිය වුණෑයින් පස්සේ අර දුව අම්මාට සැලකුවේ නැතිලු. ඉතින් මහළු අම්මා ජීවත් වුණේ තනියම. අම්මට කෑමබීම එහෙමත් බොහොම හිඟ වුණා. ඔහොම ඉන්දැද්දි දවසක් මහළු අම්මට දරාගන්නම බැරි කුසගින්නක් ඇවිත් දුවගේ ගෙදරට ගියාලු.

"අනේ දුවේ මට හරිම බඩගිනි. බත් ඕංගක් දීපන්කෝ."

අම්මා ඔහොම බත් ඉල්ලද්දිත් ගෙදර බත් මුට්ටිය තිවුණේ ලිපේ. අම්මා ඈතින් එනවා දකිද්දිම වගේ දෝණියැන්ද බත් මුට්ටිය හැංගුවලු.

"අනේ අම්මේ... අපිටත් බත් නෑ... ගෙදර හාල් ඇටයක්වත් නෑ..."

කෙබරයක් ඇදබාලා දුව අම්මව එළවාගත්තා. එහෙම කරලා කුස්සියට ගිහින් බත් කන්න බලද්දි බත් මුට්ටිය ලේ වෙලා තිබ්බලු. 'අම්මට බත් නුදුන් නිසා බත ලේ වෙලාය' කියලා හිත හිතා දුව බත් මුට්ටිය වත්ත පහල වැළලුවා. ටික දෙහකින් බත ලේ වළලාපු තැනින් වැල් ජාතියක් දළුලලා අල හැදුනලු. ඔහොම කාලයක් යද්දි ගම දුවගේ සැමියා ආන්ත්‍රා වෙලා මේ පවුල බොහොම දුප්පත් වෙලා දරුවෝ කුසගින්නේ අඬන්න ගත්තා. දරු ලතෝනිය ඉවසගන්න බැරි තැන ගම දුව මැරෙන්න හරි කියලා අර බත ලේ හලාපු තැනින් ආපු අල උදුරලා දරුවොත් එක්ක කෑවලු. තමන්ට මේ සන්තෑසිය වුණේ ලෝබකම නිසා කියලා තේරුම්ගත්තු බවලතී ගමේ උදවියටත් මේ අල බෙදුවා. අම්මට නුදුන් බත ලේ වුණු තැනින් හැදුනු අලේට බතලේ නම වැටුණේ එහෙමයි කියලයි ජනවහරේ කියන්නේ. බතල කියන්නේ බොහොම ගුණැති අල වර්ගයක්. බතල විතරක් නෙමේ උඩල, රාජල, ගහල, කහ අල, කිරි අල, හිඟුරල වගේ අල වර්ග නම් ඕසේට. අපේ අතීත මිනිස්සු අල බතල කාලා හැදුනය කියලනේ කියන්නේ.

අල බතල කෑවහම ශරීරයට හම්බෙන සෞඛ්‍ය ප්‍රතිලාභ බොහොමයි. අල බතලෙන් ඇඟට තියෙන ගුණ සාරය ගැන දැනුවත් වුණත් සමට, රූපෙට මෙව්වයෙන් තියෙන පල ප්‍රයෝජන ගැන නම් හුඟක් උදවිය දන්නේ නැහැ. ඒ නිසා අල බතල ඇඟ ගාලා හැඩවෙන හැටි ගැනයි අද කතාව.

'කලා රසය තිබුණත් නියඟලා මලේ - මළා නේද කෑවොත් නියඟලා අලේ'

අල ජාති ඕසෙට තිබ්බට මොකෝ ඔය හැම අලේම කන්නත් බෑ හමේ ගාන්නත් බෑ. හැම ඉලව්වම මූණේ උලන්න ගියොත් වෙන්නේ මූණ අල වෙන එක. ඒ නිසා සමට හොඳ අල මොනවද කියන එක වගේම සමට ගාන්න පුළුවන් අල සත්කාර මොනවද කියන එක ගැනත් වෙන වෙනම කතා කරමු.

බත ලේ කොරාපු බතලෙන්ම පටන්ගමුකෝ කතාව. බතල ජාති දෙජාතියයි. රතු බතලෙයි කහ බතලෙයි. පාට මොක වුණත් ඔය කොයි බතලෙත් සමට ගුණයි. බතලවල විටමින් A, C තියෙනවා. ඔය සමහර රූපලාවණ්‍ය නිෂ්පාදනවල රෙටිනෝල් (Retinol) කියලා ගහලා තියෙනවා දැකලා තියෙනවද? ආන් ඒ කියන්නේ විටමින් A ගැන. සමේ තියෙන රැලි ඉවත් කරන්න විටමින් A වලට පුළුවන්. බතලවල කැරොටිනොයිඩ් (Carotenoid) කියලා තව සංඝටකයක් තියෙනවා. කොලැජන් උත්තේජනය කරලා අලුත් චර්ම සෛල හැදෙන වේගය වැඩි කරන්න මේ හාදයට පුළුවන්. ඉතින් එහෙම බලාපුවාම බතල කියන්නේම සම තරුණ කරන ගුණකඳක්. යුරෝපේ බවලතියෝ උඩ පැන පැන බතල කන්නේ ඕවා දන්න නිසයි.

ආහ්. තව කතාවක්. මහත කෙනෙක් දැකපු හැටියේ කතාවට බතලයා වගේ කිව්වට මොකද බතල කියන්නේ ඇඟේ බර අඩු කරන කෑමක්. බතලවල 80%ක්ම තියෙන්නේ වතුර. ඉතින් අහාරයක් විදියට බතල කනවා නම් ඉක්මනින්ම බර අඩු කරගෙන ඇඟ හැඩ කරගන්නත් පුළුවන්.

බතලවලින් කරගන්න පුළුවන් රූපලාවණ්‍ය සත්කාර කීපයක් ගැන දැන් සාකච්ඡා කරමු.

- බතල අලයක් අරගෙන පොත්තත් එක්කම තම්බගන්න. පස්සේ ඒකට මී කිරි, මී පැණි, කුරුඳු කුඩු එහෙම එක්කාසු කරලා බ්ලෙන්ඩ් කරගෙන මූණේ අතපයේ ගාන්න. විනාඩි 20ක් තියලා සීතල වතුරෙන් සෝදලා දාන්න. අව්වෙන් හානිවෙච්චි හමට එහෙම මේ සත්කාරය පංකාදුයි.
- බතල අලයක් අරගෙන බ්ලෙන්ඩ් කරලා නැත්නම් පිරිසිදුව තලාගෙන ඒකේ යුෂ වෙන් කරගන්න. පස්සේ ඒකට කඩල පිටි, කස්තුරි කහ එකතු කරලා සමේ ගාන්න. බලාගෙන ඉන්දැද්දි පාට වැටෙයි ඕන්.


ඊළඟ කයිය අර්තාපල් ගැන. සැමුවෙල් බේකර් කියන එංගලන්ත මහත්තයා තමයි මුලින්ම ලංකාවේ අර්තාපල් වැව්වේ. ඒ 1850දී. ඒ කාලේ ඔය සුදු මහත්තැන්ලගේ අල වතුවල වැඩ කරන උදවියගේ කකුලක් එහෙම තුවාල වුණාම අර්තාපලයක් තලලා එතැනට බඳිනවලු. එතකොට තුවාලේ ඉක්මනින් සුව වෙනවලු. හානිවෙච්චි සෛල ඉක්මනින් අලුත්වැඩියා කරන්න පුළුවන් එකයි ඒකට හේතුව.

අර්තාපල්වල තියෙන ඔය ගුණේ සම ලස්සන කරගන්නත් දායක කරගන්නවා. ලප කැළැල් මකන්න වගේම රැලි ඉවත් කරන්න අර්තාපල්වලට පුළුවන්. ඒ විතරක් නෙමෙයි ආයුබෝවන්ඩ මෙව්වගේ විටමින් C, B, B6, D, ප්‍රතිඔක්සිකාරක එහෙමත් තියෙනවා. ඔය ගුණ නිසා හැමදම අල ගෑවොත් සම පැහැපත් වෙන බව සහතිකයි. හැම ගෙදරකටම වගේ නිතරම ගේන දෙයක් නිසා වැඩි වියදමක් නැතිව ලස්සන වෙන්න නම් කරන්න තියෙන්නෙ අර්තාපල් ගාන එක.

- තම්බගත්තු අල ගෙඩියකුයි, ග්‍රේට් කරගෙන වෙන්කරගත්තු අල යුෂ ටිකකුයි අරගන්න. ඒකට කෝමාරිකා මදයක්, මී පැණි, කඩල පිටි එහෙමත් එකතු කරලා මූණේ ගාන්න. විනාඩි 20ක් තියලා සීතල වතුරෙන් සෝදලා දාන්න.
- අල ගෙඩියක් අරගෙන ඒක පොල් වතුරෙන් තම්බගන්න. පස්සේ මේකට කස්තුරි කහ, මී පැණි එකතු කරලා බ්ලෙන්ඩ් කරලා සමේ ගාන්න.
- ඔය මුකුත් නැතිව ලැප කැළැල් තියෙන තැන්වල නිකන්ම අල යුෂ ගාන්නත් පුළුවන්.

අර්තාපල් වගේම මූණේ ගාන්න පුළුවන් තව අලයක් තමයි රාජාල (දන්දින්න). මේක ඖෂධ ගුණකඳක් තියෙන ඉස්සර ඉඳලා අපේ මුතුන් මිත්තොත් කාපු ප්‍රණීත අලයක්. දැන්නම් ගහට කොළට ඔහේ හැදෙනවා මිසක මේ අල කන අය අඩුයි.

රාජඅලවල ප්‍රතිඔක්සිකාරක බහුලයි. ඒ වගේම ෆ්ලෙවනොයිඩ් (Flavonoids සහ ෆීනොලික් (Phenolic) අම්ල සුලබයි. අපේ සම පැහැපත් කරන්න ඔය කියාපු සංඝටක දෙකටම පුළුවන්. ඒ වගේම ඉක්මනින් කොලැජන් හැදෙන්නත් දෙපළ හේතු වෙනවා. ඉතින් රූපේ ගැන හිතනවා නම් අදින් පස්සේවත් රාජාල කන්න. ඒ වගේම මේ අලේ සෘජුවම සමේ ගාන්නත් පුළුවන්.



**කෙබරයක් ඇදබාලා දුව අම්මව එළවාගත්තා. එහෙම කරලා කුස්සියට ගිහින් බත් කන්න බලද්දි බත් මුට්ටිය ලේ වෙලා තිබ්බලු**



- රාජාලයක් තම්බලා අරගෙන කස්තුරි කහ, කඩල පිටි, කෝමාරිකා මිශ්‍ර කරලා මූණේ ගාන්න. විනාඩි 20ක් තියලා සෝදලා අරින්න.
- අමු රාජාලයක් අරගෙන ඒකට මී කිරි, දෙහි යුෂ, මුල්තානි මිට්ටි එකතු කරලා බ්ලෙන්ඩ් කරලා ෆේස් පැක් එකක් හදාගන්න. මේ ආලේපනය සමේ ගාලා විනාඩි 20කින් හෝදලා දාන්න.

'සසඳ සසඳ දියපල්ලේ තිබෙයි අල
සසඳ සසඳ දිය මතුපිට තිබෙයි කොළ
වැස්සට පිනි බබා මෝරන කැකුළු මල
මස්තකයින්ට මුතු කුඩයකි නෙළුම් මල'

පුරාණ ජනකවි ආශ්‍රයෙන් නිර්මාණය වෙච්චි රෝහණ බැද්දගේ මහත්තයා ගායනා කරන ගීතයක කොටසක්. ඔය උපුටාගැනීමේ මුල් පේළියේ කියැවෙන්නේ නෙළුම් අල ගැන. ගොඩක් අය නොදන්නවා වුණාට නෙළුම් අල කියන්නේ ඉස්සර චීන ගෑනු සම ලස්සන කරන්න පාවිච්චි කරපු අමුද්‍රව්‍යයක්. නෙළුම් අලවලත් අර අපි කලින් කියාපු ෆ්ලෙවනොයිඩ් වගේම ෆීනොලික් අම්ලයත් තියෙනවා. ඊට අමතරව සම ලස්සන කරන්න කරන විටමින් C, B6 වගේ පෝෂණ සංඝටකත් බරසාරෙට. බර අඩු කරගන්න දත කන කෙනෙක්ට කන්න පුළුවන් හොඳම කෑමක් තමයි නෙළුම් අල.

- නෙළුම් අලයක් අරගෙන පෙති ගහලා අව්වේ වේලගෙන නෙළුම් පිටි හදාගන්න. පස්සේ මේකට වතුර ඩිංගිත්තක් නැත්නම් රෝස වතුර ටිකක් එක්කාසු කරලා සමේ ගාන්න. විනාඩි 20ක් තියලා සෝදලා අරින්න.
- නෙළුම් පිටිවලට මී කිරි, කඩල පිටි, බිත්තර සාරු එකතු කරලා මූණේ, අතපයේ ගාලා විනාඩි 20කින් සෝදන්න.

ඊළඟ අලේ බුත්සරණ අලේ. ගොඩක් ගෙවල්වල අලංකාරයට බුත්සරණ (කැනාස්) වවනවා. හැබැයි මෙච්චරගේ කෑමට ගන්න පුළුවන් ඖෂධීය ගුණැති ගජ අලයක් තියෙනවා කියලා ගොඩක් බවලතියෝ දන්නෙත් නැහැ.

බුත්සරණ අලේ විටමින් C, B, D වගේ පෝෂක ඕසෙට. හමට ගුණ දෙන ප්‍රතිඔක්සිකාරක එහෙමත් තියෙන නිසා පිටරට උදවිය මේ අලෙන් බියුටි ප්‍රඩක්ට්ස් එහෙමත් හදනවා.

- පුළුවන් නම් බුත්සරණ අල, කැඳ විදියට ආහාරයට ගන්න. තව එතකොට බුත්සරණ අලයක් අරගෙන එක හොඳට වේලලා පිටි කරලා ඒකට වතුර ටිකක් දාලා සමේ ආලේප කරන්න.
- බුත්සරණ යුෂ අරගෙන ඒකට වෙනිවැල්ගැට කුඩු, කස්තුරි කහ එක්කාසු කරලා සමේ ගාන්න. පිග්මන්ටේෂන් තියෙන කෙනෙක් නම් දිනපතාම ඒ මත බුත්සරණ යුෂ ආලේප කරලා බලන්න.

මේ කියාපු අලවලට අමතරව කැරට් අල, බීට් අල එහෙමත් හමට හොඳයි. මේ වර්ග දෙක හමට හොඳයි කියන එක නොදන්න උදවිය අඩු නිසා අපි අමුතුවෙන් ඒ ගැන කියන්න යන්නේ නැහැ.

ආටිචෝක් අල, හුලංකීරිය, කිරි අල, ඉන්නල, වැල් අල, උඩල, ගහල, ඇඟිනි අල, ගොනාල, කහට අල, සුදු අල, කටු අල, රටල ඇතුළු ඕනම දේශීය අලයක අපි අර ඉහතින් කියාපු සමට හිතකර පෝෂක සංඝටක අඩංගුයි. හැබැයි කැසීම්, පලුදැවීම් වගේ ආසාත්මිකතා ඇතිවෙන්න පුළුවන් නිසා මේ වර්ග හමට ආලේප කරන එක ගුණ මදි. ඒ නිසා පුළුවන් තරම් මේ අල වර්ග ආහාරයට ගන්න. ඉක්මනින්ම ලස්සන, පැහැපත් හමක් ලබාගන්න එතකොට පුළුවන්.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

කෙටි කතාව

# කවි සිංදුවල කියැවෙනවා තරම් අනියම් ප්‍රේමය සුන්දර නෑ

එයාගෙන් කිසිම ආරංචියක් නැහැ. දැන් හරියටම දවස් හතරක් වෙනවා. වෙනදට නම් එයා එහෙම නැහැ. කොහොමහරි මට මැසේජ් එකක් දානවා. කතා කරන්න බැරි වුණත් කෙටි පණිවිඩයක් වරදින්නේ නැහැ. ඒත් දැන් දවස් හතරක්. එයාගෙන් කිසිම හා හුවක් නැහැ. මගේ හිතට බයයි. එයා මාව මඟ අරිනවා ඇතිද? ඒත් මම කාගෙන් කියලා අහන්නද? එයා ගැන මම කොහොම හොයලා බලන්නද? මට කිසිම දෙයක් හිතාගන්න බැහැ.

යාළුවෙක්ටවත් මගේ දුක කියන්න මට බැහැ. මොකද අපේ සම්බන්ධය මුළු ලෝකයටම රහසක්. ලස්සන පවුලක් තියෙන එයා ලෝකෙට පේන්න හොඳ තාත්තා කෙනෙක්. හොඳ සැමියෙක්. ඒ වගේ කෙනෙක් එක්ක අනියම් සම්බන්ධතාවක් පටන් අරගෙන තියෙනවා කියලා මම කාටහරි කිව්වොත් ඒ මිනිස්සු මට ගල් ගහාවි. ඒ නිසා මට ඒ ගැන කාටවත් කියන්නවත්, එයා ගැන අහන්නවත් බැහැ. අනිත් එක එයත් ඒකට කැමති නැහැ.

එයා මට මුල ඉඳන්ම කියලයි තියෙන්නෙ එයා කතා කරනකම් මට කතා කරන්න එපා කියලා. වැරදිලාවත් මිස් කෝල් එකක්වත් එයාට දෙන්න එපා කියලා සම්බන්ධය පටන්ගද්දිම වගේ එයා මට කිව්වා. මම එයාගේ ඔය කතාවලට තරහ ගත්තෙ නැහැ. මොකද මම දන්නවා එයාගේ පවුල් ජීවිතේත් එයාට වටිනවා කියලා. මට එයාගේ පවුල් ජීවිතේ මැද්දට පනින්න කිසිම බලාපොරොත්තුවක් තිබුණේ නැහැ.

මෙච්චර කොල්ලො ඉන්න මේ රටේ අනුන්ගේ සැමියෙක් එක්ක සම්බන්ධතාවයක් ඇති කරගත්තේ ඇයි කියලා මගෙන් ඔබ දැන් අහාවි. ඒකට හේතුව මමවත් දන්නෙ නැහැ. මාව ඕනෙමයි කියලා කිව්වේ එයා. මං ගණන් නොගෙන ඉන්න ඉන්න පස්සෙන් ආවෙත් එයා. අන්තිමටම මගේ හිත එයා ළඟම නැවතුණා. වරදක් කියලා දැන දැනම මම එතන නැවතුණා.

එයාගේ office එකට කෝල් කරලා එයා කෝ කියලා අහන්න මට කීප වාරයක්ම හිතුණා. ඒත් මම දන්නවා එයා ඒකට කැමති නැහැ කියලා. ඒක ආරංචි වුණාම මට බැන වදීවි. එයා හොඳ නම ගැන ඕනෙවට වඩා හිතන මනුස්සයෙක්.

මේ දවස් හතර ඇතුළත මම එයාගෙ ෆේස්බුක් එකවුන්ට් එක තිස්පාරක්වත් පරීක්ෂා කරන්න ඇති. මොනවම හරි දෙයක් ශෙයා කරලා තිබුණාද කියලා බලාගන්නයි මට ඕන වුණේ. ඒත් එයා සාමාන්‍යයෙන් facebook එකේ පෝස්ට් share කරන කෙනෙකුත් නෙවෙයි. බොහොම කලාතුරකින් තමයි එයා ෆේස්බුක් එකේ පෝස්ට් share කරන්නේ. වට්ස්ඇප්, වයිබර් කිසිම දෙයක එයා ඔන්ලයින් නැහැ. දවස් හතරක් එයා ඔන්ලයින් ආවේ නැහැ කියලා පෙන්වනවා. එයාට මොකක්ද හදිසියේම සිද්ධ වුණේ, මට හිතාගන්න බැහැ.

ඒ අවාසනාවන්ත ආරංචිය මම දැනගත්තේ හරියටම පස්වැනි දවසේ. පස්වැනිදා දවසෙත් උදේ පාන්දරම මම නැගිට්ට ගමන්ම කළේ ෆේස්බුක් එකට ගිහින් එයාගේ profile එක පරීක්ෂා කරපු එක.



'නිවන් සුව ලැබේවා!' එයාගෙ මිතුරන් එයාට එහෙම දාලා තිබුණා.

මට කිසිම දෙයක් හිතාගන්න බැරිවුණා. මේ මගේ පළවැනි ආදරේ. මම මැරෙන තරම් ආදරේ කළේ එයාට. වරදක් කියල දැන දැනත් මම ආදරේ කළේ එයාට විතරමයි. එයා කොහොමද ඒ විදියට මාව දාලා ගියේ? දැන් මම මොකද කරන්නේ? කොහොමද මම මේක දරාගන්නේ? එයාට මොකක්ද වුණේ? මට පිස්සු හැදෙන්න ඔන්න මෙන්න වගේ දැනුණා. කාටවත් කියන්න බැරි නිසා මම බොස්ට කෝල් කරලා නිවාඩුවක් අරගෙන පළවැනි වතාවට එයාගේ ගෙදර හොයාගෙන ගියා.

"මම එයාගේ client කෙනෙක්. වතාවක් දෙවතාවක් මම එයාට කියලා වැඩ වගයක් කරගෙන තියෙනවා."

කටට ආපු බොරුවක් මම මළගෙදර හිටපු මිනිස්සුන්ට කිව්වා.

"හාට් ඇටැක් එකක් හැදිලා දවස් හතරක් හොස්පිට්ල් එකේ නවත්තලා හිටියලු. පස්වැනි දවසේ මේ විදියට යන්න ගිහින්. පව් රත්තරන් මනුස්සයා." එයාගෙ ඥාතීන් මාත් එක්ක කිව්වා.

මම ආදරේ කරපු මනුස්සයා මරණ මංචකයේ ජීවිතය එක්ක සටන් කරමින් දවස් හතරක් සටන් කරලා. අඩුමතරමේ මම ඒ ගැන දැනගෙනවත් හිටියේ නැහැ. අනියම් ආදරේ ලස්සනයි සුන්දරයි කියලා ලියැවුණු කවි බල බල හිත රවටගෙන හිටියට ඒක මොනතරම් අසුන්දරද? එයාගේ පණ ටික වාතලයට මුසු වෙන්න මොහොතකට කලින්වත් මට එයාව බලන්න බැරි වුණා. අඩුමතරමේ එයා ඒ තරම් අමාරුවෙන් ඉන්නා බවවත් මම දැනගෙන හිටියේ නැහැ.

එයාගේ බිරිඳයි දරුවොයි එයාව වට කරගෙන අඬනවා. මට පපුව පැලෙන්න තරම් දුකයි. ඒත් මම කොහොමද අඬන්නේ? මේ මිනිස්සු ඉස්සරහා මම කොහොමද කඳුළු පෙන්නන්නේ? ඒගොල්ලො බලාවි ඇයි මම අඬන්නේ කියලා. අනේ මට එක පාරක් ඒ සීතල වුණු මුහුණ අතගාන්න තියෙනවා නම්. අනේ මට එකපාරක් ඒ පණ නැති අත අල්ලලා බලන්න තියෙනවා නම්... ඒත් මම කොහොමද මේ මිනිස්සු ඉස්සරහා එහෙම කරන්නේ? පපුව පැලෙන්න තරම් හිතේ දුකක් මම දරාගෙන හිටියා.

අනේ මම එයාගේ බිරිඳ වුණානම්, මට එයාගේ නිසල සිරුර බදාගෙන අඬන්න තිබුණා. කෑ ගගහා අඬන්න තිබුණා. හිතේ තියෙන වේදනාව පහවෙනකන්ම අඬන්න තිබුණා. වේදනාව හිර කරගෙන දුර ඉඳන් එයා දිහා බලාගෙන හිටපු මම යන්න නැගිට්ටා. මගේ පුංචි මෝටර්රථයට නැගුනු මම ඔහුගේ නිවස ගාවින් පිටත් වුණා. මගට ඇවිත් වාහනය නවත්තපු මම කෑ ගහ ගහ හඬා වැටුණා.

අනේ ප්‍රසිද්ධියේ අඬන්නවත් අයිතියක් මට නැහැ.

කියූ නොකියූ කතා මොනතරම්ද? කළේ වරදක් වුණත් එයාගේ බිරිඳ තරමටම මමත් එයාට ආදරේ කරන්න ඇති. ඒත් මට මගේ දුක හිත ඇතුළෙම මිහිදන් කරන්න සිද්ධ වුණා. අපි හැමෝගෙම හොඳ නම, ගෞරවය වෙනුවෙන්.

■ සමාධි ඩයස්

**මේ වෙනවිට ගුරුවරියක් වන සඳුනි ජුලාන්දනී පාසල් ශිෂ්‍යාවක් ලෙසින් සිටියදී මුහුණ පෑ අමිහිරි අත්දැකීමක් ඇසුරින් මෙම ලිපිය සැකසේ.**

# ලව් ලෙටර් එකක් කියලා හිතලා මං ආසාවෙන් ලියපු පොත ඉස්සුවා




ජේසන්ට දවසක් අහම්බෙන් වගේ ඔහු ඉස්කෝලේ යන කාලේ හතේ පන්තිය බාරව හිටපු ගුරුවරයා මුණගැහුනා. ඉතින් ජේසන් දුවගෙන ගිහින් ඔහුට දණගහලා වැන්දා. වැඳලා සර්ට මාව මතකද කියලා ඇහුවා. හැබැයි වයසක ගුරුතුමාට ජේසන් ගැන මතකයක් තිබුණේ නෑ. ඊටපස්සේ ජේසන් කිව්වා "සර් දන්නවද සර් හින්දා මමත් දැන් ගුරුවරයෙක්. එතකොට ගුරුතුමා ඇහුවා "කොහොමද පුතේ එහෙම වුණේ?" කියලා. ඒ වෙලාවේ ජේසන් මෙන්න මෙහෙම කතාවක් කිව්වා.

"සර්, දවසක් මගේ යාළුවෙක් ලස්සන ඔරලෝසුවක් බැඳගෙන ඉස්කෝලෙට ආවා. ඒක දැකපු වෙලාවේ ඉඳලා මට ඒ ගැන ලොකු ආසාවක් ඇති වුණා. පස්සේ ඒක එයාගේ බෑග් එකේ දාල තිබුණු වෙලාවක කාටත් නොදැනෙන්න මං ඒක හොරකම් කළා. ටික වෙලාවකින් එයා පන්තියට ආවා. ඇවිත් සර්ට කිව්වා එයාගේ ඔරලෝසුව කවුරු හරි හොරකම් කරලා කියලා. ඒ වෙලාවේ සර් පන්තියේ දොර වහලා, අපි හැමෝටම පෝලිමට ඉන්න කියලා සාක්කු බැලුවා. ඒ වෙලාවේ සර් මගේ සාක්කුවේ තිබුණු ඔරලෝසුව හොයාගත්තා. ඒත් සර් ඒක තිබුණේ මගේ සාක්කුවේ කියලා කිසිම කෙනෙක්ට කිව්වේ නෑ. අඩුතරමේ මට දඬුවම් කළෙත් නෑ. නිකන් හරි සර් එදා එහෙම කළා නම් මං මුළු පන්තිය ඉස්සරහම හොරෙක් වෙනවා. ඒ විතරක් නෙවෙයි මගේ යාළුවෝ මාව ප්‍රතික්ෂේප කරන්නත් තිබුණා. එදා තමයි මට හිතුණේ සර් වගේ වෙනස් ගුරුවරයෙක් වෙන්න."

වයසක ගුරුතුමාට සිදුවීම මතක් වුණේ ඒ වෙලාවේ. පස්සේ ජේසන් ඔහුගෙන් ඇහුවා "ඇයි එදා මට කිසිම දඬුවමක් නොකළේ?" කියලා. ගුරුතුමා හිනාවෙලා කිව්වා "මගේ පන්තියේ ළමයෙක් හොරෙක් කියලා දකිනවට අකමැති නිසා මමත් ඒ වෙලාවේ ඇස් වහගෙනයි හිටියේ. ඒ නිසා මේ වෙනකල්ම ඒ හොරකම කළේ පුතා බව මම දැනගෙන හිටියේ නෑ" කියලා. ජේසන්ගේ ඇස්වලට කඳුළු ආවා. ඒ වෙන දෙයක් නිසා නෙවෙයි. ගුරුවරයා ගැන ඇතිවුණු අප්‍රමාණ ගෞරවය නිසා.

ජේසන්ගේ කතාව මට මතක් වුණේ මුහුණුපොතේ දකින්න ලැබුණු එක්තරා පෝස්ට් එකක් නිසා. ඒ පෝස්ට් එකේ මෙන්න මෙහෙම ලියලා තිබුණා.

'10 වසරෙදි මං ආසාවෙන් පොතක් ලිව්වා. ඒත් ඒක කොල්ලෙක්ට ලියපු ලියුමක් කියලා හිතලා ගුරුවරු අතට පත්වුණා. මං අඬ අඬා ඔෆිස් එකට ගිහිල්ලා ඉල්ලුවත් ඒක මට ලැබුණේ නෑ. අදටත් මං කතා ලියනවා. හැබැයි ඒ ඔක්කෝම ෆෝන් එකේ නෝට් පෑඩ් එකේ විතරයි. තාමත් මට බයයි මං එහෙම ලියන කතා කවුරු හරි අරගනියි කියලා. මං හිතන්නේ 10 වසරෙදි වුණු මානසික පීඩනය තාම තියෙනවද වෙන්න ඇති. ඒ විදියට දරුවන්ගේ හීන නැතිකරලා දාන ගුරුවරු නම් කාටවත්ම හමුවෙන්න එපා. ඒ නිසාම මමත් ගුරුවරියක් වුණා. හැබැයි ඒ දරුවන්ගේ හීන හැබෑකරන්න.'



## ඒ ගුරුවරු ගැන මගේ හිතේ කිසි තරහක් නෑ



ටිකක් හොයලා බලද්දී තමයි මේ සිදුවීමට මුහුණ දීපු තරුණිය මට මුණගැහුනේ. කිව්වත් වගේ ඇය දැන් ගුරුවරියක්. මේ ගුරුතුමීගේ නම තමයි සඳුනි ජුලාන්දනී. ඇගේ පදිංචිය ගම්පහ, හේනෙගම ප්‍රදේශයේ.

**"මම පුංචි කාලේ ඉඳලම ලියන්න ආසයි. මට යාන්තමට මතකයි මොන්ටිසෝරි ගිය අන්තිම දවසේ මං ටීචර්ට ලියුමක් ලියලා දුන්නා. ලොකු ලියුමක් නෙවෙයි ඒක මගේ වයසේ හැටියට වාක්‍ය තුන හතරක පොඩි ලියුමක්. හැබැයි මට ලියන්න පුළුවන් කියන ආත්මවිශ්වාසය ඇතිවුණේ ඉස්කෝලේ අටේ නවයේ පන්තිවල ඉන්නකොට. ඒ පන්තිවලදි මම ලියන රචනා අනෙක් අය ලියන ඒවාට වඩා වෙනස් කියලා ටීචර්ලා කියනවා මට මතකයි."**

ඉතින් තමන්ගේ ලියවිලි ගැන ලැබුණු ඔය විදියේ වර්ණනා හින්දම කෙල්ලට හිතුණාලු ඒ හැකියාවෙන් ප්‍රයෝජනයක් ගන්න. එහෙම හිතලයි සඳුනි ඇගේ හොඳම යාළුවෝ දෙන්නා වෙච්චි අමායයි, චමෝදියි එක්කාසු කරගෙන ලස්සන නවකතාවක් ලියන්න පටන් අරගෙන තියෙන්නේ.

"ඒ නවකතාවට නම දාලා තිබුණේ 'ගින්නෙන් පිපුනු මල්' කියලා. ඒක යාළුවෝ තුන්දෙනෙක් ගැන කතාවක්. එයාලගේ ගෙවල් තියෙන්නේ මුහුද අයිනේ. දවසක් සුනාමියක් ඇවිදින් එයාලගේ හැමදේම අරගෙන යනවා. අම්මා තාත්තගේ ඉඳන් හැමදේම. ඒත් මොකක්දෝ වාසනාවකට යාළුවෝ තුන්දෙනා ඉතුරුවෙනවා. අපේ පොතේ තිබුණේ කාත් කවුරුත් නැතුව ඒ තුන්දෙනා ජීවිතේ දිනන හැටි."

ඉතින් ඔය කාලේ සඳුනිගේ ඉස්කෝලේ ශිෂ්‍ය නායකයෝ උදේට උදේට ඇවිත් බෑග් චෙක් කරනවලු. ඒ වෙන දෙයක් නිසා නෙවෙයි, වයසේ වැරැද්දට එහා මෙහා වෙන ආදර හසුන් නැත්නම් ලව් ලෙටර්ස් එහෙම තියෙනවද බලන්න.

**"මං ඔය කියන පොත ලියලා තිබුණේ කොළවල. ඉතින් ඒක ලියුමක් කියලා හිතලා ශිෂ්‍ය නායකයෝ අරගත්තා. ඒක ලියුමක් නෙවෙයි කිව්වට එයාලා ඇහුවේ නෑ. මට ඉතින් හරි දුකයි. මං අඬාගෙන ගිහින් ඔෆිස් එකේ මැඩම්ගෙන් ඒක ඉල්ලුවා. කීපසැරයක් ඉල්ලුවත් දුන්නේ නෑ. පස්සේ මටම ඇතිවුණා. පොත ලියන එකත් නැවතුණා."**

සමහරවිට ආරම්භයේදි කියපු ජේසන්ගේ ගුරුවරයා වගේ ගුරුවරයෙක් සඳුනිගේ ඉස්කෝලෙත් හිටියා නම් මේ කතාව මීට වඩා හොඳ විදියට වෙනස් වෙන්න තිබුණා. එහෙම වුණා නම් සඳුනි අද ලේඛිකාවක් වෙන්නත් ඉඩ තිබුණා.

එදා වයස අවුරුදු 15ක් වුණු සඳුනිට දැන් අවුරුදු 24ක්. දැන් ඇගේ එකම ආසාව ඒ පොත ආයෙමත් පාරක් ලියන එකලු. වතාවක් ලියපු දෙයක් ආයෙත් ඒ හැඩේටම ලියන්න අමාරු වුණාත් සඳුනිට දැන් ඕන 'ගින්නෙන් පිපුනු මල්' ලංකාවේ හතරකොණේම පිපෙනවා දකින්නලු.

**"මං දැන් ප්‍රාථමික ගුරුවරියක්. දැන් මගේ එකම ආසාව යාළුවෝ දෙන්නත් එක්ක එකතුවෙලා අවුරුදු නවයකට පස්සේ 'ගින්නෙන් පිපුනු මල්' ආයෙමත් ලියලා පොතක් විදියට මුද්‍රණය කරන එක. මං ආසයි ඒක අපේ ලංකාවේ හැම දරුවෙක් අතටම යන පොතක් කරන්න."**

සඳුනි එහෙම කිව්වේ ලොකු ආත්මවිශ්වාසයකින්. ඒ වගේම අපේ කතාබහට තිත තියන්න කලින් තවත් කොමාවක් දාලා ඇය මෙහෙම කිව්වා.


"එදා මම ආසාවෙන් ලියපු පොත පෙම් හසුනක් නෙවෙයි කියලා කියද්දීත් ඒක මට නොදීපු ගුරුවරු ගැන මගේ හිතේ කිසි තරහක් නෑ. හැබැයි මම යෝජනා කරනවා ගුරුවරු වුණාම දරුවන්ට ඊට වඩා ඇහුම්කන් දෙන්න පුරුදු වෙන්න ඕන. අනිත් එක තමයි නව යොවුන් වියට එළඹෙන දරුවෝ පෙම් හසුන් ලියන එක සාමාන්‍ය දෙයක්. ඒවා උත්කර්ෂයට නගන්න අවශ්‍ය නෑ තමයි. හැබැයි ඒවා බරපතළ අපරාධ ගණයට දාලා සියලු දෙනා ඉදිරියේ දරුවන්ව අපහසුතාවයට පත්කරන්නත් අවශ්‍ය නෑ. ඉතින් මට ඕන වුණේ දරුවන්ගේ දක්ෂතා උපන් ගෙයිම මරලා දාන්නේ නැති ගුරුවරියක් වෙන්න. ඒ වෙනුවෙන් මං ඉදිරියටත් කැප වෙනවා."

■ රුවන් එස්.සෙනවිරත්න

# ඒ වසරයි

බියංකා නානායක්කාර ලියයි

134 කොටස



තේනුක තෙන්නකෝන් බණ්ඩාර සොහොයුරා හා කතා කරන්නට පෙර තව වරක් සිතුවේය. ඔහු මේ තරම් ලබැඳි ලෙස කතා කරන්නේ කපටි වැඩකටද කියාත් යටි හිත කීවේය. ආසන්න කාලයේ හිතෛෂිවන්තකම් පෑවත් මේනක කියන්නේ ළඟින් ඉඳගෙන හතුරුකම් කළ සහෝදරයෙක් කියා ඔහුට අමතක නැත. ඒ නිසා තේනුක තෙන්නකෝන් ඔහු හා කතා කළේ පරෙස්සමටය.

**"එච්චරටම හදිස්සි එච්චරටම වැදගත් දෙයක්ද..?"**

අංජනා එතැන නොසිටි නිසා ඔහුට හිතට එන දෙයක් කීමේ ඇසීමේ නිදහස තිබුණි.

**"ඔව්. මේක මටත් වඩා වැදගත් වෙන්නේ ඔයාට කියලා මට දැනෙනවා. ඒකයි කියන්න හිතුවේ..."**

මේනකගේ කතාව ඔහුට කුතුහලයක් ගෙනාවේය. සඳැල්ලෙන් එපිට අඹ ගහ මුදුණට යන්තම් අව්රැල්ලක් වැටී ඇත. දවස ගෙවුණේ හරිම කලබලකාරී විදියට කියා ඒ කතාබහ අස්සේ ඔහුට මතක් වුණේය.

**"ඉතින් ටෙලිෆෝන් එකෙන් කියමු..."**

මේනක කියන්නට යන කතාවේ බරක්පතළක් නොදන්නා නිසා ඔහු සැහැල්ලුවෙන් කීවේය.

**"බෑ මේක ඔයා හිතන විදියේ කතාවක් නෙවේ. සමහර විට මං මේක නොකිව්වොත් මමත් ඔයාට වැරැද්දක් කළා වෙනවා. මේක ඔයාගේ අනාගතේ සම්බන්ධ ප්‍රශ්නයක්..."**

**ආදරේ නම් තේ එකට එකතු කරන්න පුළුවන්. මං දන්නෙ නෑ හිනාව එකතුකරන්න පුළුවන්ද කියලා**

මේනක එසේ කී කල්හී නම් තේනුක තෙන්නකෝන්ගේ හිත මදක් නොසන්සුන් වුණේය. ඒත් ඔහුව විශ්වාස කර මේ ගෙදරට ගෙන්වන්නට බැරිය. සහෝදරයා කොයිතරම් හොඳ හදවතක් පෙන්නුවත් ඒ හදවතේ සිටින සතුරා අවදිවෙතැයි තේනුකගේ හිත සැක කළේය. ඒ නිසා ඔහුව තව හවස්වී ෆෝන් සාප්පුවේදී හමුවෙන්නට කතා කරගත්තේය. ඔහු ඇමතුම අවසන් කරන විට තේ කෝප්ප දෙකත් අතැතිව අංජනා ඔහු ළඟය. තේනුකගේ කතාවේ අවසානය ඇසුණත් ඇය ඒ ගැන ප්‍රශ්න කරන්නට ගියේ නැත. ඊට වඩා ප්‍රශ්නයක් කතා කරන්නට ඇති බව ඇයට කුස්සියේදී තේ හදද්දී මතක් වුණේය. ඒ අම්මලාගේ කොළඹ පදිංචියට ඒම ගැනයි.

අංජනා ඔහුගේ තේ කෝප්පය දී පසෙකින් වූ පුටුවෙන් ඉඳගත්තාය.

**"මොකද නෝනා කතා නැත්තේ..? තේ එකට කතාවත් දලා හැළිගෑවද..?"**

තේනුක ඇගේ පසට බරවී සිනාසෙමින් කියද්දී ඇයටත් සිනා නැගුණාය.

**"ආදරේ නම් තේ එකට එකතු කරන්න පුළුවන්. මං දන්නෙ නෑ හිනාව එකතුකරන්න පුළුවන්ද කියලා..."**

අංජනා කීවේ ඇත්තටමය.

**"මොනවද කල්පනා කළේ ඇත්තටම?"**

**"අම්මා ගැන. නංගිලා මල්ලි ගැන. මං මෙහෙට වෙලා ඉන්න එක හරි වැරදියි කියලා මට හිතෙනවා..."**

අංජනා කීවේ ඈත බලාගෙනය.

**"ඉතින් එයාලට මෙහෙ එන්න පුළුවන් නේ. දැන් බඩුත් ගෙනත්නෙ තියෙන්නේ... එතකොට ඔක්කොටම සතුටින් ඉන්න පුළුවන්..."**

ඇගේ කතාවට කලබල නොවී තේනුක කීවේය.

**"ඒ අපි හිතන විදිය. අම්මලාගේ පැත්තෙන් හිතුවොත් අම්මා හරි."**

**"ඇයි නෝනා... අම්මා මොකද කිව්වේ?"**

# මෙයාව අඳුරනවද බලන්න...

එවර නම් තේනුකගේ හිත කළබල වුණේය. ඔහු හිස් කෝප්පය ටීපෝව මත තියා ඇගේ අතකින් ඇල්ලීය.

**"කොළඹ ජීවත්වෙන්න අම්මගෙ වැඩි කැමැත්තක් නෑ වගේ. එයා ඔය ගමන එක එක ඒවා කිය කිය පමා කරන්නේ ඒකයි..."**

**"හරි වැඩේනෙ... මං එහෙම එකක් හිතුවෙම නෑ. ඔයාට අම්මා කිව්වද මෙහෙ එන්න බෑ කියලා?"**

**"එයා කියන්නේ මාතලේ ඉඩමෙ පුංචියට හරි ගේ හදගමු කියලා... එතකල් ඔය ඉන්න විදියට රෙන්ට් එකට ඉන්න පුළුවන්ලු. නංගියි මල්ලියි එහෙන් ගෙනත් මෙහෙ දන්නත් එයාට බයයි. මටත් තේරෙන්නෙ නෑ ඇත්තටම. දැන් නම් මට හිතෙනවා පොඩි රස්සාවක් හරි කරන්න. පැන්ෂන් එකෙන් විතරක් ඔය දේවල් කරන්න බෑනෙ..."**

තේනුක කල්පනා කළේය. ඒ අම්මාගේ කතාව වැරදියි කියාවත්, බොරුයි කියාවත් තර්ක කරන්නට ඔහුට සිතුණේ නැත. හේතුව එහි ඇත්තක් ඇති නිසාය. සෙනෙහෙලතා මැණිකේ වුව අදටත් කැමති ගමේ ජීවිතයට කියා තේනුකට මතක් වුණේය. ඒ නිසා වත්සලා ඇල්ලේපොලගේ කතාවට අදහස් පලකරනවාට වඩා ඇගේ අදහස් පලදරන දෙයක් කරන එක හොඳයි කියා ඔහුට සිතුණි.

**"ඉතින් ගේ හදන්න සල්ලි..?"**

හදිසියේම මතක් වූ පැනය ඔහු අංජනාගෙන් ඇසුවත් ඒ තත්පරයේ ඊට විසඳුමකුත් ඔහු සිතට ආවේය.

**"අප්පච්චි මාතලේ අරන් දලා තියෙන ඉඩම් කෑල්ල පර්චස් විසිපහක්. අම්මා කියන්නේ ඒකෙන් දහයක් විතර විකුණමු කියලා. ඒ හරියේ පර්ච් එක ලක්ෂෙට යනවලු. මාත් ඒකට කැමතියි. එතකොට කාටවත් බරක් නෑනේ. එහෙ පොඩිවට ගේ හදන්න ලක්ෂ දහයක්වත් යන එකක් නෑ."**

අංජනාගේ වචනවල වූයේ දැඩි බලාපොරොත්තුවකි. ඒ බව තේනුකටද හොඳින්ම දැනුණේය.

**"තමන්ගේ ඉඩමේ හදන ගේ යාන්තමට නෙවේ... හොඳට හදන්න කියන්න. ඉක්මනටම අම්මට අදම කතා කරලා කියන්න හෙටම වැඩේ පටන්ගන්න කියලා. ඉඩම විකිණෙනකල් මං සල්ලි ටිකක් දෙන්නම්. ඒකෙන් හදමු..."**

තේනුක තෙන්නකෝන් දෙස අංජනා බැලුවේ හද විනිවිද යන බැල්මකි.

**"ඔයා...!; මේ කරන තරම් ඇති... අපි හෙමිහිට ගෙදර හදමු..."**

අංජනා කීවේ ඇස්වලට කඳුළු උනද්දීය. ඔහුගේ බැඳීම දැඩි ලෙසම හදවතට දැනෙද්දී හැමදාමත් දෙනෙත් පෙඟුණේය.

**"නෑ නෑ. මාත් හිතන්නේ අම්මගෙ තීරණේ හුඟක් හොඳ තීරණයක්. මේ කොළඹට වඩා ගම දහෙන් සම්පතයි. ඔයා බය නැතුව අම්මට කතා කරලා කියන්න ගේ හදන්න වැඩේ පටන්ගන්න කියලා. මං ළඟ ලක්ෂ දහයක් පහළොවක් තියෙනවා. ඒකෙන් හදන්න ගන්නකෝ. ඒ අතරෙ ඉඩම විකුණමු. හැබැයි අම්මට තනියම ඕවා කරන්න පුළුවන් වෙයිද මන්ද. ගේ හදන්න කලින් කරන්න ගොඩක් වැඩ තියෙනවනේ..."**

අංජනාට කල්පනා වුයේද එයයි. ගෙයක් හදන්නට ප්ලෑනක් තවම ඇඳ නැත. ඒ ඇඳ එය ප්‍රාදේශීය සභාවෙන් සහතික කළ යුතුය. ඊටත් කලින් කැලේ වැවී ඇති ඉඩම එළිපෙහෙලි කළ යුතුය. මේවා කරන්නට අම්මාට තනිව බැරිය. හොඳම දේ ටික දවසකට ගමේ ගොස් ඒ වැඩවලට අම්මාට හයියක් වීම කියා ඇගේ හිත කීවාය.

**"ඒක තමයි... අම්මට ඕවා තනියම කරන්න අමාරුයි. අමාරුයි කියන්නේ කොහොමත් බෑ. එයාට එළියෙ වැඩ මොනවත් කරගන්න දන්නෙ නෑ. අප්පච්චිනෙ කළේ හැමදෙයක්ම..."**

අංජනා කීවේ හැඟුම්බරවය.

**"අපි දෙන්නම ඕවට ගියොත් මෙහෙ වැඩත් පාඩුයි. ඔයා ටික දවසකට එහෙනම් ගෙදර නැවතිලා ඒ වැඩ ටික කරන්න අම්මත් එක්ක."**

තේනුකට ඒ වැඩේ ගැන හිත ඇතුළෙන් සැබෑම උනන්දුවක් ඇතිවුණේ ඒ කටයුත්ත මින් පෙර මතක් නොවීමේ පසුතැවිල්ලකුත් එක්කය. ගම හුරු මිනිසුන් ගමෙන් ඈත් කරනවාට වඩා ගමේම රැඳවීම ඒ මිනිසුන්ට සැපයකි. ඊටද වත්සලා ඇල්ලේපොල සිතනවා සේ එය ඔවුන්ගේ ආරක්ෂාවටද හොඳය.

**"ඔයා අම්මා එක්ක ඒ ගැන කතා කරගන්න. මං පොඩ්ඩක් සාප්පුවට යන්නම්. අයියා එනවා කිව්වා. එයාවත් හම්බවෙලා, එතන ටිකක් ඉඳලා එන්නම්..."**

අංජනා හිස වැනුවාය. ඇගේ හිත ඇතුළේ උත්තරයක් නැතුව තිබූ ප්‍රශ්නයට උත්තරේද එයින් ලැබුණි.

තේනුක තෙන්නකෝන් සාප්පුව ළඟට යද්දී ඈත තියාම මේනකගේ ජීප්රිය එහි තිබෙනු දුටුවේය. චතුමිණීගේ සැලෝනය වසා තිබුණොත් ඔහුගේ වාහනය නැවතී තිබුණේ ඒ වාහන නැවතුමේය. තේනුක රියෙන් බැස මේනකගේ ජීප්රිය දෙස බලද්දී ඔහු වීදුරුව ඇර අත වනනු පෙනුණි. මේ හමුව තේනුකට සැබෑ කුතුහලයක් වුණේය. ඒ නිසාම එය දැනගැනීමේ ඉක්මන් උවමනාවක් ඔහුට විය. තේනුක තෙන්නකෝන් ජීප්රිය ළඟට යද්දී මේනක අනෙක් පස දොර ඇරියේය.

**"සාප්පුවට ගිහින් කතා කරමු."**

ඔහුගේ වාහනයට නොනැග තේනුක කීවේය.

**"මේක සාප්පුව ඇතුළෙ කතා කරන්න පුළුවන් දෙයක් නෙවේ... නගින්න."**

තේනුක ජීප්රියේ ඉදිරි අසුනට නැග ඉඳගත්තේ කල්පනාවෙනි. මේනක දුරකතනය අතට ගෙන එහි ගැලරියේ තිබූ අංජනාගේ පින්තූරය මතුකර තේනුක වෙතට පෑවේය.

**"මෙයාව අඳුරනවද බලන්න..."**

ලබන සතියට

# අපේ පුංචි දූලා පුතාලාට දැන් පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න




ලියාපදිංචි පෙරපාසල් සඳහා විශේෂ වට්ටම්

අත්පොත් තබන පෙරපාසල් නංගිලා මල්ලිලාට

අකුරු කරන්නට අලුතින්ම පාසලට පිය නැගූ පුංචි නංගිලා මල්ලිලාට

ශිෂ්‍යත්වය ඉලක්ක කර සැකසූ පාඩම් සහ ප්‍රශ්න පත්‍ර සමඟින්

ශිෂ්‍යත්ව අනුමාන ප්‍රශ්න පත්‍ර 6ක් සමග පත්තරයම ප්‍රශ්න පත්තරයක්...
කටුවැඩ පොතකුත් නොමිලේ

මාසික අධ්‍යාපනික පුවත්පත් 6ක්

අගෝස්තු කලාප දැන් වෙළෙඳපොළේ

සෑම සෙනසුරාදා දිනකම උදෑසන 8.00 ට FM DERANA KIDS YOUTUBE නාලිකාව ඔස්සේ පැවැත්වෙන සම්මන්ත්‍රණයේදී මෙම ඉලක්ක ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කෙරේ.

පාඩම් සඳහා මාර්ගෝපදේශ නිර්දේශිත පිංතූර පොත් දරුවන්ගේ නිපුණතා වර්ධනය පෙන්වයි

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348
දැන්වීම් සඳහා විමසන්න ශෙහාන් - 076 1393811

දිවයින පුරා පුවත්පත් නියෝජිතයන්ගෙන්, සරසවි පොත්හල් සහ අනෙකුත් පොත්හල්වලින් මිලදී ගතහැක.



## උගස් තැබූ රත්තරං

ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
රන් පවුම - 180,000/- කැරට් 22 සඳහා ඉහල මිලක්
076 101 88 53

SL PROMO



## උගස් රන් භාණ්ඩ

උගසට තබා සින්න වීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කල ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලකට මිලදී ගනු ලැබේ.
රන් පවුම 195,000
074 264 1234

SL PROMO



## සංවර්ධිත බැංකු ඇබෑර්තු

★ දිස්ත්‍රික්ක කිහිපයක අලුතින් විවෘත වූ වෘත්තීමය බැංකු සඳහා කාර්යමණ්ඩලය බඳවා ගැනේ.
★ අවම සුදුසුකම් O/L වේ. ★ වැටුප් සමග පුහුණුව. ★ රැකියාව තම ප්‍රදේශයටම.
දී 40,000/- 18/40 ගැ/පි (මෑන් පවර් නොවේ)

| | |
|---|---|
| 0716 434 278 | 0703 346 072 |
| 0702 725 731 | 0718 853 997 |
| 0742 916 140 | 0774 024 155 |





## ඔබ දෛවයට පිටුපායිද.. ? දෛවය ඔබට පිටුපායිද.. ?

● ජීවිතයේ අතීත සහ වර්තමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
● වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.

හස්ත රේඛා විශේෂඥ
### එස්. කෝරළේගේ
520, වාසනා මාවත, කෝට්ටාව, පන්නිපිටිය.

සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094



## ආදරය නිසා කඳුළු සැලූ මට පිහිටවූ එකම තැන

- පවුලේ ඇති වන සියලුම ගැටලු වලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පෙම්වතා/පෙම්වතිය ලඟා කර ගැනීමට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2023/2024 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- රැකියා ලබාගැනීමට
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා න වැත්වීමට
- රට රැකියා ප්‍රමාද වීම් වලට අදම අමතන්න

(උපන් වේලාව සමග අමතන්න)

ක්ෂණික ඇමතුම් -0777 444908

බිංගිරියේ ගුරු හාමුදුරුවෝ සමග සේන මහතා 037 22 48 828
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

හමුවීම
සෙනසුරාදා - ඉරිදා
උදේ 8.00 සවස - 3.00 දක්වා

ගමන් මාර්ගය නාරම්මල සිට කුලියාපිටිය පාර, වෑවගම හෙට්ටිපොළ කුලියාපිටිය බසයක නැග හොරොම්බා හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

භාරකාරතුමා "ගුරුදේව ශාන්ති සේවාව"
තැ.ස අංකය 60181, ගුරුගල්ගොඩ, මෝලවත්ත, හොරොම්බාව


තිළිණ කන්ඩම්බි බිරිඳ සමග


තිළිණ කන්ඩම්බි බිරිඳ සහ දරුවන් සමඟ

# දඹුල්ලේදී දෝණි අවුට් කරපු දවස මට අමතක වෙන්නේ නෑ

## තිළිණ කන්ඩම්බිගේ බිරිඳ ශහේනි මුදිතා පතිරණ

**2011, මෙරට ක්‍රිකට්ලෝලීන්ට කිසිදා අමතක නොවෙන අවුරුද්දකි. ඒ ඉන්දියාවට පමණක් දෙවැනි වෙමින් ශ්‍රී ලංකාව එක්දින ලෝක කුසලානයේ අනුශූරයන් බවට පත්වූයේ 2011 දී බැවිනි. අප මේ කියන්නට යන විස්සයි විස්ස තරඟය පැවතියේද ඒ අවුරුද්දේම ජුනි 25 වැනිදාය. තරඟය තිබුණේ ප්‍රබල එංගලන්ත පිලට එරෙහිවයි. ක්‍රිකට් විචාරකයින් කලින්ම අනාවැකි පළ කර තිබුණේ කෙවින් පීටර්සන්, ඉයන් මෝර්ගන්, රවී බොපාරා මෙන්ම ලූක් රයිට් වැනි ක්‍රීඩකයින් සිටි එංගලන්ත කණ්ඩායම ඔවුන්ගේ රටේදීම පරාජය කිරීම සෙල්ලමක් නොවෙන බවය. එවැනි පසුබිමක නායක ටී.එම්.ඩිල්ශාන් ආබාධයකට ලක්වීමෙන් ශ්‍රී ලංකා කණ්ඩායමේ බොහෝ බලාපොරොත්තු සුන්වෙමින් තිබිණි. දැන් ශ්‍රී ලංකා කණ්ඩායමට නායකයෙකු හිඟය. මහේල, සංගක්කාර, මාලිංග වැන්නවුන් ඒ වෙද්දීත් කණ්ඩායමේ සිටියද මොකක්දෝ හේතුවකට නායකත්වය බාරකෙරුනේ තිළිණ කන්ඩම්බිටය. ඒ වනවිට ඔහුට නායකත්වය දැරීම හුරුපුරුදු දෙයක් නොවුණි. නමුත් නුහුරු නුපුරුදු නායකත්වයද සමඟ ඔහු ප්‍රබල එංගලන්තයට දවල් තරු පෙන්වීමට කටයුතු කළේය. ඒ කඩුලු නවයක දැවැන්ත ජයක් ශ්‍රී ලංකාවට අත්කර දෙන්නට කණ්ඩායම මෙහෙයවමිනි. එහිදී තිළිණ පන්දු යවන්නන් මෙහෙයවූ ආකාරය තමන්ව පුදුමකළ බවයි විචාරකයින් පවා පසුව කියා තිබුණේ. මේ 2004 - 2011 කාලසීමාවේ ක්‍රිකට් පිටිය එකලු කළ එම ක්‍රීඩකයා ගැන ඔහුගේ ආදරණීය බිරිඳ ශහේනි මුදිතා පතිරණ කී කතාවයි.**


බිරිඳ ශහේනි සමග

**ශහේනිට තිළිණව මුණගැහුනු තැනින්ම අපි කතාව පටන්ගමු නේද?**

යාළුවෙක් මාර්ගයෙන් මට තිළිණව මුලින්ම මුණගැහුනේ 2000 අවුරුද්දේ වගේ. ඒ වෙනකොට එයා ජාතික කණ්ඩායමට තේරිලා හිටියේ නෑ. මං ඒ වෙනකොට ශ්‍රී ලංකන් එයාර් ලයින් එකේ ගුවන් සේවිකාවක් විදියට වැඩ කළා.

**එහෙම හමුවුණු ඔයාලා දෙන්නට ආදරවන්තයෝ වෙන්න කාලයක් ගියා කියන්නේ ඇත්තද?**

ඔව් ඒකට අවුරුදු හයක් විතර ගියා. 2006 අවුරුද්දේ අපි යාළුවුණේ. ඒත් ඒ වෙනකල් අපි යාළුවෝ වගේ හිටියා.

**හැබැයි ඒ වෙනකොට තිළිණ ජාතික කණ්ඩායමේ ක්‍රීඩකයෙක් නේද?**

ඔව් 2004 අවුරුද්දේ ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරන්න එයාට අවස්ථාව ලැබුණා.

**කෙනෙක්ට කියන්න පුළුවන් ක්‍රිකට් හින්දයි ඔයා එයාට කැමති වුණේ කියලා?**

(සිනාසෙමින්) ඇත්තටම නෑ. අවංකවම කිව්වොත් තිළිණට කැමති වුණේ මං කවද හරි දවසක විවාහවෙන කෙනාගේ තියෙන්න ඕනේ කියලා හිතාගෙන හිටපු ගතිගුණ හැම එකක්ම අඩුවක් නැතුව එයාට තිබුණු හින්දා.

**එතකොට ශහේනියි තිළිණයි එක වහලක් යටට ආවේ කොයි කාලෙද?**

අපි විවාහ වුණේ 2008 අවුරුද්දේ.

**ග්‍රවුන්ඩ් එකේදි තිළිණ ටිකක් ආඩම්බරකාරයෙක් වගේ පේනවා. ඇත්තටම එහෙමද?**

ඒ එයාගේ හැටි. එයා එහෙම ආඩම්බර කෙනෙක් නෙවෙයි. එයා ප්‍රසිද්ධ චරිතයක් කියලා කවදාවත් ඔලුවට ගත්තේ නෑ. තිළිණ කියන්නේ පුදුම නිහතමානී කෙනෙක්.

**පවුල් ජීවිතේ එහෙම කොහොමද?**

අපි සතුටින් ඉන්නවා. මේ අවුරුද්දට අපි විවාහවෙලා අවුරුදු 15ක්. අපිට දුවලා තුන්දෙනෙක් ඉන්නවා. අපි ඉතින් දුවලා එක්ක සතුටින් ඉන්නවා.

**ගෙදර ඉන්න වෙලාවට එහෙම තිළිණ කොයි වගේ කෙනෙක්ද?**

තිළිණ ඉන්න විදියට කෙනෙක්ට හිතෙන්න පුළුවන් එයා හරි සැර කෙනෙක් වෙන්න ඇති කියලා. ඒත් එහෙම නෑ. ගෙදර ඉන්න දවසට නම් දරුවෝ එක්කම ඉන්න තමයි කැමති. ඒත් මැච් එකක් එහෙම තියෙනවා නම් ඒක බලනවා.

**එයාට රසට උයන්න පුළුවන්ලු නේද?**

(සිනාසෙමින්) කවුද කිව්වේ? ඒ වචන ටික නම් අහන්නත් කැමතියි. මෙහෙමයි එයා ඉස්සර නම් උයන්න ට්‍රයි කළා. ඒත් දැන් නම් ඒකට එයාට වෙලාවක් නෑ.

**ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳක් වෙන එක ලේසියිද?**

ඒක ලේසි නෑ. මැච් එකකට යනකොට එයාව හැමදේකින්ම 100%ක් නිදහස් කරලා යවන්න ඕනේ. ඒක තමා ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳක් වුණාම තියෙන ලොකුම වගකීම. අන්න ඒක ක්‍රීඩකයාගේ සාර්ථකත්වයට ලොකුවටම බලපානවා.

**ක්‍රිකට් නිසා එයා සතුටින්ම හිටපු දවසක් ශහේනිට මතකයිද?**

2011 අවුරුද්දේ එයාට අහම්බෙන් වගේ එංගලන්තය එක්ක තිබුණු විස්සයි විස්ස තරඟයක නායකයා වෙන්න ලැබුණා. ඒ නායකයා විදියට හිටපු ටී.එම්.ඩිල්ශාන් ආබාධයකට ලක්වෙලා. එදා අපි දිනුවා. ඒ ගැන එයා පුදුම විදියට සතුටු වුණා.

**එතකොට එයාගේ ක්‍රිකට් නිසා ඔයා සතුටින්ම හිටපු දවස කවදද?**

මං සතුටුවුණේ සැරයක් එයාට ඉන්දියාව එක්ක තිබුණු තරඟයකදි බෝල් කරන්න ලැබුණා. එයා සාමාන්‍යයෙන් බෝල් කරන කෙනෙක් නෙවෙයිනේ. මැච් එක තිබුණේ දඹුල්ලේ. එදා එයා ඒ වෙනකොට ඉන්දීය කණ්ඩායමේ හිටපු ප්‍රබලම ක්‍රීඩකයෝ දෙන්නා උනු දිනේෂ් කාර්තික්, මහේන්ද්‍ර සිං දෝණි අවුට් කළා. කොහොමහරි එදා එයා ලකුණු 37කට කඩුලු 02ක් ගත්තා.

**ක්‍රීඩකයෙක් විදියට සමුගත්තත් තිළිණට ක්‍රිකට් අමතක කරන්න නම් බෑ වගේ නේද?**

එයා ඒ තරමට ක්‍රිකට්වලට ආසයි. ඒ හින්ද තමයි ක්‍රීඩකයෙක් විදියට ක්‍රිකට් පිටියෙන් සමුගත්තත් පුහුණුකරුවෙක් විදියට කටයුතු කරන්නේ. තුන්වරක්ම එල්.පී.එල්. එකේ ශූරතාවය දිනපු ජැෆ්නා කිංග්ස් කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු වුණෙත් තිළිණ. ඒ අතින් බැලුවම තිළිණ හොඳ පුහුණුකරුවෙක් කියලත් කියන්න පුළුවන්.

**තිළිණ ගෙදරදි හොඳ ගායකයෙක් කියන්නේ ඇත්තද?**

(සිනාසෙමින්) ඒක නම් ඇත්ත. සැරයක් එයා යාළුවෙකුට කියලා මයික් එකක් ගෙන්නගෙන කැරොකේ දාගෙන සිංදු කිව්වා. එකදිගට කාලයක්ම කිව්වා. ඒ කාලෙ හැමදාම රෑට සිංදු පහක් කියලා තමයි නිදාගන්නේ. මට තමයි ඉතින් ඒවා අහගෙන ඉන්න වෙන්නේ.

**එයා ක්‍රිකට් ක්‍රීඩකයෙක් නොවුණා නම් අද කොයි වගේ තැනක ඉඳියිද?**

ඒක නම් දෙවියෝ තමා දන්නේ. ඒත් එයා ඉස්කෝලේ කාලේ ටෙනිස් ක්‍රීඩා කරලා තිබුණා. හැබැයි ඒක අතෑරලා ක්‍රිකට් ගහන්න පටන්ගත්තට පස්සේ මුළු ජීවිතේම ක්‍රිකට් වුණා කියලයි එයා මට කියලා තියෙන්නේ.

> ඒ කාලේ හැමදාම රෑට සිංදු පහක් කියලා නිදාගන්නේ. මට තමයි ඒවා අහගෙන ඉන්න වෙන්නේ



**හිටපු ක්‍රිකට් ක්‍රීඩකයෝ ගොඩාක් පවුල් පිටින්ම ලංකාවෙන් ගිහින්. ඔය දෙන්නට එහෙම අදහසක් නැද්ද?**

මං ආසා වුණත් තිළිණ ලංකාව දාලා යන්න ආසා නෑ. එයා කැමති ලංකාවේ ඉන්න. ඒ නිසා එහෙම වෙන එකක් නෑ.

**ඔයා ක්‍රිකට් ප්‍රේක්ෂිකාවක්ද?**

පොඩි කාලේ ඉඳන් ක්‍රිකට් මැච් බැලුවා. ඒත් තිළිණ හින්ද තමයි මමත් හරියටම ක්‍රිකට් ප්‍රේක්ෂිකාවක් වුණේ.

**එහෙනම් අවසාන වශයෙන් ක්‍රිකට් ප්‍රේක්ෂිකාවක් විදියට තිළිණ කන්ඩම්බි කියන ක්‍රීඩකයා ගැන ශහේනිට මොකද හිතෙන්නේ?**

තිළිණ කන්ඩම්බි කියන්නේ ගොඩාක් දක්ෂ ක්‍රීඩකයෙක්. ඒ වගේම දැන් හොඳ පුහුණුකරුවෙක්.

■ රුවන් එස්. සෙනවිරත්න

MOBILE

# TRIPLE BUDDY

UNLIMITED DATA

SELFCARE APP එක හරහා හෝ
#170# අමතා ඇක්ටිවේට් කරගන්න.

ඇප් 3ටම

රු.444කට

(බදු ඇතුළත් වේ.)

දින 30ක් පුරාවට

TRC/M/PRO/20/07 කොන්දේසි සහිතයි.

www.sltmobitel.lk

SLTMOBITEL
එකම එක සබැඳියාව


කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.